# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්   www.budusarana.lk   email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2565 ක් වූ බිනර අමාවක පෝ දා, 2021 ඔක්තෝබර් 06 බදාදා   BUDUSARANA WEDNESDAY OCTOBER 06, 2021

56 කාණ්ඩය, 15 පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.   පිටු 20   මිල රු. 40.00



යාපහුව රාජමහා විහාරය

ඡායාරූපය - ගයාන් පුෂ්පික



උඩවේ සියම් මහා නිකායේ මහා ලේඛකාධිකාරී
කැප්පෙටිපොල පාලුගම ශ්‍රී සුභද්‍රාරාම මහා
විහාරාධිපති සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ශාස්ත්‍රපති
අධ්‍යාපනපති

**විල්ඔය පඤ්ඤාතිලක හිමි**



# නොහැකියාව ගැන නොකියවා කළ හැකි දෙය සොයා යන්න

**දිනක් මා හොඳින් හඳුනන තරුණයෙක් මට මුණගැසුණි. ඔහු උපාධිධරයෙකි.**

" උපාධියත් අවසන් නේද? පුතා දැන් මොනවද කරන්නේ "මම ඔහුගෙන් විමසුවෙමි.

"නිකම් ඉන්නවා ස්වාමීන් වහන්ස"

ඒ, ඔහු ගේ පිළිතුර ය. උපාධිය සඳහා රැකියාවක් ලැබෙන තුරු ඔහු කිසිවක් නොකොට හිඳින්නේ ය. යම් කටයුත්තක් කරන්නට යැයි කීව ද ඔහුට බොහෝ පිළිතුරු තිබුණි. විටෙක එය තමන් ගේ උගත්කමට, නොගැළපෙන බව කියයි. යමක් කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය නැති බව කියයි. ඔහු නැති දේ පිළිබඳව ම කියයි.

මේ අපේ සමාජයේ බොහෝ දෙනා ගේ හැටි ය. වෙනත් ලෙසකින් කියනවා නම් මේ, නිකම් සමාජයකි. නිකම් ආවා, නිකම් ගියා, නිකම් කිව්වා, නිකම් ඇහුවා, නිකම් බැලුවා ආදි වශයෙන් අප විසින් කරනු ලබන බොහෝ දේ, කතා කරන වචන, සිතන සිතුවිලි බොහෝමයක් “නිකම්”ය.

'න' කම් යන්න නිකම් වේ. කම් යනු ප්‍රතිඵලදායි කටයුත්තක නිරත වීමයි. න යනු නෑ යන අර්ථය යි. ප්‍රතිඵල දායි නොවන ක්‍රියාකාරකම්, වචන, සිතිවිලි නිකම් යන්නට අයත් වේ. මේ, ප්‍රගතිශීලි, ප්‍රබුද්ධ සමාජයක ශබ්ද කෝෂය තුළ නොතිබිය යුතු වචනයකි.

රැකියා විරහිත උපාධිධාරීන් ගේ සංගමයක් ලෝකයේ ම ඇත්තේ අපේ මේ පුංචි රටේ පමණි. යුද්ධයට අවශ්‍ය සන්නාහ සන්නද්ධයෙන් ඔවුන් සමන්විත ය. එහෙත් යුද්ධ නො කරති. යුද පිටියක් තනා දෙනතුරු බලා සිටිති.

බුදු දහම ලෞකික, පාර ලෞකික, ලොකෝත්තර අභිවෘද්ධිය සාධනය කරන දහමකි. ඒ දහම තුළ වූවෝ ප්‍රබුද්ධයෝ වෙති. ඒ සමාජය ප්‍රගතිශීලි සමාජයකි. බුදු දහම අපට කියන්නේ අතීතය පිළිබඳ ශෝක නොකරන්න. අනාගතය පිළිබඳ අසීමිත අපේක්ෂා නො තබන්න. වර්තමානය තුළ ජීවත් වන්න යනුවෙනි. වර්තමානය තුළ ජීවත් වෙනවා කියන්නේ මේ දැන් කළ යුතු, කළ හැකි දේ කළ යුතු බව යි. කළ හැකි දේ කළ නිසා උසස් දියුණුවක් ලද කෙනකු ගැන කියැවෙන කතා පුවතක් සද්ධර්ම රත්නාවලියෙහි සඳහන් වේ. ඒ, මට්ඨකුණ්ඩලී කතා වස්තුවයි. ධම්ම පදයෙහි යමක වර්ගයේ දෙවැනි ගාථාව විවරණය කරන්නට කියූ ධම්ම පදට්ඨ කථා වස්තුවෙහි දැක්වෙන අටුවා කථාව යි.

අදින්න පුබ්බක නම් වූ බමුණකු වෙයි. ඔහු නමට සරිලන සේ නුදුන් විරූ යන අර්ථයෙහි මසුරෙකි. තණ කොළයක් තෙලෙහි ගා එයින් බිඳුවකදු නුදුන් කෙනෙකි. ඔහුට පුත් කුමරෙක් වෙයි. මේ පුත් කුමරාට කුණ්ඩලාභරණයක් හදන මොහු ඒ සදහා රන් කරුවන් ගෙන ආවොත් බත්, වැටුප් දීම් ආදිය දෙන්නට වෙතැයි සිතා තමා ම ආභරණයක් තනයි. අකුරු නොදන්නා කෙනකුන් පත්වල හිරි හඳින්නා සේ යැයි ධර්මසේන හිමියන් ඔහු ගේ ක්‍රියාව උපමාවකින් දක්වයි. විසිතුරු කැටයමින් තොර මට වූ කුණ්ඩලාබරණයක් සකසා ඔහු සවන පළඳවයි. මේ ආබරණය පැළඳි ඔහුට නමක් ද පටබැඳෙයි. ඒ මට්ඨකුණ්ඩලී යන නම යි. මට්ඨකුණ්ඩලී සොළොස් අවුරුදු වියෙහි දී පාණ්ඩු රෝගයෙන් පෙළෙයි. එම රෝගය හට ගැනීමෙන් ද ව්‍යංගයෙන් කියනුයේ දරුවාට පෝෂ්‍යදායි ආහාර නොදුන් බව යි. පාණ්ඩු රෝගයට බෙහෙත් කරද්දී ද ඔහු පෙර ක්‍රමය ම අනුගමනය කරයි. වෙදුන් ළගට ගොස් වෙනත් තොරතුරු කතා කරන අතරෙහි ම පාණ්ඩු රෝගයට කරන ප්‍රතිකාර ද අසයි. එසේ අසා වෙදුන් කියන කොළ, මල්, පොතු, මුල් තම්බා දරුවාට දෙයි. රෝගියකු පැමිණ ප්‍රතිකාර නො අසන නිසා වෙදුන් ද කියනුයේ කටට ආ වදන් ය. මේ ක්‍රමයෙන් දරුවා ගේ රෝගය උත්සන්න වෙයි. දරුවා ගේ මළ ගෙදරට පැමිණෙන අය ගෙයි ඇති වස්තුව දැක මෙ තරම් වස්තුව පැවති මොහු දරුවාට බෙහෙත් කොට සුව නොකළේ ය යන චෝදනාව කරති, යි සිතා දරුවා ගෙයි ඇතුළෙයි නොතබා පිටත තැනක හිඳුවයි.

මහා කරුණාවෙන් ලොව බලන බුදුරජාණන් වහන්සේ මේ කුමරු දුටුවහ. උන්වහන්සේ ආලෝක ධාරාවක් තුළින් තමන් වහන්සේ ගේ රූපය ඔහු ඉදිරියෙහි පෙනෙන්නට සැලැස්වූහ. කුමරු ද ඉතා ප්‍රසන්න හැඟුමෙන් ඒ රුව බලා සතුටු විය.

ඒ අවස්ථාවේ දී ම මට්ටකුණ්ඩලී මිය ගොස් දිව්‍ය ලෝකයෙහි උපදින්නේ ය. ඔහු ගේ විමානය රන්වන් ය. දිව්‍යාංගනාවෝ දහසක් පිරිවරා සිටිති. යොදුනක් දිග, පළල, උස ඇති ගැල් හැටක දැමිය හැකි ආභරණ ඔහු සතු වේ. මේ සැප දකින මණ්ට්ඨකුණ්ලී දිව්‍ය පුත්‍රයා මිනිස් ලොව බැලුවේ ය. තමා මිය ගිය සොවින් තම පියා සොහොනට වී හඬන බව දුටුවේ ය.

මිනිස් වෙස් ගෙන සොහොනට පැමිණ, තමන් ද සොහොනෙහි කෙළවරකට වී හඬන්නට වන්නේ ය. ඒ දුටු අදින්න පුබ්බක එතැනට පැමිණියේ ය.

> රැකියා විරහිත උපාධිධාරීන් ගේ සංගමයක් ලෝකයේ ම ඇත්තේ අපේ මේ පුංචි රටේ පමණි. යුද්ධයට අවශ්‍ය සන්නාහ සන්නද්ධයෙන් ඔවුන් සමන්විත ය. එහෙත් යුද්ධ නො කරති. යුද පිටියක් තනා දෙනතුරු බලා සිටිති.


" දරුව, මා ගේ එකම පුතා මළ නිසා මම හඬන්නෙමි. නුඹ හඬන්නේ කුමක් නිසා ද ? "

යි ඇසුවේ ය. මිනිස් වෙස් ගත් දිව්‍ය පුත්‍රයා, තමන් සතු ව රන් මුවා රථයක් ඇති බවත්, ඊට රෝද දෙකක් ඉල්ලා හඬන බවත් පැවසී ය. තමා ගේ පුතා ගේ ම රුව ඇති මේ දරුවා ගැන ඇති වූ සෙනෙහසින් අදින්න පුබ්බක පවසන්නේ රනින්, මැණිකෙන්, දියමන්තියෙන්, රිදියෙන් යන ඕනෑම දෙයකින් රෝද සාදා දෙන බවයි. එහෙත් ඔහු ඉල්ලන්නේ එවැනි රෝද දෙකක් නොව, ඉර හඳ ය. එවිට අදින්න පුබ්බක කියනුයේ මොහු මහා මෝඩයකු බව ය. එවිට මිනිස් වෙස් ගත් දෙව් පුතු කියනුයේ, තමන් පෙනෙන්නට තිබෙන ඉර හඳ ඉල්ලන බවත්, ඔබ නොපෙනෙන කෙනෙක් ඉල්ලා හඬන බවත් ය. ඉදින්, අප දෙදෙනාගෙන් වඩා මෝඩ කවරෙක් ද යනුවෙන් ය. කෙසේ හෝ මෙම සංවාදයෙන් අනතුරුව දිව්‍ය පුත්‍රයා විසින් සියලු තොරතුරු අදින්න පුබ්බකට කියන ලදී. එහෙත් අදින්න පුබ්බකට මෙය අදහා ගත නොහැකි විය. ඔහු බුදුරදුන් ගෙන් ම ඒ ගැන විමසා දැන ගන්නට සිතුවේ ය.

කෙසේ වෙතත් අපි මෙම කථාවස්තුවෙහි දී අදින්නපුබ්බක ගේ මසුරුකම පිළිබද ව උපහාසයෙන් උගනිමු. ඒ පිළිබඳ ව අරුමයක් නැත. ඒ සාම්ප්‍රදායික දැක්ම යි. කෙනකු ගේ ගුණ නවසිය අනූනමයක් නොදකින මිනිසා එක වරද දකියි. එය මිනිස් ස්වභාවය යි. එසේ වූවත් මට්ඨකුණ්ඩලී පිළිබඳ ගුණය ගැන වැඩි අවධානයක් නොදක්වයි. නමුත් මෙම කථාවස්තුව නම් කර ඇත්තේ මට්ඨකුණ්ඩලී කථා වස්තුව ලෙස යි. මෙහි වටිනාම වස්තුව වන්නේ මට්ඨකුණ්ඩලී ගේ ක්‍රියාකාරිත්වය යි.

16 පිටුවට...





# නිතර තරහ යන නිසා ඔබත් පීඩා විඳිනවා ද?

**කේන්තිය කියන්නේ තරහ ස්වභාවයටයි. එය ගැහැනු, පිරිමි බේදයකින් තොරව සෑම කෙනකුට ම අවස්ථානුකූල ව ඇතිවන මානසික තත්වයකි.**

එහෙත් යම් කෙනකුට සාමාන්‍ය මට්ටමෙන් ඔබ්බට ගොස් කේන්තිය මතු වන්නේ නම්, එය රෝගී තත්වයක් ලෙස සැලකිය යුතු ය. ඒ අනුව කේන්තිය ඇති වීම සඳහා අදාළ පුද්ගලයාට බලපාන මූලික ම හේතුන් සොයා ගැනීමට කටයුතු කිරීම මෙන් ම, කේන්තිය පාලනය කර ගැනීමට කටයුතු කිරීම වැදගත් ය. නිතර කේන්ති යන්නේ නම් "හරහට පොල්ලක් බැඳගෙන ළිඳට පතින ලෙස" අතීතයේ දී වැඩිහිටියන් කියනු අප අසා තිබේ. නැතහොත් "කොහිල දඬු කටු පිටින් කන්නට දිය යුතු බව" ද කතාවට කියනු අසා තිබේ. එහෙත් අද වන තුරු කේන්තිය නිසා කොහිල කටු පිටින් කෑ අයකුවත්, හරහට පොල්ලක් බැඳගෙන ළිඳේ පැන්න අයකුවත් දැක හමුවී නැතත් කේන්තිය නිසා දිවි නසා ගත් අය ගැනත්, අනෙකකු ගේ දිවි නැසූ අය ගැනත්, හදිසි ආඝාතයන්ට, අංශභාග තත්වයන්ට, වෙනත් අනතුරුවලට පත්වූ අය ගැනත් බොහෝ කතා අසා තිබේ.

බෞද්ධ දර්ශනය තුළ බෙහෙවින් කතාබහට ලක්වන වැදගත් චිත්තවේගයක් ලෙස තරහව හැඳින්විය හැකි ය. එය සෘණාත්මක චිත්තවේගයකි. තරහව, එහි විවිධ මට්ටම් අනුව ද්වේෂ, ව්‍යාපාද, පටිඝ, ක්‍රෝධ, ආදී වචන සමූහයකින් හඳුන්වනු ලබයි. එමෙන් ම, තරහව ඊර්ෂ්‍යාව, මසුරුකම, හීනමානය, ආදී තත්වයන් සමඟ ද සම්බන්ධ වන බව පෙනේ. මෙහි ද්වේෂ යන්න ප්‍රධාන අකුසල මූලය වන අතර, ව්‍යාපාද හා පටිඝ යන්න එහි උච්චතම අවස්ථාවන් ලෙස දැක්විය හැකි ය. එය පරුෂ වචනයේ සිට විනාශකාරී චර්යාවන් සඳහා ප්‍රේරණය කිරීමට හේතුවක් වෙයි.

පංච නීවරණ අතර ව්‍යාපාදය නීවරණ ධර්මයක් ලෙස දැක්වෙන අතර, විසුද්ධිමග්ගයේ විස්තර වන චරිත විග්‍රහයෙහි චරිත හය අතුරින් ද්වේෂ චරිතය එකක් වෙයි. ධම්මපදයේ ක්‍රෝධ වග්ගය තරහව, එහි ස්වභාවය හා පාලනය කර ගැනීම පිළිබඳ ව පෙන්වාදීම සඳහාම වූ වග්ගයකි. ත්‍රිපිටකයෙහි ඇතුළත් මෙවැනි කොතෙකුත් දේශනාවන් කේන්තිය පාලනය කර ගැනීම සඳහා උපයෝගී කරගත හැකි ය.

> **අපට තරහක් ඇති වන්නේ තව කෙනෙක් නිසා ය. මෙයට මුල් වන්නේ වෙනත් අයකු වුවත්, තරහ ඇති වන්නේ අපේ සිතේ ය. එනිසා අනිකකු ඇති කරන දෙයක් හේතුවෙන් අපේ සිතට මහත් අලාභයක් සිදු වෙයි. එසේ නම් අපට වන ඒ අලාභය, පාඩුව නැති කර ගන්නේ කෙසේ ද?**

ආචාර්ය කිරින්දේ ධම්මානන්ද නාහිමිපාණෝ සිය දුක් බිය නැති ජීවිතය නැමැති ග්‍රන්ථයේ, කෝපය යනු අප ගේ ඇස් මද වේලාවකට නිලංකාර කරමින් එල්ලවන සැර ආලෝක ධාරාවක් බවත්, එයින් අපේ ඇස් නිලංකාර වුණු විට අපට තාවකාලික ව නිසි ලෙස නොපෙනී යන බවත්, කෝපය පැමිණි විට අප අන්ධ වී අසාධාරණ ලෙස ක්‍රියා කිරීමට පටන් ගන්නා බවත් සහ පාලනය කොට ගත නොහැකි කෝපය නිසා ඉමහත් කායික හා මානසික පීඩා ඇති වන බවත් අවධාරණය කරති.

පෘථග්ජන අප කාටත් ඕනෑම මොහොතක, කුමන කරුණක් නිසා හෝ තරහ ඇති වීම සාමාන්‍ය තත්ත්වයකි. ජීවිතයේ කවරදිනෙකවත් තරහා නොගිය කෙනෙක් සොයා ගත නොහැකි ය. අපට තරහක් ඇති වන්නේ තව කෙනෙක් නිසා ය. මෙයට මුල් වන්නේ වෙනත් අයකු වුවත්, තරහ ඇති වන්නේ අපේ සිතේ ය. එනිසා අනිකකු ඇති කරන දෙයක් හේතුවෙන් අපේ සිතට මහත් අලාභයක් සිදු වෙයි. එසේ නම් අපට වන ඒ අලාභය, පාඩුව නැති කර ගන්නේ කෙසේ ද?

දැන්, මේ මොහොතේ කිසිවකු ඔබව කෝපයට පත් කරවන දෙයක් කීවේ හෝ කළේ යැයි සිතන්න. ඒ අනුව දැන් ඔබේ සිතේ තරහක් ඉපදී ඇත. ඔබට තරහක් ඇති වූ විට ඔබේ සිතට එය ඔබෙන් සඟවා ගැනීමට හැකියාවක් නැත. එසේ නම් මගෙ හිතේ දැන් තරහක් ඇති වී තිබේ යනුවෙන් ඔබ ඒ තරහ හඳුනා ගත යුතු ය. තරහ දුරු කර ගන්නට නම් මුලින් ම තරහක් සිතේ ඇති වී තිබෙන බව දැන ගත යුතු වෙයි.

මීළඟට ඔබ මෙසේ කල්පනා කළ යුතුයි. මේ කෝප සහගත සිතිවිල්ල නිසා ඔබට සිදුවන හානි බොහෝ ය. ඔබේ සිරුර වෙව්ලයි. ලේ ගමනා ගමනය වේගවත් වෙයි. මුහුණ අඳුරු වෙයි. මුහුණේ මස් පිඬු ඇද වී ගොස් ඔබේ මුහුණේ විකෘති පෙනුමක් ඇති වේ. ඒ අනුව මුහුණ මුළුමනින් ම අවලස්සන වෙයි. මූණට අබ අහුරක් දැම්මත් පුපුරනවා යැයි තරහ ගිය අය ගැන සමහරු කියන අන්දම ඔබත් බොහෝ විට අසා ඇතිවාට සැක නැත. එයට හේතුව තරහ ගිය විට සිරුරේ රුධිරය උණුසුම් වීමය. මෙවැනි දේවලින් ඔබට සිදුවන අවැඩ මෙනෙහි කරන්න. පාඩුව මෙනෙහි කරන්න. නිතර තරහ යන කෙනෙකු ගේ ලේ ධාතුව අපිරිසුදු වෙයි. එනිසා අධි රුධිර පීඩනය, ගැස්ට්‍රයිටිස් ආදී වූ ලෙඩ රෝග රාශියක් හට ගත හැකි ය. රුධිරයේ සීනි මට්ටම වැඩි වීමටත් නිතර හට ගන්නා තරහ බලපායි. එසේම තරහ සිතිවිලි ක්‍රියාත්මක වීම තුළ ඔබට ලැබෙන්නට නියමිත ලාබ පවා අහිමි වී යන්නට පුළුවන. ඔබට පමණක් නොව ඔබ නිසා ඔබේ සමීපතමයන්ට පවා පාඩු සිදුවීමට ඉඩ ඇත. එසේම ඔබේ තරහව නිසා බිරිඳ, දරුවන් රෝගී වීමට වුව හැකියාව තිබේ. තරහ උපරිමයට ගිය විට සිය දිවි නසා ගැනීමට, ඔබ කෝපයට පත් කළ පුද්ගලයා මරා දැමීමට, ඒ පුද්ගලයා මරා ඔබත් සිය දිවි නසා ගැනීමට වුව සිතක් ඇති වන්නට බැරි කමක් නැත. ඔබ තුළ තරහවක් ඇති කළේ යම් දෙයක් අහිමි වීම නිසා නම් ඒ අහිමි වූ දෙය තව කෙනකුට හිමි වීම වැළැක්වීම සඳහා එය විනාශ කර දැමීමට වුව පෙළඹෙන්නට බැරි කමක් නැත.

අනෙක් අතට තරහ පදනම් කර ගෙන එයට ප්‍රතිචාර දක්වන්නට යාම තුළ ප්‍රතිවාදියා ගෙන් එල්ල වන ප්‍රහාරයක් නිසා සදාකාලික ආබාධිත වීමට, මිය යාමට, දේපොළ අහිමි වීමට, සිර දඬුවම් විඳිමට පවා සිදු විය හැකි බව අමතක නොකළ යුතු ය. එනිසා සිතේ තරහක් හෙවත් ද්වේෂයක් හට ගත් කල එය නැති කර ගන්නේ කෙසේද යන්න ඕනෑම කෙනකුට ඉතා වැදගත් වනු ඇත.

කේන්තිය පාලනය කර ගැනීමට බුදු දහමේ එන ඉගැන්වීම් පිළිබඳ ඊළඟ ලිපියේ දී සාකච්ඡා කරමු.

පැල්මඩුල්ල ඓතිහාසික
ශ්‍රී සුදර්ශන ධර්මශාලා විහාර භාරකාර,
අධ්‍යාපනවේදී
**ගලගම කුසලධම්ම හිමි**



# සක් දෙවිඳුගෙන් මලියදේව මහ තෙරුන් වහන්සේට ආරාමයක්

**මලියදේව මහ රහතන් වහන්සේට ශක්‍ර දෙවියන් විසින් මහ මැඳුරක් ඉදිකර දුන් බවට ප්‍රවාදයක් වෙයි. එම ප්‍රවාදය විවිධ ස්වරූපවලින් ගැමි ජනයා පවසති. මෙහි දැක්වෙන්නේ එයින් එක් ප්‍රවාදයකි. දඹදිව යෝනකාරාමයෙහි එක් අන්ධ ස්ත්‍රියක් පුතකු වැදුවා ය. ඔහුගේ පියා ද අන්ධයකි. දරුවා ක්‍රමයෙන් වැඩිවියට පත් ව මව්පියන් ද රැක බලා ගත්තේ ය. ක්‍රමයෙන් වයස්ගත වූ පියා මරණාසන්න විය. සිය පුතු කැඳවා,**

"පින්වත් පුතණුවනි, ඔබ විසින් අපට කරනු ලබන උපකාර වෙනුවෙන් පෙරළා දිය යුතු කිසිවක් අප සතු ව නැත. අප ගේ ආශීර්වාදය ගන්න. අප මිය ගිය පසු උතුරු දිගට ඇති මාර්ගයේ ගමන් කරන්න. එහි දී ඔබට පැවිදි උතුමකු ගේ ආරාමයක් පිහිටි වනයක් හමුවනු ඇත. එහි රැඳෙමින් උන්වහන්සේට උපස්ථාන කරන්න. උන්වහන්සේ ගේ උපදෙස් පිළිපදින්න"

යනුවෙන් පැවසී ය. මව්පියන් මිය ගිය පසු ඔවුන් ගේ උපදෙස් අනුව ආරාමය වෙත ගොස් උන්වහන්සේට නමස්කාර කර සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ

"කුමන රටකින්, කුමක් පිණිස පැමිණියේ ද?" යි විමසා සිටියහ. එවිට එම තරුණයා මව්පියන් ගේ උපදෙස් අනුව පැමිණි බව කියා සිටියේ ය. එයින් පැහැදුණු තෙරුන් වහන්සේ ඔහු පැවිදි කරවා තමන් සමීපයෙහි නවතා ගත්හ. කලක් ගතවුණි. ඒ තෙරුන් වහන්සේ ද ක්‍රමයෙන් වයස ඉක්මවා ගොස් ලෙඩ ඇඳට වැටුණහ. දිනක් සාමණේර තෙරුන් වහන්සේ තමන් වහන්සේ සමීපයට කැඳවා

"පින්වත් සාමණේරය, මරණය සඳහා මගේ කාලය පැමිණ තිබේ. ඔබට දීමට මා සතු කිසිවක් නැත. එහෙත් තඹරන් පිළිම සතරක් සහ ස්වර්ණමය පිටවැසුම් සහිත ධර්ම පුස්තකයක් මා සතු වී ඇත. එය ගන්න"

යි කියා එදින රාත්‍රියෙහි තෙරුන් වහන්සේ අපවත් වූ හ. උන්වහන්සේ ගේ ආදාහන කෘත්‍යයෙන් පසු දිනෙක සතරවරම් දෙවි රජවරු දෙව් ලොවෙන් බැස අවුත්

"ඔබ වහන්සේ ගෞතම බුදුන් වහන්සේ ගේ විවරණ දීමෙන් මේ අනාගත කාලයෙහි උපන් සේක. මනාව අසනු ලැබේවා! මහා බෝධි මූලයෙන් තුදුස් රියන් උසැති වජ්‍රාසන මධ්‍යයෙහි බුදුන් වහන්සේ ගේ පාත්‍රා ධාතුව වැඩ සිටින රන් කරඬුවක් තැන්පත් කර ඇත. එය ලබා ගන්න" යි පවසමින් උන්වහන්සේට "මලියදේව තෙරුන් වහන්සේ" යන නාමය ද තබා දෙව්ලොවට ගියහ. දෙවිවරුන් ගේ මඟ පෙන්වීම අනුව මලියදේව තෙරුන් වහන්සේ එතැනට වැඩම කොට මහත් වූ උනන්දුවෙන් බොහෝ කලක් ආයාචනා කර සිටි කල්හි ස්වර්ණමය කරඬුව උන්වහන්සේ ගේ දෝතට වැඩම කළේ ය. ඉක්බිති තෙරුන් වහන්සේ තඹරන් පිළිම සතර ද, රන් බණ පොත ද, ස්වර්ණමය

> ස්වාමිනි, නුඹ වහන්සේ සත්‍යයක් ම ප්‍රකාශ කරන සේක. හෙට ඉර උදාවී පියවර නවයක් ගිය පසු ආරාම සොළොස ඉදි කොට ඔබ වහන්සේට පවරා දෙන්නෙමි. එතෙක් මෙහි වැඩ වාසය කළ මැනව"යි කීවේ ය.

කරඬුව ද රැගෙන ඍද්ධියෙන් අහසට පැන නැඟී ලංකාවේ වැලිගොඩපිටියට වැඩියහ. පිළිම සතර ද, රන් බණපොත ද එහි වැල්ලෙහි සඟවා තබා රන් කරඬුව පමණක් ගෙන පිඬු පිණිස හැසුරුණහ. එහෙත් කිසිවකු වෙතින් හෝ පිණ්ඩපාතය නො ලැබුණේ ය. එබැවින් රජ මාලිගාව දෙසට වැඩියහ. රජතුමා එය දැක අමාත්‍යවරයකු යවා රජ මාලිගාවට වැඩමවා උන්වහන්සේ ගේ දැහැමි බව දැක මහත් සේ ප්‍රසාදයට පැමිණියේ ය. සිහසුනෙහි හිඳුවා රාජ භෝජන වැළඳවීය. තෙරුන් වහන්සේ වළඳා අවසන් වූ කල්හි රජු මෙසේ විමසා සිටියේ ය.

"ස්වාමිනි, ඔබ වහන්සේ කොහි සිට වැඩිසේක් ද?"

එවිට තෙරුන් වහන්සේ, තමන් වහන්සේ දඹදිව යෝනකාරාමයෙහි සිට වැඩම කළ බවත්, රජ තෙමේ ආරාමයක් කරවා එය සුදුසු ලෙස තමන් වහන්සේට පවරාදීම් සිදු කරන්නේ නම්, එයට රිසි බවත් පිළිතුරු ලෙස ප්‍රකාශ කළහ.

එකල්හි රජතුමා තෙරුන් වහන්සේට වන්දනා කරමින්, තමන් දැනට වැව් දෙකක් ඉදිකරමින් සිටින නිසා වහා ආරාමයක් ඉදිකිරීමට නො හැකි බවත්, එම කර්මාන්ත දෙකෙහි කටයුතු අවසන් වූ විගස ආරාමයක් සකසා දෙන බවත්, එතෙක් රාජ මාලිගයෙහි වැඩ සිටින ලෙසත් සිහිපත් කරමින් ආරාධනා කළේ ය. එයට අකැමැති වූ තෙරුන් වහන්සේ අහසට පැන නැඟී දිගට ඇදී යන කසාවන් හුයක් සේ රජුගේ දෘෂ්ටි පථයට දිස් වෙමින් ශක්‍ර භවනයට වැඩම කර ශක්‍ර දෙවියන් අමතා

"දඹදිව යෝනකාරාමයෙහි සිට මම මෙහි පැමිණියෙමි. මට ලක්දිව තලවතුපිටියෙන් ආරාම සොළොසක් පිරිනැමීමට තොපට බුදුන් වහන්සේ විසින් නො අනුදැන වදාරණ ලද්දෙහි ද?" යි විමසා සිටි කල්හි ශක්‍ර දෙවියන් පිළිතුරු දෙමින්

"ස්වාමිනි, නුඹ වහන්සේ සත්‍යයක් ම ප්‍රකාශ කරන සේක. හෙට ඉර උදාවී පියවර නවයක් ගිය පසු ආරාම සොළොස ඉදි කොට ඔබ වහන්සේට පවරා දෙන්නෙමි. එතෙක් මෙහි වැඩ වාසය කළ මැනව" යි කීවේ ය. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා සහ මාතලී දිව්‍ය පුත්‍රයා වහා කැඳවා මිහින්තලයට ගොස් ගල්කණු එකසිය හැටක් තලවතුපිටියට රැගෙන යන ලෙස අණ කළේ ය. ඔවුන් නික්ම ගිය පසු ශක්‍ර දේවේන්ද්‍රයා සොළොස් ආරාමය පිහිටන මිහි මත භූමියට සුවඳ සුනු සහ මල් වැස්සක් වැස්සවී ය. යළි ඒ මත තල තෙල් තවරන ලද වැලි, බොරළු හා මැටි වැස්සක් වැස්සවී ය. මේ වේලෙහි මාතලී සහ විශ්වකර්ම දිව්‍ය පුත්‍රයෝ ගල්කණු තලවතුපිටියට ගෙන ආ හ. ශක්‍ර දේවේන්ද්‍රයා සත් රුවන් ආදී වූ වැසි වැස්ස වූ භූමිය මැන සොළොස් භාගයකට සීමා බෙදා එහි ආරාම සොළොසක් තැනවී ය. ආරාම සියල්ල සකසා අවසන් වූ කල්හි ශක්‍ර දෙවි සහ මලියදේව මහ රහතන් වහන්සේ ශක්‍ර භවනයෙන් නික්මී තලවතුපිටියට ගොඩ බැස්සහ. අනතුරු ව ශක්‍ර දේවේන්ද්‍රයා ආරාම සියල්ල තෙරුන් වහන්සේට පූජා කර කුසල් රැස් කර ගත්තේ ය.

ඉන්පසු තෙරුන් වහන්සේ ගෝඨාභය රජතුමා විසූ පේරාදෙණි නුවරට ගොස්

"මහ රජ, මම විහාරයක් ඉදිකරවා ගත්තෙමි. තොප ද එහි ගොස් බලා පූජා කරව"

යි කීහ. රජතුමා ද ආරාම සොළොස නරඹා මහත් වූ ප්‍රීතියට පැමිණ නාරංගල මුදුනේ සිට ලොහෝ බෙර ගස්වා ඒ හඬ සවන් වැකුණු මානය තෙක් වූ සියලු ඉඩකඩම් මේ ආරාමයට අයිති කොට පූජා කළේ ය. පේරාදෙණි නුවරට පෙරළා පැමිණ හෙතෙම බෙරහඬ සවන් වැකුණේ දැයි බිසෝවරුන් ගෙන් විමසා සිටියේ ය. එවිට බිසෝවරුන් ඒ හඬ සවන් වැකුණු බව ප්‍රකාශ කර සිටි බැවින් "මෙ තැන ද ආරාමයට පූජා පිණිස අයත් වූයේ ය. එ බැවින් මෙහි වාසය කිරීම ද අපට යෝග්‍ය නො වන්නේ ය" යැයි පවසා රජ තෙමේ පිරිස සමඟ මාලිගයෙන් නික්ම ගිය බව පැවසේ.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනයේ
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# පූජා පැවැත්වීමේ දී ගාථා කියන්න ම ඕනෑ ද?

**පූජා ක්‍රම දෙකකි. ආමිස සහ ප්‍රතිපත්ති වශයෙනි. ආමිස වැඩීමෙන් ම පමණක් නිර්වාණ අවබෝධය සිදු නො වන බව බුදුන් වහන්සේ පෙන්වා දි ඇත. එසේ ම ප්‍රතිපත්තිය ආමිසයට වඩා වර්ණනා කොට ඇත. එසේ නම් ආමිසය අවශ්‍ය ද? එය තීරණය කළ යුත්තේ තම තමන් ම ය. නිර්වාණය අවබෝධ කර ගන්නා පුද්ගලයන් සතර දෙනෙක්, ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සූත්‍ර ගණනාවක දී ම මුණ ගැසේ.**

දුක සේ සෙමින් ධර්මය අවබෝධ කරන්නෝ, දුක සේ වහා ධර්මය අවබෝධ කරන්නෝ, සුව සේ සෙමින් ධර්මය අවබෝධ කරන්නෝ සහ සුව සේ වහා ධර්මය අවබෝධ කරන්නෝ ලෙසිනි.

සසර කළ ආමිස පූජාවන්ට අනුරූපී ව තමන් ගේ සසර ගමන සැපවත් වනවා සේ ම නිර්වාණාවබෝධය ද වහා සිද්ධ වේ. මෙනිසා ආමිසය පූරණය කළ යුතු ද, නැද්ද යන්න තම තම නැණ පමණින් දත යුතු ය. මෙම ගාථා භාවිතය ද ආමිස පූජාවකි.

සාහිත්‍ය මූලාශ්‍රයන්ට අනුව බුදු පිළිම වන්දනාව බුද්ධ කාලයේ ආරම්භ වූවකි. අටුවා පොත්වලත්, මහාවංසාදී වංසකථාවලත් සඳහන් වන ලෙස අනුරාධපුර යුගයේ බුදු පිළිම වන්දනය අතිශයින් තිබී ඇත. එමෙන් ම බුදුරජාණන් වහන්සේ වෙනුවට, උන්වහන්සේ නොමැති අවස්ථාවල දී වන්දනය සඳහා ඇසතු බෝධීන් වහන්සේ සුදුසු බව බුදුරජාණන් වහන්සේ ම පෙන්වා දුන්හ. මෙයින් පෙනී යන්නේ බුදුරජාණන් වහන්සේ ආමිසය නො සලකා හැරියේ නැති බව යි. බෞද්ධයකු යනු ආමිසය සේ ම, ප්‍රතිපත්තිය ද පූරණය කරන කෙනකු ය. මෙම උභයාංශය ම සමබර ව ගෙන යන්නකුට සසර ගමන සැපවත් ව සේ ම වහා නිර්වාණාවබෝධය සිද්ධ වන බව සිහි තබා ගත යුතු ය.

> **"බෞද්ධයන් පුද - පූජා පවත්වන විට පැය ගණන් විවිධ ගාථා කියා බුදුන් වහන්සේට පූජා පවත් වන බවක් පෙනී යයි. එය විහිලුවක් ද? කොහෙත් ම නැත. එසේ විහිලුවක් කොට සලකා යමෙක් තවකෙනකු ගේ ශ්‍රද්ධාව උපහාසයට භාජනය කරයි ද, එය අනිටු ඵල විපාක දෙන්නකි. ලකුණ්ට භද්දිය මහ රහතන් වහන්සේ මිහිරි ව බණ දෙසන්නන් අතර අග්‍ර වුවත්, මිටි ව උපන්නේ සසර තුළ වෙන කෙනකු ශ්‍රද්ධාවෙන් සිදු කරන්න ගිය පින්කමක් සීමා කිරීමට යාමෙනි."**

සත්‍ය වශයෙන් ම පිරිනිවන් පා වදාළ බුදුරජාණන් වහන්සේට පුද පූජා තිබීම ඵල සහිත ද? බුද්ධ පූජාව ගොඩක් බෙදන්න ඕනෑ නෑ. මොකෝ බුදු හාමුදුරුවෝ වළඳනව ද? යන ප්‍රශ්න හා තර්ක සමාජයේ පවත්නා හිස් ප්‍රලාප ගොඩකි. 'තිට්ඨන්තේ නිබ්බුතේ චාපි සමෙ චිත්තේ සමං ඵලං' යන විමානවත්ථු පාඨයට අනුව, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ ද, ධරමාන ව වැඩ සිටිය ද යහපත් සිතින් පුද - පූජා පැවැත්වීමෙන් සම වූ ආනිසංස ලැබෙන බව තේරුම් ගත යුතු ය. එය බුදුරජාණන් වහන්සේ වළඳනවා ද, නැද්ද යන්න නොව 'මේ පූජා කරන්නේ ජීවමාන බුදුන් වහන්සේට ය' යන සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සිතින් පූජා පැවැත් විය යුතු ය. යෝගට් කප් එකක් තරම් භාජනයකට ව්‍යංජන බත් සියල්ලමත්, කුඩා කප් එකකින් පැන් තියා පෙරේතගොටු සේ පූජා පැවැත් වීමෙන් ඔබ බලා පොරොත්තු වන පින කුමක් ද?

බෞද්ධයන් පුද - පූජා පවත්වන විට පැය ගණන් විවිධ ගාථා කියා බුදුන් වහන්සේට පූජා පවත් වන බවක් පෙනී යයි. එය විහිලුවක් ද? කොහෙත් ම නැත. එසේ විහිලුවක් කොට සලකා යමෙක් තවකෙනකු ගේ ශ්‍රද්ධාව උපහාසයට භාජනය කරයි ද, එය අනිටු ඵල විපාක දෙන්නකි. ලකුණ්ට භද්දිය මහ රහතන් වහන්සේ මිහිරි ව බණ දෙසන්නන් අතර අග්‍ර වුවත්, මිටි ව උපන්නේ සසර තුළ වෙන කෙනකු ශ්‍රද්ධාවෙන් සිදු කරන්න ගිය පින්කමක් සීමා කිරීමට යාමෙනි.

පූජා පවත්වන විට ගාථා අවශ්‍ය ම නැත. යමෙක් පූජාව ආසනය මත පූජා කිරීමේ අදහසින් තුබූ පමණින් ම ඔහුට එයින් අත්වන පින ලැබී අවසන් ය. එනිසා ගාථා කීමෙන් පලක් නැතැයි තීරණය කිරීමට ඉක්මන් නො විය යුතු ය. රේරුකානේ නායක ස්වාමීන් වහන්සේ ද පෙන්වා දෙන පරිද්දෙන් එයින් වෙන ම ආනිසංසයක් උදා වේ. එනම් ස්තුති පූජාව මඟින් ලැබෙන පින යි.


සාමඤ්ඤඵල සූත්‍ර අටුවාව උදාහරණ කොට පෙන්වා දෙන රේරුකානේ මහ නාහිමියෝ මහා සැයක් නම් තෙවිටක් ප්‍රදක්ෂිණා කොට සතර තැනකත්, කුඩා සැයක් නම් එසේ ද ප්‍රදක්ෂිණා කොට අට තැනකත් සිට වැඳිය යුතු ය. නමුත් ඒ කිසි තැනක ගාථා කී වගක් නො පෙනේ.

සේතව්‍ය නුවර වුසූ ඡත්ත නම් තරුණයා ගුරු පඬුරු ගෙන ඒම සඳහා උක්කට්ඨාවේ සිට සේතව්‍යයට යයි. අතර මග දී බුදුන් වහන්සේ හමු වී පුරුදු කරන ලද තෙරුවන් ගුණ ගාථා ද සිහියෙන් කියමින් යන්නේ සොරුන් ගේ හී පහරින් මැරී වැටෙයි. එවිට ම ඔහු දෙව් ලොව උපත ලබයි. සිහියෙන් ගාථා කීමේ ඵලය එය යි. මෙවන් කතා රැසක් පෙළ සාහිත්‍යයෙන් දත හැකි ය. මෙනිසා ගාථා කීම පල රහිත යැයි ඉවත දැමිය නො හැක.

ගාථා කියන්නෝ දෙ වර්ගයකි. අවබෝධයෙන් කියන්නෝ සහ අනවබෝධයෙන් කියන්නෝ වශයෙනි. තේරුමක් නො දැන ගිරා න්‍යායෙන් හෙවත් පුහුණු කරන ලද ගිරව් සේ රැය පහන් වන තුරු ගාථා කීව ද එය වනාහි ගඟට ඉනි කැපීමකි. ගාථාවක් කීමේ දී එය නිවැරැදි සේ ම, එහි අර්ථය අවබෝධයෙන් කිව යුතු ය. ලාංකේය බෞද්ධ සමාජය තුළ එවන් අවබෝධාත්මක ගාථා භාවිතයක් තියා පූජා පැවැත්වීමක් වුව දැක ගත නො හැකි තරම්ය. හුදු ශ්‍රද්ධාවන්තයෝ, කපටියෝ හැටියටත්, හුදු ප්‍රඥාවන්තයෝ මෝඩයෝ හැටියටත් මහාවග්ගපාළි අටුවාව පෙන්වා දෙන්නේ එහෙයිනි.

ශ්‍රද්ධාව සහ ප්‍රඥාව සමබර ව පවත්වන්නා නියමාකාරයෙන් මේ පූජා කරන්නේ ජීවමාන බුදුන් වහන්සේට ය යන හැඟීම සහිත ව අවබෝධයෙන් ගාථා කියා පූජා පවත්වයි. (රේරුකානේ මහ නාහිමියන්ගේ ධර්ම විනිශ්චය කියවන්න.)

එසේ ම නූතනයේ බොහෝ දෙනා භාවිත කරන ගාථා නිවැරැදි නො වේ. අර්ථය සේ ම ව්‍යාකරණය ද වැරැදි ය. මෙම තත්ත්වය වෙනස් කළ යුතු ය. එහි ලා මාසික ව බෞද්ධයන් විසින් භාවිත කරන ලද සාවද්‍යය ගාථා අර්ථ සහිත ව නිවැරැදි කොට පෙන්වා දීමට අප තීරණය කෙළෙමු. තත් කටයුත්තේ පදනම වශයෙන් පූජා සහ ගාථා අවශ්‍ය ද යන්න මෙහි දක්වා ඇත.






**බුලත්සිංහල සිරි ඤාණරතන හිමි**
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
හෝමාගම



# මරණය ජීවිතයක ආරම්භය සේ ම අවසානය ද නොවේ

යථාපි මූලේ අනුපද්දවේ දල්හේ
ඡින්නෝ පි රුක්ඛෝ පුනරේව රූහති
ඒවම්පි තණ්හානුසයේ අනූහතේ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං
යම් සේ ගසක මුල උවදුරකට

නොපැමිණ ශක්තිමත් වූ කල, ඒ ගස කපා දැමූ නමුත් මුදුන් මුල උවදුරකින් තොරව තිබෙන තාක් කල්, ඒ ගස නැවත නැවතත් වැඩේ ද, එසේ ම තෘෂ්ණානුසය සිඳ බිඳ නොදමන තාක් කල් සත්ත්වයා නැවත නැවතත් මේ සසර ම උපදින්නේ ය. එසේ උපත ලබන සත්ත්වයා ගේ පුනර්භවය තීරණය කරනු ලබන්නේ ඔහු විසින් තිදෙරින් සිදු කරනු ලැබූ කර්මයනට අනුකූලව යි. බුදුරජාණන් වහන්සේ ඒ බව මෙසේ දේශනා කළහ. "කම්මස්සකා මානව සත්තා කම්මදායාදා කම්මයෝනි කම්මබන්ධූ කම්මපටිසරණා කම්මං සත්තේ විභජති යදිදං හීනප්පණීතතාය" සත්ත්වයා යම් භවයක උපන් මොහොතේ සිට සම්මුති මරණයෙන් මිය යන තුරු ඇසිපිල්ලමක් ගසනවා වැනි සුළු කාලයක දී සිය දහස් වාරයක් ඉපිද ඉපිද මිය යන්නේ ය. මැරී මැරී ඉපදෙන්නේ ය. සංස්කාර ධර්මයන්ගේ ක්ෂණභංගුරත්වය කියන්නේ මෙම ස්වභාවයට යි. නාම රූප ධර්මයන්ගේ මේ ක්ෂණභංගුරත්වය (ඉපදීම හා විනාශ වී යාම) මොහොතෙක් මොහොතක් පාසා වහ වහා සිදුවන හෙයින්, එය ක්ෂණික මරණය නම් වන්නේ ය.

උපන් සියලූ ම සත්ත්වයෝ මරණයට මුහුණ දෙති. මරණය යනු පඤ්චස්කන්ධයාගේ බිඳීයාම යි. ආයුෂය, උණුසුම සහ සිත ශරීරයෙන් බැහැර වීම යි. සත්ත්වයා ජීවත් වන්නේ මේ කාරණා තුන ඇතිවිට යි. එහෙයින් මරණය සියල්ලන්ට ම සාධාරණ වූ ධර්මතාවයකි. එයින් බේරීමට මොන ම උපක්‍රමයෙක් වත් නැත්තේ ය. බෞද්ධ දෘෂ්ඨිකෝණයට අනුව කෙනකුගේ චිත්ත සන්තතිය භෞතික ශරීරයෙන් වෙන් වෙනවාත් සමඟ ම මරණය සිදු වේ. එසේ ම එය යළිත් සම්බන්ධවීම තීරණය වන්නේ ඊළඟ ජීවිතයේ ස්වභාවය අනුව වේ. මරණය සත්ත්වයාගේ නව ජීවිතයක ආරම්භය සේ ම, අවසානය ද නොවේ. මරණයත් සමඟ ම තවත් තැනෙක උපත සිදු වන්නේ ය. එය තම තමන් විසින් රැස් කළ හොඳ නරක කර්මයන් අනුව ම සිදු වන්නකි. අන්තිම මොහොත වූ කලී අතිශයින් ම තීරණාත්මක අවස්ථාවකි. සතුට, ප්‍රීතිය, සැනසිල්ල මෙන් ම, බිය, සන්ත්‍රාසය මෙන් ම දුක් වේදනාවන් ද ගෙන දෙන අවස්ථාවකි. කායස්සභේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උප්පජ්ජති – පින් දහම් කළ අය මරණින් මතු සුගතියෙහි උපදියි. සුත්තප්පබුද්ධෝ විය දේවලොකේ නිබ්බතති – නිදා පිබිදියාක් මෙන් දෙව්ලොව උපදියි. යථාහතං නික්ඛිත්තෝ එවං නිරයේ – පව් කළ අය හිසෙයි හෝ කයෙහි තිබී බහා තැබූ බරක් මෙන් නිරයෙහි උපදියි. මරණ මොහොතට මුහුණ දෙන තැනැත්තන් විසින් පෙර තමන් රැස් කළ කර්මයක්, කර්ම නිමිත්තක් හෝ ගතිනිමිත්තක් අනායාශයෙන් ම ඔවුන්ගේ මනසට එනු ඒකාන්ත ය. මෙම තීරණාත්මක අවස්ථාව මත මතු ජීවිතය පිළිබඳ අවසන් තීරණය සිදු වන්නේ ය. "කම්මවිපාකා භික්ඛවේ අචින්තෙය්‍යා. න චින්තිතබ්බෝ. යං චින්තෙන්තෝ උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස" මහණෙනි, කර්මවිපාකය නොසිතිය යුත්තකි. නොසිතිය යුතු ය. එය සිතන තැනැත්තා උමතුවටත් දුකටත් පැමිණේ යනු බුදුරජාණන් වහන්සේගේ දේශනාවයි.

පුනරුත්පත්තිය හා පුනර්භවය යන වචන නිතර අපට ඇසෙන වචන දෙකකි. පුනරුත්පත්ති යන වචනයෙන් භවයෙන් භවයට යන නොමියෙන නොදිරන ආත්මයක් ගැන හැඟෙයි. බුදු දහමේ එබඳු ඉගැන්වීමක් ගැන අදහස් නොකරයි. පුනර්භව යන වචනය බොහෝ සූත්‍ර දේශනාවල (නත්ථිදානි පුනබ්භවෝ) යන යෙදුමෙන් පෙනේ. බුදුරජාණන් වහන්සේ සමඟ වාද විවාද කළ බොහෝ දෙනා මරණයෙන් පසු නැවත උපදින්නේ මේ සත්ත්වයා ම දැයි ප්‍රශ්න කළහ. මේ සත්ත්වයා ම යැයි කෙළින් පිළිතුරු දුන්නොත් භවයෙන් භවයට දිගින් දිගට නොනැසී පවතින ආත්මයක් ඇතැයි සිතා ශාස්වත දෘෂ්ඨියට පැමිණෙයි. වෙනත් සත්ත්වයකු යැයි ප්‍රකාශ කළොත් මේ සත්ත්වයා මේ භවයෙන් අවසාන යැයි සිතා උච්ඡේද දෘෂ්ඨියට වැටෙයි. මේ දෙකරුණ ම සැලකිල්ලට ගෙන මරණින් මතු උපදින්නේ මේ සත්ත්වයාමත් නොවේ. අන් සත්ත්වයෙක් ද නොවේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙයින් පැහැදිලි වන කාරණය නම් පුනර්භවය ලබන සත්ත්වයා අලූතින් ම හට ගන්නා බැවින් පැරැණි සත්ත්වයාමත් නොවන්නේ ය. එසේ ම පෙර සසර කළ කර්ම විපාක විඳුවන එක ම චිත්ත පරම්පරාවක් පවත්නා හෙයින් වෙනස් වූ අනෙක් සත්ත්වයෙක් ද නොවන්නේ ය.

අනමතග්ගෝයං භික්ඛවේ සංසාරෝ පුබ්බාකෝටි න පඤ්ඤායති – සත්ත්වයාගේ සසර පැවැත්මේ අගක් මුලක් දැකිය නොහැකි ය. සත්ත්වයාගේ අගමුල සෙවීම මුළාවකි. සත්ත්වයාගේ සසර පැවැත්මට ප්‍රබල සාධකය වූ කර්ම රැස්කිරීම සිදු වන්නේ ද තෘෂ්ණාව නිසා ය. තෘෂ්ණාව සහමුලින් උදුරා දැමීම භවනිරෝධයට මුල් වේ.

> "පුනර්භවය ලබන සත්ත්වයා අලූතින් ම හට ගන්නා බැවින් පැරැණි සත්ත්වයාමත් නොවන්නේ ය. එසේ ම පෙර සසර කළ කර්ම විපාක විඳුවන එක ම චිත්ත පරම්පරාවක් පවත්නා හෙයින් වෙනස් වූ අනෙක් සත්ත්වයෙක් ද නොවන්නේ ය."

පණ්ඩිත හක්මණ සුමනසිරි හිමි

**මේ ලෝකයෙහි මව්පියන්ට ඇති වටිනාම වස්තුව තම දරුවන් ය. බුද්ධ දේශනාවේ දී "පුත්තා වත්ථුමනුස්සානං" ලෙස දැක්වූයේ එහෙයිනි. අපේ බුදුරජාණන් වහන්සේ, රාහුල පුතාට මෙන් ම සමස්ත දරුවන්ට එකසේ ආදරය මෛත්‍රීය දැක්වූහ.**



# ළමයින්ට දිය යුතු හොඳම දෙය අම්මගේ තාත්තගේ අවධානය යි

දායාද ඉල්ලූ රාහුල පුතා මෙන් ම කසළ කද ගෙන ගිය සුනීතට ද සම කරුණාව දැක්වූහ. සුළු පියා ගේ වධහිංසාවට ලක් වූ සෝපාක මෙන් ම, මට්ටකුණ්ඩලියට ද එක සේ කරුණාවේ සුරත දිගු කළහ. තථාගතයන් වහන්සේට, බුදුපියාණන් වහන්සේ ලෙස අමන්ත්‍රණය කරන්නේ ද එහෙයිනි. විශුද්ධි මග්ගයට අනුව මන්ද දශකය සහ ක්‍රීඩා දශකයෙහි මැද භාගය තෙක් කාලය ළමා කාලය යි. විශේෂයෙන් කාමේසු පළාළිත සූත්‍රයේ දී තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනු ලබන්නේ මේ කාලය තුළ අතට හසුවන දෑ දරුවන් කටට දමා ගන්නා බවයි.

මව්පියන් ලෙස සියලු දේ සිදු කරන්නේ ළමයි වෙනුවෙන් නම්, ඔවුන් වෙනුවෙන් සැලකිය යුතු කාලයක් මිඩංගු කළ යුතු ය. මන්දයත් දෙමාපියන් ගේ ඇස් මට්ටමෙන් දරුවා ගිලිහුණ හොත් බොහෝ ගැටලු නිර්මාණය විය හැකි බැවිනි. ලබා දෙන අවවාදවලට වඩා ලැබෙන ආදර්ශය ඔවුහු හිස් මුදුනින් පිළිගනිති. ඒ බව දෙමපියන් ලෙස තේරුම් ගැනීම අතිශයින් වැදගත් ය. පාසලේ දී පන්ති භාර ගුරුතුමිය ගේ හැසිරීම ගෙදරදී අනුකරණය කරනවා සේ ම, ගෙදරදී ලබන අත්දැකීම් සමාජයේ දී අත්හදා බැලීමට ඔවුන් පෙළඹේ. දරුවන්ට දඬුවම් ලබාදීමේ දී මෙන් ම, අවවාද ලබාදීමේ දී අතිශයින් සැලකිලිමත් විය යුතු ය. දඬුවම යන්නෙහි අර්ථය පුනරුත්ථාපනය යි. එය එසේ නොවන්නේ නම්, එය දඬුවමක් නොවේ. මෑතක දී ගාල්ල ප්‍රදේශයෙන් වාර්තා වූ අවාසනාවන්ත සිදුවීම එයට කදිම නිදසුනකි. තම පියාට ඇතිවන හදිසි කෝපය මත කොසු මිටෙන් ගහන ලද පහර හිසට වැදීම නිසා තරුණ දරුවකු මරණයට පත්විය. එමෙන් ම දරුවකුට ජංගම දුරකතනය නොදීම මත ඇති වූ හදිසි කෝපය මත සිය දිවි හානි කර ගැනීමට පෙළඹීම මෑත කාලයේ දී අසන්නට ලැබුණ තවත් එක් සෝචනීය සිදුවීමකි.

දරුවන් නැණවතුන් කරනවා හා සමාන ව ගුණවතුන් බවට පත්කිරීමට මව්පියන් වෙහෙස විය යුතු ය. ඉවසීම, සිහිය, දරාගැනීම කුඩා වයසේ සිට හුරු කරවීමට කටයුතු කළ යුතු ම ය. එය එක් දවසකින්, පැයකින් කළ නොහැක. ඒ සඳහා ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු වන ආකාරයට කටයුතු සංවිධානය කළ යුතු ය. දරුවන් යන්ත්‍ර සූත්‍ර සේ නොසලකා ක්‍රියා කිරීම මෙහි දී ඉතා වැදගත් ය. පරිහරණය කළ යුතු දේට ආදරය කොට, ආදරය කළ යුතු දෑ පරිහරණය කිරීම වර්තමානයේ ඇති ප්‍රබලතම ගැටලුවයි. දරුවන් ගේ කායික මානසික වර්ධනයට එය අහිතකර ලෙස බලපෑම් කළ හැකි ය. ළමා මනස ඉතාම සියුම් ව තේරුම් ගත යුතු ය. පෙර පාසල් දරුවකු ගේ සමරු සටහනක අතීතයේ මෙවැනි සටහනක් විය.

> **ඕනෑවට වඩා මට ආදරය කරන්න එපා. මා ඉල්ලන හැම දෙයක් ම මට නොලැබිය යුතු බව මම පැහැදිලිව ම දන්නවා. බොහෝ විට ඉල්ලන දේ ලැබෙනතුරු මම අඬ අඬා ඉන්නේ ඔයාලා ඊට දක්වන ආකල්පය කොයිවගේ එකක් ද කියලා දැන ගන්න විතරයි.**

"ඕනෑවට වඩා මට ආදරය කරන්න එපා. මා ඉල්ලන හැම දෙයක් ම මට නොලැබිය යුතු බව මම පැහැදිලිව ම දන්නවා. බොහෝ විට ඉල්ලන දේ ලැබෙනතුරු මම අඬ අඬා ඉන්නේ ඔයාලා ඊට දක්වන ආකල්පය කොයිවගේ එකක් ද කියලා දැන ගන්න විතරයි. හැමෝ ම ඉන්න කොට මගේ වරද පෙන්වලා නිවැරැදි කරන්න එපා. ඒ වෙලාවේ ඔයාල එහෙම කළොත් මට හරි ලජ්ජයි. මට කෙළවරක් නැතිව දෙඩවන්න එපා.

මට හිස් පොරොන්දු දෙන්න එපා. මට පොරොන්දු දෙන්න ඉස්සෙල්ල හොඳට හිතල බලන්න. එසේ නොමැති වුවහොත් ඔයාලා දෙන හැම පොරොන්දුවක් ම වැඩක් නැති දෙයක් ලෙස මම සලකනවා. මම හැමවිට ම අවශ්‍ය ළමයෙක් කියලා අපේක්ෂා කරන්න එපා. බය නිසා මම නිතර බොරු කියන බව හිතන්න. මම ඔයාලා ගෙන් ප්‍රශ්න අහනකොට ඊට නො ඉවසිල්ලෙන් හො නොසැලකිල්ලෙන් උත්තර දෙන්න එපා. මට ඒ විදියේ උත්තර දුන්නොත් පස්සේ මම ආයේ ඔයාල ගෙන් ප්‍රශ්න අහන එකක් නැහැ. ඔයාලා හැමවිට ම නිවැරැදි කියලත්, ඔයාලාට හැමවිට ම වරදින්නේ නෑ කියලත් මට අඟවන්න එපා. ඒ නිසා සැබෑ හොඳ මව්පියන් හැටියට මාත් එක්ක මේ කාලය සතුටින් ගත කරන්න. දරුවන් ගේ මානසිකත්වය කෙබඳු ද යන්න මෙයින් පැහැදිලි ය.

දරුවන් පිළිබඳ මව්පියන් පමණක් නොව, රටක් සමාජයත් ලෙස වගකීමෙන් කටයුතු කිරීම ඉතා අවශ්‍ය ය. එක් දිනක් පමණක් වැයකොට දරුවන් ගැන කතා කිරීම ප්‍රමාණවත් නොවේ. ඇතැම් දරුවන්ට, හව්හරණක් නොමැති ව ඉතා අසරණ භාවයට පත් වූ අවස්ථාවන් අනන්තවත් පසුගිය කාලය තුළ අහන්න ලැබුණි. ඒ අතර ළමා මෙහෙකාර සේවය ප්‍රධාන ය. දහම තුළ පංච දුශ්චරිත වෙළඳාම් අතර, එය වහල් වෙළඳාමට සමාන ය.

සරු නිසරු දේ අවබෝධ කොටදීම සහ දරුවන් පවෙන් ඈත් කිරීමට මව්පියන් ලෙස කටයුතු කිරීම අවශ්‍යය .එමෙන් ම තමා උපමා කොට ගෙන කටයුතු කිරීමට දරුවා පෙළඹවීම අවශ්‍යය. ගැරඬියන් පෙලූ ළමයි උදෙසා බුදුරදුන් ලබා දුන් අවවාදය මෙහි දී සිහිපත් කර ගැනීම ඉතා අවශ්‍යය. එමෙන් ම තම සංස්කෘතිය දරුවන්ට පවරාදීම ඉතා අවශ්‍යය. මේ තුළ දරුවන් කායික මානසික ප්‍රබෝධයෙන් යුතු ව සමාජයට මුහුණ දෙයි. අප සියල්ලන්ගේ ම පැතුම විය යුත්තේ ද එය ම ය.



කොළඹ මහානාම විද්‍යාලයේ
ආචාර්ය
කොලොන්නාව
පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

බිනර අමාවක 2021.10.06

## සිත හඳුනාගැනීම

ජීවිතය පුදුමාකාර ය. කෙනෙක් සාර්ථක ය. තවත් කෙනෙක් අසාර්ථක ය. කෙනෙක් ආර්ථික ව සාර්ථක වුවත් පවුල් ජීවිතය ගිනි ගොඩක් ය. පවුල් ජීවිතය සාමකාමී ඇතැම් කෙනකුට ආර්ථික ම ය අඩුපාඩුකම් ය. සමාජ ගැටලු ඇති වන්නේ මේ විවිධාකාර වූ අසාර්ථකකම්වල පලයක් ලෙසට ය. ප්‍රශ්න, ගැටලු හමුවේ කවුරු, කෙසේ, කාට ඇඟිල්ල දිගු කළ ද වරද තමන්ගේ ම ය. දුක හෝ සතුට, සැප හෝ දුක, සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය හෝ තීරණය කරන්නේ අනුන් කරන කියන දෙයින් නොව තමන් කරන කියන දෙයින් ය. තමන් කරන කියන දෙය තීරණය කරන්නේ තමන්ගේ ම සිත ය.

එසේ නම් මේ සා ප්‍රශ්න සිත හඳුනා නොගැනීම නිසා ය. අප තථාගතයන් වහන්සේ ධම්මපදයේ යමක වග්ගයේ දී සිතෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ කළ හැඳින්වීම සිත හඳුනා ගන්නට ඇති පහසු ම අවස්ථාවකි. ඒ අනුව, සියලු අදහස්වලට ප්‍රධාන වන්නේ සිත ය. අයහපත් සිතින් කියන, කරන දෙයින් ඇති වන නරක ප්‍රතිපල ගොනු පසුපස එන රියසක ලෙසින් ඒ පුද්ගලයා පසුපස එන්නේ ය. වේදනා ගෙන දෙන්නේ ය.

එමෙන් ම, යම් කෙනෙක් යහපත් අදහසින් කරන, කියන දෙයෙහි යහපත් පල සෑම විට ම තමාගෙන් ඉවත් ව නොයන්නේ ය. තමන්ගේ ම සෙවණැල්ල ලෙසිනි. කරන කියන සෑම කටයුත්තක් ම සාර්ථක වන්නේ එවැනි පුද්ගලයන්ගේ ය.

සිත ගැන හොඳ අවධානයකින් සිටිය යුතු මේ නිසා ය.

සිත අනාරක්ෂිත වන්නේ, අපිරිසුදු වන්නේ ලෝභය, ද්වේෂය, මෝහය, ආදී අකුසල සිතිවිලි නිසා ය. යම් දෙයක් කියන්නට, කරන්නට පෙර තමන්ගේ සිත තුළ ඒ මොහොතේ පවතින සිතිවිලි ගැන සිතන්නට හැකි නම්, අයහපතින් වළකින්නට හැකි වනු ඇත. එමෙන් ම අයහපතට මුල් වන අකුසල සිතිවිලි ප්‍රහාණය කරන්නට ද උත්සාහවත් විය යුතු වේ. ලෝභය නැති කිරීම, මෙත්සිත දියුණු කිරීම, සත්‍යය සත්‍ය ලෙස දැකීම සුවපත් සිතක දැකිය හැකි ලක්ෂණ අතර වේ. සිත පිරිසුදු වන්නේ එබඳු යහපත් සිතිවිලි සිතෙහි පහළවීමෙනි. එමෙන් ම එබඳු සිතිවිලි ක්‍රියාවට නැඟෙන්නේ ද යහපත් ලෙසිනි. සංවරය, හික්මීම සිතෙහි පහළවන යහපත් ගති නිසා ම ඇතිවන්නකි. සංවරය, හික්මීම ඇති පුද්ගලයෙක් තමන්ට හෝ ,අනුන්ට හෝ අවැඩදායී ලෙස හැසිරෙන්නේ නැත.

අපගේ සිත නිරන්තරයෙන් තනිව හැසිරේ. එහිදී විවිධ විෂම ගති සිතෙහි පහළ වේ. නොසන්සුන්බව, තරහව, වෛරය, ක්‍රෝධය, නොඉවසීම ආදිය පහළ වී නරක නපුරු ගති වර්ධනය වේ.

ඒවා දුරුකර සිතෙහි එකඟ බව, සංවරය උදාකර ගැනීමට ක්‍රියා කිරීම භාවනාවකි. සසරින් සසරට ගෙන එන අයහපත් පුරුදු මඟ හැරීම එක්වර ම සිදු කිරීම අපහසු විය හැකි ය. ශ්‍රී සද්ධර්මය ඒ සඳහා අපට මඟ පෙන්වයි. ඒ මඟ යන්නට නොපසුබස්නා උත්සාහය ඇවැසි ය. ජීවිතයේ සාර්ථකත්වය ද, අසාර්ථකත්වය ද තීරණය වන්නේ ඒ උත්සාහයේ තරමට ය.

# පින් පිරෙන පින්කම්



**සම්බුදු දහමෙහි පූජා විධි දෙකක් පිළිබඳ ව උගන්වයි. ඒ අමිස පූජා සහ ප්‍රතිපත්ති පූජා ලෙස ය. මේ අතරින් ආමිස පූජාව යනු කුමක්ද? ආමිස පූජාවෙන් අපේ ජීවිතයට ලැබෙන පිහිට, පිළිසරණ කෙබඳු ද කියා මෙම ලිපියෙන් විස්තර කෙරේ.**

ආමිස පූජා ලෙස හඳුන්වා දී ඇත්තේ බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සංකේත වන බුද්ධ ප්‍රතිමා වහන්සේ, ස්ථූප, බෝධීන් වහන්සේ ආදී පූජනීය ස්ථානයන්ට පුද පූජා පවත්වා ගෞරවයෙන් වන්දනා කිරීම යි. අපේ රටේ බොහෝ විට පෙරහර පැවැත්වීම, මල් පූජා, අධිෂ්ඨාන පූජා, පහන් පූජා, බෝධි පූජා, දන් දීම ආදියත් ආමිස පූජා ලෙස සැළකිය හැකි ය.

ආමිස පූජාවට අයත් ඉතාම ජනප්‍රිය මෙන් ම බොහෝ දෙනා සිදුකිරීමට කැමැති පූජාවක් වන්නේ බෝධි පූජාව යි. භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කාලයේ සිට මේ දක්වා ම බෞද්ධ ජනතාව උන්වහන්සේගේ චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමට උපකාරී වූ, සෙවණ සැලසූ ඇසතු වෘක්ෂයට බෝධීන් වහන්සේ සේ සලකා පුදපූජා පවත්වති. රහතන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පරිදි තිසරණ සරණ ගිය ධර්මාශෝක රජතුමා දඹදිව බෝධි වන්දනා කළ ආකාරය ඉතාමත් පැහැදිලි ව අදටත් සටහන්ව තිබේ.

මේ කල්ප සියය ඇතුළත ලොව පහළ වී වදාළ විපස්සී, සිඛී, වෙස්සබූ, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම යන සත්බුදු රජාණන් වහන්සේලාට බුද්ධත්වය ලබා ගැනීමට උපකාරී වූ ඒ බෝධීන් වහන්සේලා වන්දනා කිරීම ඈත අතීතයේ පටන් ම සිදු වූ පින්කමක්. බුද්ධ ප්‍රතිමා නිර්මාණ නො තිබූ කාලයේ පවා බුදුරජාණන් වහන්සේ වන්දනාමාන කිරීමට බුද්ධ සංකේතයක් ලෙස බෝධීන් වහන්සේට පුද පූජා පවත්වා තිබේ.

බෝධිය බෞද්ධ සංකේතයක් වුව ද, වර්තාමන ශ්‍රී ලාංකික බෞද්ධයන් බෝධීන් වහන්සේට අගෞරව කරන අවස්ථා ද තිබේ ශනි, කේතු, බ්‍රහස්පති, සෙනසුරු ආදි ග්‍රහ අපල තිබෙනවා යැයි මිථ්‍යා දෘෂ්ටියට එළඹී එහි බැසගෙන, කපුටන්, නාගයන් ආදි සතුන්ගේ සිතුවම් ඇඳ රාහු, අපල, ශනිගේ අපල, කේතුගේ අපල, සෙනසුරුගේ අපල දුරුවේවා! කියන කොඩිවැල් බෝධීන් වහන්සේගේ අතුවල එල්ලති. එය බෝධීන් වහන්සේට කරන විශාල අගෞරවයකි. ඒ වගේම තවත් පිරිසක් අසවලාගේ අපල දුරුවේවා! අසවලා නිරෝගී වේවා! අසවලාට රැකියාවක් ලැබේවා! කියමින් ලියා බෝධීන් වහන්සේගේ අතුවල එල්ලා සරණක් බලාපොරොත්තු වේ. එවැනි අඥාන ක්‍රම මඟින් සාර්ථක බෝධි පූජාවක් කළ නොහැකි ය.

අප විහාරස්ථානයකට වන්දනා කිරීමට ගිය පසු මුලින් ම විහාරස්ථානයේ වතාවත් කිරීමට හුරු විය යුතු ය. බෝ මළුව, විහාර ගෙය, විහාරයේ අවට ස්ථානය හොඳින් පිරිසුදු කළ යුතු ය. බෝධීන් වහන්සේ වටා ඇති පර වූ මල් ඉවත් කර මල් ආසන පිරිසුදු කිරීම විශේෂ පිනක් රැස්වෙන දෙයකි. ඒ වගේම පහන් වැටි, හඳුන්කූරු තැටි ආදිය පිරිසුදු කිරීමත් කළ යුතු යි. මේවා පිරිසුදු කිරීමේ දී තම සිතේ තිබෙන ලෝභ, ද්වේෂ, මෝහ දුරුවේවා! මේ කොළ රොඩු අතු ගෑවී යන්නා සේ සිතේ තිබෙන අකුසල් දුරුවේවා! ආදි ලෙස සිතමින් බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහි කිරීමෙන් එය සිදුකරනවා නම් එයින් තමාට ද පින් රැස් වේ.

ඉන්පසු තෙරුවන් සරණ ගොස් සිල්පද සමාදන් වී බොහෝම ශ්‍රද්ධාවෙන් බෝධීන් වහන්සේට පූජා පැවැත්වීම එහිදී බුදුගුණ, දහම් ගුණ, සඟ ගුණ අර්ථ සහිත ව මෙනෙහි කර දම්සක් පැවැතුම් සූත්‍රය, රතන සූත්‍රය, ධජග්ග සූත්‍රය, මෝර පිරිත ආදී සූත්‍රයක් සජ්ඣායනා කොට තමා රැස්කර ගත් සියලු පින් දෙවියන්ට අනුමෝදන් කර මෛත්‍රී භාවනාව හෝ බුදුගුණ භාවනාව හෝ කළ හැකි නම් ඒ බෝධි පූජාව සම්පූර්ණ වී තමාට අප්‍රමාණ පිනක් රැස්වෙයි. එසේ කිරීම තුළින් තමා බලාපොරොත්තු වන දෙයක් වේ නම් ඒ කරා සෙමින් ළඟාවිය හැකි ය. එහෙත් මිථ්‍යා මතවල එල්ලී කරන බෝධි පූජාවෙන් නම් තමා බලාපොරොත්තු වන දේ ලැබිය හැකි යැයි සිතීම අපහසු ය.

එලෙස ම ආමිස පූජාවේ තවත් විශේෂ පින්කමක් වන්නේ ගිලානෝපස්ථානය යි. එහිදී භාග්‍යවතුන් වහන්සේ වදාළා "යමෙක් ගිලනුන්ට උපස්ථාන කරයි නම් ඔහු මට උපස්ථාන කරන්නේ" ය. කියා. බොහෝ විට අප බුදුරජාණන් වහන්සේට උපස්ථාන කිරීමට කැමැති වුවත් ගිලනුන්ට උපස්ථාන කිරීමට මැලි වේ. එයට හේතුව එවැනි පිනක ඇති වටිනාකම ගැන ඇති අනවබෝධය යි. භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළේ කුඩා සතකුගේ පවා ජීවතය රැක ගැනීමට උදව් කිරීම බොහෝ ආත්ම ගණනකට ආනිසංස ගෙන දෙන පින්කමක් බවය.

එලෙස ම මව්පිය උපස්ථානය, වැඩිහිටියන්ට ගෞරව කිරීම, මංමාවත් ඉදිකිරීම, ළිං පොකුණු තැනීම, අසරණයන්ට පිහිට වීම ආදී සියලු සුබසාධක කටයුතු ආමිස පූජාවට අයත් වේ. කෙනෙක් නිරන්තරයෙන් සිල්පද රකිනවා නම් ඔහු නිරන්තරයෙන් ලෝකයට සාමය දන් දෙයි. එනිසා ආමිස පූජාව ශ්‍රද්ධාවෙන්, අවබෝධයෙන් සිදු කරනවා නම් ඔහුට හෝ ඇයට මෙලොව මෙන් ම පරලොව ද යහපත උදාවෙයි.

> **බෝ මළුව, විහාර ගෙය, විහාරයේ අවට ස්ථානය හොඳින් පිරිසුදු කළ යුතු ය. බෝධීන් වහන්සේ වටා ඇති පර වූ මල් ඉවත් කර මල් ආසන පිරිසුදු කිරීම විශේෂ පිනක් රැස්වෙන දෙයකි. ඒ වගේම පහන් වැටි, හඳුන්කූරු තැටි ආදිය පිරිසුදු කිරීමත් කළ යුතු යි.**

**නයනා නිල්මිණී**

# කය එක තැනක සිත තව තැනක මෙහෙම වන්නේ ඇයි?

**මොන ලෝකෙ ද ඉන්නේ? පන්ති කාමරයේ දී ගුරුවරයා විසින් දරුවන්ට මෙලෙස කියනු ලබන අවස්ථා මොන තරම් ද? ඔබ රැකියාව කරන කාර්යාලයේ දී හෝ යම් සේවා ස්ථානයක දී එකට සිටින අය කී වතාවක් ඔබ ගෙන් එසේ අසා තිබේ ද? එලෙස ම ඔබත් අන් අයගෙන් ඒ ආකාරයෙන් ම අසා තිබෙනවා නේද? නිවෙසේ දී නම් "ඔය කරන වැඩත් නතර කරගෙන මේ තරම් කල්පනා කරන්නේ මොනවාදැ"යි ස්වාමියා බිරිඳගෙන් ද , බිරිඳ ස්වාමියාගෙන් ද, අම්මා , තාත්තා දරුවන්ගෙන් ද මොන තරම් අසනවා ද?**

යම් අවස්ථාවක කෙනෙක් කල්පනා කරන්නේ අතීතය ගැන ය. නැති නම් අනාගතය ගැනය. ශාරීරික ව මේ මොහොතේ එක් තැනක සිටියත් සිතින් වෙනත් තැනක ය. අතීතය , අනාගතය පිළිබඳ ව සිතීම වරදක් නොවේ. එහෙත් ජීවත්වන මේ මොහොතෙන් හෝ, වර්තමානයෙන් ඉවත් ව අතීතය හෝ අනාගතය ගැන සිතීමට යෑමෙන් වර්තමානය අවුල් වීමට තිබෙන ඉඩකඩ වැඩි ය.

මේ මොහොතෙහි ජීවත් වෙමින් අතීතයෙන් පාඩම් ඉගෙන, අනාගතය පිළිබඳ සැලසුම් කිරීමේ වරදක් නැත. එහෙත් ජීවත්වන මේ මොහොත අමතක වූ විටෙක ඔබේ ම වචන සහ ක්‍රියාවන්, ඔබට මෙන් ම ඔබ අවට සිටින අන් අයට ද පීඩාකාරී බවක් ගෙන දේ නම්, මේ මොහොතේ ඔබ කළ යුතු දේ නිසි ආකාරයට කර ගැනීමට බැරි වුවහොත් ඊළඟට එළැඹෙන මොහොත අවුල් හෝ නොසන්සුන් විය හැකි බව නම් පැහැදිලි ය. නිවෙසක් ඉදිකිරීමේ දී තබන සෑම ගඩොලක් ම නිසි පිළිවෙළට, ශක්තිමත් ව තිබිය යුතු ය. එසේ නොවූයේ නම්, බිත්තියෙහි ශක්තිය පිළිබඳ අවදානමක් ඇතිවේ. එලෙසම මේ මොහොත ශක්තිමත් නොවන්නේ නම්, ඊළඟ මොහොත අවධානම් වේ. පාසල් යන දරුවෙක් සරල ම උදාහරණයක් ලෙස ගනිමු. කල්පනාකාරී නොවීමෙන් මේ දරුවා පාසලට ගෙන යා යුතු පොතක් අමතක කිරීමෙන් ඇතිවන තත්වය කුමක් ද? පන්ති කාමරයේ නොසන්සුන් පරිසරයක් ගොඩනැඟීම ය. රැකියාවක් කරන අයෙක් නම්, ලිපි ලේඛන හෝ යතුරු අමතක වීමෙන් ගැටලුකාරී තත්වයන් මතුවිය හැකි ය. ඒ වගේ ම නිවසේ දී ඒ මොහොතෙහි ජීවත් ව නොසිට, වෙනත් දේ ගැන සිතමින් කටයුතු කිරීම හේතුවෙන් විවිධ කරදරවල පැටලිය හැකි ය. උඳුනට අත පිළිස්සිය හැකි ය. කෝප්පය, පිඟාන, බිමට වැටී බිඳිය හැකි ය. එපමණක් ද නොවේ. අත පය දෙරේ, උළුවස්සේ, මේස පුටුවල කොපමණ නම් ගැටේ ද? එවන් විටෙක එසේ වීමෙන් ඇති වූ වේදනා විඳීම් අමතක ද නොවිය හැකි ය. මේ මොහොතෙහි ජීවත් නොවී ඔබ ම කියන ආකාරයට අමතක වීමෙන් හැඳුනුම්පත නැතිව විභාගයකට ගියහොත් ඔබට කොපමණ නම් කරදරයකට මුහුණ පෑමට සිදුවෙනු ඇති ද?

නොගැළපෙන හා වැරැදි සිතිවිලි ක්‍රියාත්මක වීමෙන් මවු පදවිය, පිය පදවිය, ස්වාමි පුත්‍රයෙක්, ස්වාමි දියණියක බව පමණක් නොව මනුස්සකමත් අමතක විය හැකි ය. යහපත් සිහි නුවණ පහළ වන විට ඔබ වෙනත් දෙයක් කිව හැකි ය. "මම දන්නේ නැහැ, මට මොනවා වෙලා ද කියා. මම ඒ වෙලාවේ ඒ විදිහට කතා කළේ, හැසිරුණේ ඇයි"? දැන් මට ලජ්ජයි වශයෙනි. බුදු දහමට අනුව මේ සියලු අසහනකාරී, පීඩාකාරී, දුක් ගෙන දෙන හේතුවලට ප්‍රධාන වන්නේ නම් ඒ මොහොතේ ජීවත් නොවීමයි. "මේ මොහොතෙහි ජීවත් නොවීම" දහමෙහි අර්ථ ගැන්වෙන්නේ 'සතිය' යනුවෙනි. 'සතිය' තව ටිකක් විමසන්නේ නම් ඒ මොහොතෙහි මනා සිහි නුවණින් යුතුවීම (යෝනිසෝමනසිකාරය) සිහි නුවණින් විමසා බලමින් කටයුතු කිරීම (සම්පජඤ්ඤ) නැවත නැවත විමසා බලමින් කටයුතු කිරීම (අනුපස්සනා) පරික්ෂාකාරී ව හා මැනවින් දැන කටයුතු කිරීම (සම්පජානකාරී) ආදී වශයෙන් කරුණු රැසකින් පැහැදිලි වේ.

## පෝය ලබන සහ ගෙවෙන අයුරු

| බිනර අමාවක | වප් පුර අටවක |
|---|---|
| ඔක්තෝබර් 05 වැනි අඟහරුවාදා අපර භාග 19.04 අමාවක ලබා 06 වැනි බදාදා අපර භාග 16.35 ගෙවේ. බදාදා සිල් | ඔක්තෝබර් 12 අඟහරුවාදා අපර භාග 21.47 පුර අටවක ලබා 13 බදාදා අපර භාග 20.08 ගෙවේ. බදාදා සිල් |

ඔබගේ එදිනෙදා ජීවිතය ඉතා ම කාර්ය බහුල වී ඇති බව සැබෑවකි. ඒ නිසා ඔබ මනසින් අතීතයට, වර්තමානයට මෙන් ම අනාගතයට ද වශයෙන් එහා මෙහා ගමන් කරමින් එක් අවස්ථාවක දී කටයුතු කීපයක් කරමින් හෝ කරන්නට උත්සාහ කරමින් නොසන්සුන් මනසකින් වෙහෙසකාරී හා කලබලකාරී ව ජීවත්වන බව ද පෙනේ. මේ ජීවන ගමනේ මෙවන් වූ වෙහෙසකාරී බව හේතුවෙන් කේන්තිය, නොරුස්නාගතිය මෙන් ම අමනාපය ඇති වේ. එයින් පළ මුව තම පවුල තුළ ම අඬදබර ඇතිව පවුල් පරිසරයෙහි සාමකාමී බව නැතිව යයි. කාර්යබහුල පරිසරයක වුව ඒ මොහොතහි කරන කාර්යය කෙරෙහි පමණක් ම සිත යොමු කර ගෙන සන්සුන් ව කටයුතු කරන්නේ කෙසේ ද? සතිය පුරුදු කිරීමෙනි.

'සතිය' පුරුදු කිරීම හිමිදිරියේ තම නිවෙසින් ම ආරම්භ කළ හැකි ය. අප දත් මදින, මුහුණ සෝදන, හිස පීරන ආදී සෑම අවස්ථාවක් ම සිහි නුවණින් කිරීමට පුරුදු විය යුතු ය. එවිට මනස නිරවුල් වේ. නිරවුල් මනසින් සිදු කරන සෑම දෙයක් ම නිරවුල් ව හා පිළිවෙළට කිරීමට ලැබෙන බව හොඳට ම විශ්වාස ය.

> **මම දන්නේ නැහැ, මට මොනවා වෙලා ද කියා. මම ඒ වෙලාවේ ඒ විදිහට කතා කළේ, හැසිරුණේ ඇයි"? දැන් මට ලජ්ජයි වශයෙනි. බුදු දහමට අනුව මේ සියලු අසහනකාරී, පීඩාකාරී, දුක් ගෙන දෙන හේතුවලට ප්‍රධාන වන්නේ නම් "ඒ මොහොතේ ජීවත් නොවීමයි.**

නවීන තාක්ෂණයට අනුව පරිගණකය පරිහරණය කරන ආකාරය විමසා බලමු. එක විට වැඩ සටහන් කීපයක් කිරීමට උත්සාහ කළ හොත් බොහෝ අවස්ථාවක සියල්ල අවුල් වී හෝ මැකී යන්නට හැකි ය. ඒ නිසා ඒ මොහොතෙහි කරන කාර්යය පිළිබඳ ව සිත යොමු කර ගන්නා විටක, සිහි නුවණින් යුතුව විමසා බලා ක්‍රියා කිරීමට අවස්ථාව ඇති වේ. එසේ නොමැති වුවහොත් 'මගේ ඔළුව අවුල් වෙලා" කිසි දෙයක් හරියට කර ගන්න බැහැ' යන්නෙන් ඔබ ඔබට ම කියන්නට පුළුවනි.

පරිසරයත්, සිතත්, කලබලකාරී නම් තත්පර කිහිපයකට සියලු වැඩ කටයුතු නතර කර දීර්ඝ හුස්මක් ගන්න.

ක්‍රමයෙන් එය පහළට හෙළන්න. සිහිය පිහිටුවාගෙන ආශ්වාස, ප්‍රාශ්වාස කිරීම අත්‍යවශ්‍ය ය. ඒ ආකාරයෙන් සිත සන්සුන් වූ පසු කළ යුතු වැඩ එකින් එක ක්‍රමයෙන් සිදු කළ යුතු ය. ඒ මොහොතෙහි ජීවත් වෙමින් වැඩ කටයුතු කරන්නට පුහුණුවන ක්‍රමය මහා සතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් වේ. "ගමන් කිරීමේ දී ද, හිටගෙන ඉන්නා විට ද, හිඳ සිටින විට ද, නිදන විට ද, නො නිදා සිටිමෙහි ද, කතා කිරීමේ දී ද, නිශ්ශබ්ද ව සිටින විට පවා මැනවින් දැන සිදු කරන්න යන්න යි.

මෙයින් අදහස් වන්නේ කය පවත්වා ගැනීමේ මනා සිහි නුවණින් යුතුව ඒ ඒ කාර්යයෙහි නිරතවිය යුතු බව ය. ඒ වගේ ම ඒ මොහොතෙහි ජීවත් වෙමින් සිහි නුවණින් යුතුව සිටින විට සිතට දැනෙන සිතිවිලි ද මැනවින් හඳුනා ගැනීමේ අවස්ථාව ලැබේ.


අකුසල සිතිවිලි ඉවත් කර කුසල සිතිවිලි ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදාවේ. සිහි නුවණින් යුතු ව නො සිටින්නේ නම්, හොඳ නරක තේරුම් ගත නොහැකි ව බොහෝ විට නරකට ම මේ සිත ඇදී යයි.

අපි තරහව ගැන සිතා බලමු. සිත මෙන් ම සිතිවිලි පිළිබඳ ව දැන ගනිමින් සිහි නුවණින් යුතුව සිටින්නට පුරුදු වන්නේ නම්, අකැමැති අරමුණක් සිතින් ගන්නා විට අමනාපය, නුරුස්නා බව හා තරහව ඇතිවන්නට එය හේතුවක් විය හැකි බව දැන ගනී. ඒ බව දැනගත්විට තරහවේ නරක විපාක දැන, තරහ ගැනීමෙන් වැළකී සිටින්නට අවස්ථාව ලැබේ. ඒ මොහොතෙහි සිහි නුවණින් නොසිටියහොත් අකමැති අරමුණ සිතට ගැටෙන විට ම තරහ සිතිවිලි හට ගනී. බොහෝ දෙනා කියන්නේ "මම තරහයි', 'මට තරහ ගියා' හෝ 'මට තරහ ආවා' යනුවෙනි. මෙහි අදහස නම්, ඔවුන් දන්නේ තරහ සිතට ආවාට පසුව බව නේද? එසේ නොමැති ව තව මිනිත්තුවකින් මම තරහ ගන්නවා යැයි කිසිවෙක් නො කියති.

මෙලෙසින් සිත ගැන අවදියෙන් සිටීමෙන් බොහෝ මානසික පීඩාකාරී සිතිවිලිවලින් එනම් ලෝභ, දෝස, මෝහයෙන් වැළකී සිටීමටත්, ඒවා ක්‍රියාත්මක නොකිරීමටත් හැකියාව ලැබේ. ඔබ ගන්නා ආහාර වේල කුමක් වුව ද එය සතුටින් කෑමට ගැනීම සඳහා ඒ මොහොතෙහි ජීවත්විය යුතු ය.

දීපා පෙරේරා

# අඩසියවසක් උත්තම සධාතුක කරඬුව වැඩමකර වූ
# දළදා මාළිගාවේ බෝසත් රාජා



අවසන් වතාවට දවල් පෙරහරේ ගොස් දළදා කරඬුව රැගෙන ආදහන මලුවේ සිට දළදා මාළිගාවට පැමිණීම 1987

**මහනුවර ඇසළ පෙරහර ශ්‍රී ලාංකේය සංස්කෘතියේ අපූර්වත්වය ලොවට කියාපාන සංස්කෘතික දැක්මක් ලෙස හැඳින්වීම නිවැරැදි ය. දළදා පෙරහර පැවැත්වීම උත්තම පූජාවක් ලෙස බෞද්ධයෝ පිළිගනිති.**

දළදා සම්ප්‍රදායන්ට අනුකූල ව වාර්ෂික ව ඇසළ මාසයේ එළඹෙන නැකැත් අනුව සිදුකරන හෙයින් "ඇසළ පෙරහර" ලෙස ද එය ප්‍රකට ය. මහනුවර ඇසළ පෙරහර මංගල්‍යය හා අලි ඇතුන් අතර ඇත්තේ නොබිඳිය හැකි සම්බන්ධයකි. ඉතා මනරම් ලෙස සරසන ලද අලි ඇතුන් වැඩිම ප්‍රමාණයක් සහභාගි වන පෙරහර ලෙස දළදා පෙරහර හැඳින්වීම වටී. අලි ඇතුන් හිමිකරුවන් දළදා පෙරහරට අලි ඇතුන් එකතු කරන්නේ එය මහත්ඵල උදාවන පිනක් ලෙස සලකමිනි. එහිදී දළදා පෙරහරේ අති පූජනීය වස්තුව ලෙස සලකන සධාතුක කරඬුව වැඩම කරවීමේ භාග්‍ය හිමි වන්නේ මංගල ලක්ෂණ සහිත හස්තියකුට පමණි. එම වාසනා ගුණය සැපිරීම හේතුවෙන් අඛණ්ඩ ව අඩසියවසක් උත්තම සධාතුක කරඬුව වැඩමකරවීමේ භාරදූර කාර්යය ඉටුකළ දළදා මාළිගාවේ රාජා ඇතා මියගොස් වසර 33ක් සැපිරේ. බෞද්ධ ජන සමාජයේ සදා අමරණීය රාජා ඇතු සත්ව ලෝකයේ අමරණීය වන්නේ ජාතික වස්තුවක් ලෙස නම් කෙරුණු ලොව පළමු හීලෑ ඇතා රාජා ඇතු බැවිනි. එපමණක් නොව මියගිය පසු සිරුර සංරක්ෂණය කර කෞතුක වස්තුවක් ලෙස ප්‍රදර්ශනයට තැබූ මෙරට පළමු හස්තියා සේ ම ලොව දෙවන හස්තියා වන්නේ ද රාජා ඇතු ය.

ඓතිහාසික කන්ද උඩරට ඇසළ පෙරහරේ සධාතුක කරඬුව වැඩම කරවීමේ අවස්ථාව හිමි වූයේ මංගල හස්තියකුට පමණි. මංගල හස්ති රාජයකුට භූමි ස්පර්ශ ස්ථාන හතක් හෙවත් හත්පොළ වැඳුම් පිහිටා තිබීම අනිවාර්ය වේ. එම ස්ථාන වන්නේ සතර පා, ඇත් හොඬය, ලිංගය හා වලිගය යි. ඊට අමතරව මඟුල් ඇතකු සතුව තවත් ගුණාංග රාශියක් පැවතිය යුතු වේ. ඒවා නම් පුළුල් පිට, පුළුල් කුඹුතල, උදාර ලීලාව, තේජාන්විත දළ යුවල හා මනා කීකරුකම ය. සධාතුක කරඬුව වැඩම කරවීමේ සුදුසුකම් ලත් මංගල ඇතු තෝරාගැනීමේ දී දළදා මාළිගාවේ ගජනායක නිලමේ, කාරියකෝරාල සහ ඇතුන් පිළිබඳ ව කටයුතු කරන සියලු දෙනා සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹීම සම්ප්‍රදාය යි. එම සියලු සුදුසුකම් සපිරූ සුවිශේෂී හස්තියකු ලෙස රාජා ඇතු කැපී පෙනේ.

රාජා ලෙස ජනාදරයට පත්වූ මෙම ඇත් පැටවා අල්ලාගෙන ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් ප්‍රදේශයේ තිබූ ඝන කැලෑවකිනි. එකල අලි ඇතුන් ඇල්ලූ පුද්ගලයන් මට්ටයන් ලෙස හඳුන්වා ඇති අතර, ඒ අනුව උමේරු ලෙබ්බේ නැමැති පුද්ගලයා ඇලි ඇතුන් ඇල්ලීම සඳහා රජයෙන් ලබා දෙන බලපත්‍ර අංක 1318 යටතේ 1925 වසරේ ජනවාරි මස 5වනදින මෙම ඇත් පැටවා අල්ලාගෙන ඇත. ඒ වනවිට ඇත් පැටවාගේ වයස අවුරුදු 10ක් පමණ වූ අතර උස අඩි 4 අගල් 5කි. මෙම ඇත් පැටවා දුටු මහනුවර ගිරාගම වලව්වේ ටිකිරි බණ්ඩාර මාම්පිටිය දිසාව ඇත් පැටවා අල්ලාගත් ලෙබ්බේවරයාට 1925 වසරේ දෙසැම්බර 11 වනදින රුපියල් 3300ක මුදලක් ගෙවා මිලට ගෙන ඇත. එසේ මිලට ගත් ඇත් පැටවා දෙසැම්බර් 30වනදින මඩකලපු දිසාපති වෙනුවට වැඩ බැලූ නිලධාරියකු වූ විශ්වලිංගම් මහතා විසින් මඩකලපුවේ සිට වාලච්චේනේ, තෝපාවැව, මාතලේ හරහා මහනුවරට ප්‍රවාහනය කිරීමට ලබාදුන් බලපත්‍රය හරහා ප්‍රවාහනය කර තිබේ. මෙසේ මාම්පිටිය දිසාවගේ ගිරාගම වලව්වේ වසර 12ක කාලයක් හැදීවැඩුණු රාජා ඇතා දළදා මාළිගාවට පූජා කිරීමට හෙතෙම අදහස් කර ඇත. ඒ අනුව 1937 ජූලි මස 31 වනදින ඇතු දළදා මාළිගයට භාරදී ඇති අතර, ඒ වනවිට ඇතා වයස අවුරුදු 22ක් හා උස අඩි 8ක් තරම් වූ සද්ධන්තයකු විය. මෙසේ දළදා මාළිගාවේ සේවයට බැඳුණු රාජා ඇතු එම වසරේ දළදා පෙරහරට එකතු කර ගැනීමට එකල දළදා මාළිගාවේ දියවඩන නිලමේවරයා ලෙස කටයුතු කළ ටිකිරි බණ්ඩාර රත්වත්තේ මහතා කටයුතු කර ඇත. එතැන් පටන් 1987 වර්ෂය වන තෙක් අඛණ්ඩ ව අඩසියවසක කාලයක් අති පූජනීය සධාතුක කරඬුව වැඩම කරවීමේ භාග්‍ය හිමිවූයේ රාජා හස්තියාට ය.

මිනිසකුගේවත් ගති පැවතුම්වලින් යුත් රාජා ඇතු සමඟ බැඳි අපූරු පුවත් රාශියක් වේ. 1955 වසරේ මහනුවර ඇසළ පෙරහරේ රන්දෝලි පෙරහර ගමන් කරන අවස්ථාවේ දී සධාතුක කරඬුව වැඩම කරවමින් සිටි රාජා ඇතු එකවරම මහනුවර රැජිණ හෝටලය ඉදිරිපිට දී නැවතී ඇත. රාජාගේ මෙම හැසිරීමත් සමඟ ම පෙරහර ඉදිරියට ගමන් කිරීම අඩාලවී ඇති අතර, කොතරම් උත්සාහ ගත්ත ද රාජා ඇතු ඉදිරියට යාමට මැලිවී ඇත. පසුව එම ස්ථානයට පැමිණි නුගවෙල නිලමේතුමන් ඇත්ගොව්වන් ලවා කරඬුව තැන්පත් කර තිබූ රන්සිවිගෙය පරීක්ෂා කිරීමේ දී පෙනීගොස් ඇත්තේ රන්සිවිගෙය ඇතුගේ පිටට බැඳ තිබූ රැහැන් පටි සියල්ල කැඩී ඇති බව ය. රාජා ඇතු නැවතී ඇත්තේ තව එකදු පියවරක් හෝ ඉදිරියට ගියේ නම් ඉන් සධාතුක කරඬුවට හානියක් වන බැවිනි. 1959 වසරේ ඇසළ පෙරහරේදී මහා අලි කුලප්පුවක් සිදු වූ අතර පෙරහරේ ගමන් ගත් ශිල්පීන් මෙන්ම පෙරහර නැරඹීමට පැමිණි පිරිස් හිස් ලූ ලූ අත දිවයන්නට විය. නමුත් මේ සියල්ල සිදුවෙද්දී සධාතුක කරඬුව පිට මත තබා ගත් රාජා ඇතු කිසිදු කලබලයක් නොමැති ව නිසොල්මනේ සිට ඇත. ඒ සධාතුක කරඬුව කෙරෙහි ඇති අති මහත් ගෞරවය නිසාවෙනි. පාවඩ මතින් කරඬුව වඩමවන රාජා ඇතු පාවඩ එළා නොමැති කිසිදු විටක පියවරක් හෝ ඉදිරියට යාම ප්‍රතික්ෂේප කර ඇත. ඒ වනාහි පෙරහර චාරිත්‍ර පිළිබඳ ව එම ඇතුට තිබූ මහත් ගෞරවය යි.

> තවත් දිනක් හෙතෙම කටුගස්තොට ප්‍රදේශයේ දී මහා මාර්ගයේ දිවයන්නට වූ අතර, මෙයින් තැතිගත් මිනිසුන් පාර පුරා දිවයන්නට විය. මේ අතර මාර්ගයේ සිටි එක් අන්ධ පුද්ගලයකු කිසිවක් කරකියාගත නොහැකි ව මහමඟ සිටිනු දුටු රාජා ඇතු ඔහු වෙත දිව ගොස් තම හොඬයෙන් ඔහු ඔසවා මාර්ගයේ පැත්තකින් තබා ගොස් තිබේ.

ඉතා කීකරු හස්තියකු වූ රාජා දිනක් මහනුවරදී ලොරි රථයකට පහරදී අලහාභානි කර තිබූ අතර, පසුව කළ සොයා බැලීමේ දී අනාවරණය වී ඇත්තේ එය රා ප්‍රවාහනය කළ ලොරියක් බවයි. තවත් දිනක් හෙතෙම කටුගස්තොට ප්‍රදේශයේදී මහා මාර්ගයේ දිවයන්නට වූ අතර, මෙයින් තැතිගත් මිනිසුන් පාර පුරා දිවයන්නට විය. මේ අතර මාර්ගයේ සිටි එක් අන්ධ පුද්ගලයකු කිසිවක් කරකියාගත නොහැකි ව මහමඟ සිටිනු දුටු රාජා ඇතු ඔහු වෙත දිව ගොස් තම හොඬයෙන් ඔහු ඔසවා මාර්ගයේ පැත්තකින් තබා ගොස් තිබේ. එසේම 1986 වසරේදී රාජා ඇතුගේ ඇත් ගොව්වා ඇඩි ලෙස රෝගාතුරවී රෝහල්ගත කර ඇති අතර, එයින් තම වගකීම මනාව වටහාගත් ඇතු තම ඇත් ගොව්වා නොමැති ව තනිව ම සධාතුක කරඬුව වැඩමකරවා ඇත.


1987 වසරේ ජනවාරි මස 1 වැනි දා උත්සව අවස්ථාවක් සඳහා පේරාදෙණිය පාරේ සිට කටුකැලේ දෙසින් දළදා මාළිගයට පැමිණෙමින් සිටි රාජා ඇතු රිය අනතුරකට මුහුණදී තිබේ. එහිදී ඇත්ගොව්වා එම ස්ථානයේ දී ම මියගොස් ඇති අතර, තුවාල ලැබූ රාජා කිසිදු කලබලයක් නොකර කොර ගසමින් ම දළදා මාළිගාවට පැමිණ ඇත. මේ වනාහි රාජා ඇතුගේ ජීවිත කතාවෙන් බිඳක් පමණි.

රාජා ඇතු තම සේවය දියවඩන නිලමේවරු සය දෙනකු යටතේ ලබා දීමට කටයුතු කර ඇති අතර, ඔවුන් වන්නේ ටී.බී.රත්වත්තේ (1937-1947), සී.බී.නුගවෙල (1947-1961), හැරිස් රත්වත්තේ (1961-1964), එච්.බී.උඩුරාවන (1965-1975), නිශ්ශංක විජේරත්න (1975-1985) සහ නිරන්ජන් විජේරත්න (1985-1988) යන නිලමේවරුන් ය. 1987 වසරේ සිදුවූ රිය අනතුරෙන් පසුව රාජා ඇතු දිගින් දිගටම රෝගාතුරවී ඇති අතර, වසර 75ක් ආයු වළඳා 1988 වසරේ ජූලි මස 16වනදින උදෑසන දහයයි දහතුනට දියවඩන නිලමේවරයාගේ නිල නිවසට අයත් භූමියේදී මියගොස් ඇත.

රාජා ඇතු අඩසියවසක් කළ අනුපමේය සේවය හේතුවෙන් 1986 වසරේ අගෝස්තු මස 20 වනදින එවකට ජනාධිපති ව සිටි ජේ.ආර්. ජයවර්ධන මහතා විසින් රාජා ඇතු ජාතික වස්තුවක් ලෙස නම් කරනු ලැබ ඇත. එසේ ම මියගිය ඇතු වියළා සංරක්ෂණය කර 1989 වසරේ දෙසැම්බර් මස 12වනදින දළදා මාළිගාවත් පැරැණි රජ මාළිගයත් අතර ඇති ගොඩනැඟිල්ලක තැන්පත් කර මහජනයා සඳහා විවෘත කර ඇත. එදින ම ශ්‍රී ලංකා මුද්දර කාර්යාංශය විසින් නිවේදන අංක 182 යටතේ රාජා ඇතුගේ රුව ඇතුළත් මිලිමීටර් 29x36 ප්‍රමාණයේ ශත හැත්තෑපහක වටිනාකමින් යුත් මුද්දරයක් නිකුත් කර ඇත. මේ අනුව ජාතික වස්තුවක් ලෙස නම් කෙරුණු ලොව පළමු හීලෑ ඇතාට හිමි ගෞරවය මෙන් ම, මියගිය පසු සංරක්ෂණය කර ප්‍රදර්ශනයට එක්කළ මෙරට පළමු හස්තියා මෙන් ම ලොව දෙවැනි හස්තියාගේ ගෞරවයට ද හිමිකම් පාන්නේ රාජා ඇතු ය. ඒ අඩසියවසක සේවය වෙනුවෙන් කළ උපහාරයක් වැනි ය.



සංරක්ෂණය කර ඇති රාජා ඇතුගේ සිරුර



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ
කේ. උදේනි අරුණසිරි



# රන්කරුවාගේ පාඩම



කොළඹ ආනන්ද විද්‍යාලයේ
විශ්‍රාමික සහකාර විදුහල්පති
සද්ධර්ම කීර්ති ශ්‍රී ත්‍රිපිටකාචාර්ය
**දිවියාගහ යසස්සි නා හිමි**

**අනුපුබ්බේන මේධාවි -
ථොක ථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙව -
නිද්ධමේ මලමත්තනො**

පිරිසුදු රත්තරනින් යම් ආභරණයක් සෑදීමට අවශ්‍ය වූ විට රන් කරුවකුට රත්රන් කෝවෙහි දමා එක් වරකින් පුළුස්සා පිරිසුදු කර ගත නො හැකි ය. ඔහු වාර ගණනක් කෝවෙහි දමා පුළුස්සමින් ඒ රන්වල අනුක්‍රමයෙන්මලකඩ දවා, හැර දමා අන්තිමේ පිරිසුදු කොට ගෙන ම පළඳනාව සාදා ගනියි. මලයෙන් ගැවසී පවතින රන් කැබැල්ලකට අපේ ජීවිතය සමාන ය. එයට හේතුව පුහුදුන් අප කා තුළත් කෙලෙස් මල පවතින හෙයිනි.

බලගතු සතුරෙක් කෙනකුට කරන දරුණු විපතකට වඩා අප තුළ ම ඇති කෙලෙස් මල එක් ආත්මයක පමණක් නොව, අසීමිත ආත්මවල තදබල දුක් හිරිහැර අපට ලබා දෙයි. කොස්, පොල් හෝ ගල් මුල් හෝ වෙනත් ද්‍රව්‍යයක් මේ ආකාර යැයි සටහන් වශයෙන් පෙන්විය හැකි ය. එහෙත් අප තුළ ඇති කෙලෙස් මේ ආකාර යැයි රූප වශයෙන් දැක්වීම අපහසු ය. විමසිලිමත් ව බලන විට අප තුළ පවතින කෙලෙස්වල ප්‍රමාණය ගණනින් එක් දහස් පන්සියයක් පමණ වෙයි. ඒවා විවිධ වචන උපයෝගී කොට ගෙන අවබෝධ කරදීමට උත්සාහ ගෙන ඇත. එයින් ප්‍රධාන වූ ලෝභය දැක්වීම සඳහා වචන සියයක් පමණ ද, ද්වේශය හැඳින්වීම සඳහා වචන විසි හයක් ද, මෝහය දැක්වීම සඳහා වචන විසි පහක් ද, වශයෙන් වෙන් වෙන් වූ වචන ධර්ම ග්‍රන්ථයන් හි යොදා ඇත්තේ රූපකාරයෙන් ඒවා දැක්වීමට අපහසු හෙයිනි.

අප සන්තානයෙහි පවත්නා කෙලෙස් එක්වර සුළු වේලාවකින් කිසිවකුට හෝ විනාශ කළ නොහැකි ය. එය ආත්මභාව ගණනක් මුළුල්ලේ මහත් උත්සාහයෙන් ක්‍රියා කොට ලබා ගත යුතු ප්‍රතිඵලයකි. බුද්ධ කාලයෙහි ජීවත් වූ යහළු භික්ෂූන් පන්සිය නමකගෙන් එක් නමක් හැර අන් අය වස් කාලය ආරම්භයේ දී ඈත විවේක සෙනසුන් කරා වැඩමවා අනුපිළිවෙලින් ක්‍රමවත් ව භාවනා කොට වස් අවසානයත් සමඟ රහත් භාවයට පත්වූහ. ඒ පිළිබඳ ව සිතා ඉතිරි භික්ෂූ නම එක් රැයකින් රහත් විය හැකි යැයි සිතා අධික උත්සාහයෙන් භාවනා කිරීමට පටන් ගෙන මධ්‍යම රාත්‍රිය ඉකුත්වත් ම අධික තෙහෙට්ටුව නිසා සක්මන් මලුවෙහි වැටී පාදය බිඳී බලවත් දුකට පත්වීමේ පුවතක් ධර්ම ග්‍රන්ථයන්හි දැක්වේ.

සෑම දෙයකට ම සාර්ථක ප්‍රතිඵල ලැබීමට අනුගමනය කළ යුතු පැහැදිලි ක්‍රමානුකූල පියවර ඇත. විභාග සමත් කිරීමට බලාපොරොත්තු වන සිසු දරුවෝ එයට අදාළ දැනුම පාසලට ඇතුළු වූ කුඩා කාලයේ සිට අනුක්‍රමයෙන් උසස් මට්ටමකින් ලබා ගැනීමෙන් හොඳ ප්‍රතිඵල හිමිකර ගනිති. එදිනෙදා ලබා ගත යුතු දැනුම නො මැතිව විභාග ආසන්න වනවිට නොකා නොබී, නිදි වරා අධික වෙහෙසට පත්ව වැඩ කරන අයට සිදුවන්නේ ද කලින් සඳහන් පා බිඳ ගත් භික්ෂු නමට සිදු වූ දෙය යි.

මගඵල ලැබීමට බලාපොරොත්තු වන අය එක දිනකින් හෝ, එක වසරකින් හෝ එය සිදු කළ හැක්කක් සේ සිතීම මුලාවකි. සමහර විට කල්පයක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ කෙලෙස් ප්‍රහීන කිරීමේ ප්‍රතිපත්තිවල යෙදීමෙන් අනතුරුව ලබා ගත යුත්තක් බව අමතක කළ යුතු නොවේ.

බුද්ධ කාලයේ ජීවත් වූ බමුණෙක් උදෑසන භික්ෂූන් සිවුරු පොරවනු බලා සිට එක් නමකගේ සිවුරු අග කෙළවර තණකොළවල තිබූ ජලයෙන් තෙත්වනු දැක එ බිම පිරිසුදු කළේ ය. පසුදින සිවුරු අග මඩ තැවරෙනු දැක ඔහු එහි වැලි අතුළේ ය. තවත් දිනක තද වැස්සේ සිවුරු පොරවනු දැක එහි ශාලාවක් ඉදි කෙළේ ය. මුල සිට සුළු වශයෙන් සිදු කළ ක්‍රියාව, පසුව මහත් ධනයත්, ශ්‍රමයත් කාලයත් වඩාත් වැය කොට ශාලාවක් ඉදි කොට පූජා කිරීම දක්වා වර්ධනය විය.

ඉහත සඳහන් සිදුවීම නිමිති කොට කරුණු ගෙන හැර දැක් වූ බුදුරජාණන් වහන්සේ, අනුක්‍රමයෙන් තමාට ම විපත්ති කරමින්, තම ස්ථානයෙහි ලැගුම් ගෙන සිටින කෙලෙස් නැති කිරීමට උත්සාහ ගැනීමේ අගය පෙන්වා පැහැදිලි කිරීම සඳහා මෙහි සඳහන් ගාථාව දේශනා කළහ.

ලෝභ ආදී කෙලෙස් මැඩ පැවැත්වීම එතරම් ලෙහෙසි පහසු දෙයක් නොවේ. කෙනකුගේ ස්මරණ ශක්තිය, ඤාණ ශක්තිය, ඉන්ද්‍රිය ශක්තිය හා ශරීර ශක්තිය වයස්ගත වීමත් සමඟ අනුක්‍රමයෙන් දුබල වෙයි. එහෙත් තණ්හාව ඇතුළු කෙලෙස්වල ශක්තිය වයස කොපමණ ගත වුවත් දුබල නොවේ. අපේ උත්සාහය විය යුත්තේ අප තුළ ම රැඳි සිටිමින්, අපට ම දුක් කරදර විපත් සිදු කරන මේ කෙලෙස් සතුරන් මැඩ පවත්වා නැතිකර දැමීමට දාන, සීල, භාවනා යන ත්‍රිවිධ කුසල ක්‍රියාවන්හි වඩ වඩාත් යෙදීම යි.

# අතීතයේ වැඩ සිටි යතීන්ද්‍රයන් වහන්සේ සසුන සක්‍රීය කර තිබෙන මාර්ගය අප අනුගමනය කළ යුතු යි

උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ ඓතිහාසික පරමනාගල චිත්තවිවේකාරාමාධිකාරී පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

## වල්ගම චන්දරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය



**කෙළිදෙළෙන් ගතකරන ළමා වියේදී ම පැවිදිභාවයට පත්වෙලා ශාසනික අධ්‍යාපනය ලබා ගෙන ගුරු හාමුදුරුවන් වහන්සේ ගේ අභාසය ලබමින් පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරය දක්වා පැමිණි ගමන් මඟ පිළිබඳ අතීතාවර්ජනයක යෙදෙමින් ම සාකච්ඡාව ආරම්භ කරමු අපේ හාමුදුරුවනේ,**

මම පුංචි කාලයේ හැදුණේ වැඩුණේ රයිගම් කෝරළයේ බණ්ඩාරගම ප්‍රදේශයේ වල්ගම කියන බොහොම සුන්දර ගම්පියසක. මගේ පියා ඩී. ආර්. කරුණාරත්න නාහල්ල මහතා රජයේ නිලධාරියෙක්. මගේ අම්මා කේ. ගුණවතී පෙරේරා නාහල්ල මහත්මියත් කළ මනාකාරිනියක ලෙස සේවය කළා. මා ඇතුළුව අප පවුලේ සහෝදර සහෝදරයින් හතර දෙනකු සිටියා. මම පුංචි කාලයේදී පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ගත්තා. ඒවගේ ම මගේ මව්පියන් බොහොම ශ්‍රද්ධාවන්තයි. අපේ අම්මා ශාසනය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වූවා වගේ ම හාමුදුරුවන් වහන්සේ කෙරෙහි ඉතාම භක්තිමත් ව, ගෞරවනීය ව පූජනීය අදහස් තිබුණ උතුම් කාන්තාවක්. පානදුරේ අරියධම්ම හාමුදුරුවන් වහන්සේ කෙරෙහි අම්මා තුළ බොහොම ගෞරවයක්, හැඟීමක් තිබුණ නිසා ම උන්වහන්සේ ගේ අදාහන පූජෝත්සවයට මම අම්මත් සමඟ සහභාගි වුණා. ඒවන විට මට වයස අවුරුදු හතක් විතර ඇති. ස්වාමීන් වහන්සේ තුළ තිබෙන වටිනාකම, පැවිදි ජීවිතය තුළ තිබෙන උත්තරීතර පූජනීයත්වය ඒ අවස්ථාවේ දී තදින් ම මගේ සිතට කාවැදීම නිසා මටත් පැවිදිවීමට තිබුණා නම්, කියන අසාවක් ඇතිවුණා. මව්පියන් ගේ ආශිර්වාදය ඇතිව වර්තමාන ගුරුදේවෝත්තම රොටුඹ පේමරතන නායක හාමුදුරුවන් වහන්සේ වැඩ සිටි උඩුගොඩ වික්‍රමශිලා පිරිවෙන් විහාරස්ථානයට සම්බන්ධ වෙලා 1991 වර්ෂයේ නොවැම්බර් 02දින පැවැත්වුණු කඨින මහා පුණ්‍යෝත්සවයේ දී පැවිදි බවට පත්වුණා.

අනතුරුව නුගේගොඩ සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙනින් පිරිවෙන් අධ්‍යාපනය ලබා ගෙන පිරිවෙන් අවසාන, ප්‍රාචීන, මධ්‍යම, ප්‍රාරම්භ ආදී විභාග සමත් ව උසස් අධ්‍යාපනයට යොමුවෙමින් උපාධිය දක්වා අධ්‍යාපනය හැදෑරීමට කටයුතු කළා. මම පුංචි කාලයේ සිට ම අධ්‍යාපන කටයුතුවලට වඩා පිරිත් දේශනා කිරීමට විශාල කැමැත්තක් දැක්වූවා. එම කැමැත්ත නිසා ම බුද්ධ වන්දනාව අවසන් වූ විගස පානදූරේ අරියධම්ම නා හිමි,වත්තල සීලරතන නා හිමි , බළංගොඩ ආනන්ද නා හිමි යන මහා යතීන්ද්‍රයන් වහන්සේ ගේ ඡායාරූප වැඳ නමස්කාර කරමින් අරියධම්ම හාමුදුරුවන් වහන්සේ මෙන් බෝධිපූජා තියන්න ලැබේවා, සීලරතන හාමුදුරුවන් වහන්සේ මෙන් පිරිත් දේශනා කරන්න ලැබේවා, බළංගොඩ ආනන්ද හාමුදුරුවන් වහන්සේ මෙන් ධ්‍යාන ලබා ගැනීමට ලැබේවා යන උතුම් මානසිකත්වයෙන් කටයුතු කළා.

ගුරු දේව නායක හාමුදුරුවන් වහන්සේ අසීමිත ගෞරවයෙන් ශාසනික හැඟීම් අප තුළ ජනිත වන ආකාරයට කටයුතු කළා. උන්වහන්සේ ගේ මඟ පෙන්වීම යටතේ පැවිදි ජීවිතය ගතකරගෙන යනවිට කෝට්ටේ කල්‍යාණී ධර්ම මහා සංඝ සභාව වෙතින් 1997 වර්ෂයේදී අධිශීල සංඛ්‍යාත උතුම් උපසම්පදා සීලයට පත්වීමට පුණ්‍යවන්ත වුණා. බණ්ඩාරගම වික්‍රමශිලා විද්‍යායතන පිරිවෙනේ ධර්මාචාර්යවරයකු ලෙස වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කළ අවස්ථාවේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ පෙරදිග ශාස්ත්‍ර පිළිබඳ ව සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ධූරයට පත්වුණා. ගරුකටයුතු වටිනාපහ සෝමානන්ද අධ්‍යක්ෂ නායක හාමුදුරුවන් වහන්සේ යටතේ එම සේවාවන් සිදුකරන්න ලැබිල තිබෙනවා. පැවිදි ජීවිතය පිළිබඳ ව කල්පනා කරන විට විහාරස්ථානය තුළ ම අධ්‍යාපනය ලබන මානසිකත්වය නොතිබුණ නිසාම බාහිර කටයුතු සිදුකිරීමේ දීත් යම් පර්යේෂණාත්මක අධ්‍යනයන් තුළදීත් හොඳ පාරම්පරික ගුරු ඇසුරක් ලැබුණා.

ගරුකටයුතු කුකුල්පණේ සුදස්සී නායක හාමුදුරුවන් වහන්සේ, දඹදෙණිය දාහිගමුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවන් වහන්සේ යන දෙනම ගෙන් ගුරුදේවයන් වහන්සේට දෙවන නොවන ආකාරයෙන් අවවාද අනුශාසනා ලබාදුන් බව මේ අවස්ථාවේ දී ගෞරවයෙන් සිහිපත් කළ යුතුයි. ඒ වගේ ම ගෞරවනීය පින්වත් මහා යතීන්ද්‍රයන් වහන්සේලා ගෙන් ලැබුණ අවවාද අනුශාසනා නිසා පැවිදි ජීවිතය ආලෝකවත් වීමට හේතුවක් වුණ බවත් පුණ්‍යාණුමෝදනා පූර්වකව සිහිපත් කළ යුතුයි.




**ඔබ වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවයත්, ජාතික, ආගමික, ශාසනික සේවයත් පිළිබඳව කෙටියෙන් සඳහන් කරනවා නම්,**

ධර්ම ශාස්ත්‍රීය සේවය වශයෙන් ග්‍රන්ථ රචනා කරනවා වගේ ම, අතීත යතීන්ද්‍ර පරපුරෙන් පවත්වන ලද විචිත්‍ර දේශනා සහිතව පිරිත් දේශනා පිළිබඳව පුහුණු කරන ලද සුවිශේෂී හැකියාවක් තිබෙන බොහොම දක්ෂ බුද්ධ පුත්‍රයන් වහන්සේ කිහිප නමක් සම්බුද්ධ ශාසනයට දායාද කළා. ශාසනික සම්ප්‍රදායන් රකින සංවිධානයක් ලෙස සමස්ත ලංකා සසුන්මඟ භික්ෂු සංවිධානයේ සභාපති වශයෙන් වසර අටක් කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංකා ජාතික භික්ෂු පෙරමුණේ මාධ්‍ය ප්‍රකාශක ලෙස යම් කාර්යභාරයක් සිදු කළා. ඒ වගේ ම ශාසනයට අවශ්‍ය පරිදි සමිති සමාගම් රාශියක සේවය කරමින් නායකත්වය ලබාදීමට කටයුතු කර තිබෙනවා. විවිධ රෝගාබාධ වැළඳීමෙන් අසරණ වූ බොහෝ රෝගීන් සුවපත් කිරීමට කටයුතු කර තිබෙනවා. කොරෝනා වසංගතය පවතින මෙම කාල පරිච්ඡේදයේ දීත් හැකි සෑම අයුරකින් ම උදව් උපකාර කිරීමට කටයුතු කළා. කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ කාරක සභික ධූරයක් දරමින් වසර හතරක් සම්බුද්ධ ශාසනය වෙනුවෙන් යම් කාර්යභාරයක් සිදු කළා.

ධර්ම දූත සේවය සඳහා රටවල් විශාල ප්‍රමාණයකට වැඩම කළා වගේ ම දේශීය වශයෙන් ගුවන්විදුලි ධර්ම දේශනා සඳහා සහභාගි වුණා. සියලු විහාරාරාංගයන්ගෙන් සමන්විත ව ඉතාම දැකුම්කළු ආකාරයට ඓතිහාසික පරමනාගල විහාරස්ථානය ඉදිකිරීමට කටයුතු කළා. ලොව ප්‍රථම හා එකම පද්මාකාර සෑ රජාණන් වහන්සේ මගේ දෑතින්ම ඉදිකිරීමට තරම් මා තුළ පැවැති සංසාරගත පුණ්‍යශක්තිය බලවත් වුණා. බොහෝ දෙනාට කළ නොහැකි සම්ප්‍රදායානුකූල පිරිත් දේශනා, පෞරාණික අභිචාර විධි, පිළිම කලාව,ගොක්කොළ කලාව, ආරාමික ගෘහ නිර්මාණ කලාව, අංගම් කලාව, මුක්තාමාණික්‍ය සම්ප්‍රදාය, බෙහෙත් ක්‍රම, ශෛල හා ලී කැටයම් කලාව, ලියවැල් කලාව, පුස්කොළ කලාව, ඇත්දළ කැටයම් කලාව යන මා සතු කලා හැකියාවන් ගරු අධ්‍යක්ෂ ජෙනරාල් නායක හිමිපාණන් වහන්සේ ගේ ඇනුමැතිය යටතේ ධර්ම විනයට මුල්තැන දෙමින් පුරාණ සංස්කෘතිය මතු පරපුරට දයාද කිරීමේ අදහසින් පෙරදිග ශාස්ත්‍ර පාඨමාලාව දායාද කිරීමට තවදුරටත් කටයුතු කරගෙන යනු ලබනවා.

**පිරිවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ඔබ වහන්සේ ලබා ගත් අත්දැකීම් අනුසාරයෙන් පිරිවෙන් අධ්‍යාපනය ලබන හැදෙන වැඩෙන පොඩි හාමුදුරුවන් වහන්සේට ලබා දෙන උපදෙස් මොන වගේ ද? අපේ හාමුදුරුවනේ,**

මෑත භාගයේ දී පොඩි හාමුදුරුවන් වහන්සේ කණ්ඩායම් වශයෙන් වෙන්වෙලා වගේ ඇතැම් අවස්ථාවල දකින්න තිබෙනවා. අතීතයේ වැඩ සිටි යතීන්ද්‍රයන් වහන්සේ සසුන සක්‍රීය කර තිබෙන මාර්ගය තමයි අපි අනුගමනය කළ යුත්තේ . ඒ පැරැණි යතීන්ද්‍රයන් වහන්සේ ගිය මාර්ගය අපේ පොඩි හාමුදුරුවන් වහන්සේලාටත් ඉගැන්විය යුතු බවයි මගේ අදහස. එවකට ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් වහන්සේ දායකයන් ගේ ජීවිතයේ සියලු වැදගත් අවස්ථා සඳහා දායක වුණා. වර්තමානය වන විට එම ස්වභාවය පන්සලෙන් ගිලිහී යනවා වගේ දැනෙනවා. ශාසනික වර්ග පටිපාටිය ආරක්ෂා කරගෙන ධර්ම ශක්තියට, බුද්ධ ශක්තිය ට අනුකූලව කටයුතු කරන ආකාරයට පොඩි හාමුදුරුවන් වහන්සේ හැඩගස්වා ගත යුතු යි.

හේමමාලා රන්දුනු

# කාන්තාවට වටිනාකමක් ලැබෙන්නේ චරිතය ලස්සන වූ තරමට යි

**ගත උලන සුවඳ වත්සුණු කැටයක් සේ ආදරය ද ක්ෂය විය යුත්තක් නොවේ. අද්‍යතනයේ නව පරපුරේ ඇතැම් වෛවාහකයන්ගේ ආදරය ඉරිතලා බිඳිගොස් ඇතැම් විට මිනිස් ඝාතන - සිය දිවි නසා ගැන්මෙන් ශෝකාන්ත නාටකයන් වන්නේ ය.**

බිරිඳක් නම් ඇය තවත් චන්ද කින්නරියක් විය යුතුයි. බඹදත් රජුගේ හී සැර වැදී මළ සඳ කිඳුරා වැළඳගෙන කඳුළු වැගුරූ ඒ සඳකිඳුරිය ම ආත්ම ලක්ෂ සිය ගණනකට පසුව ද බිම්බාදේවී (යසෝධරා) සම්බුදු සිරිපා පියුම මත මුහුණ ඔබාගෙන කඳුළු සලා ප්‍රකට කළේ ආත්මයෙන් ආත්මයට ඉඳුකිළ සේ රැකි අචල - අම්ල පතිදහමයි. පතිවත ගත බබළන රන් අබරණකට වඩා අගී.

තුරුණු වියේ ගිජ්ඣකූට නව යොවුන් ඇතින්නක් මිතුරු කර ගැන්ම ලේසි නොවේ. අතු - ගෙඩි කඩා දෙමින් දෙළේ - විලේ - ගඟුලේ දී දිය නාවමින් කලක් යනතුරු ම නො වෙනස් ලෙසින්, සැබෑ ලෙසින් සෙනෙහස පෑ පසු යළි කිසිදා මේ ඇතු තමා අත්හැර නොයති'යි ඇතින්නට ඒත්තු ගිය පසුවයි ඒ කෙණෙර මෙවුන් දමට එක්වන්නේ. ඒ ඇතා, ඇතින්න හැරදා ගියොත් රැළේ අනෙක් ඇත්තු ඇයට පහර දෙන්නෝ ය. මැරෙන තෙක් ම පහර දෙන්නෝ ය. ඒ ඇය නො ගැළපෙන, විශ්වාසය කඩ කළ සහකරුවකු තෝරා ගත් වරදට දඬුවම යි. මේ ඇතුන් පිළිබඳ ගවේෂකයින් සොයා ගත් සැබෑ කරුණකි. චිම්පන්සියෙක් තම සහකාරිය කරගත් චින්පන්සි ධේනුව හැර වෙනත් චිම්පන්සියක් හා එක් නොවන්නේ ය. නූගත් සතුන් අතර ඇති උදාර චරියාවන් සමහර උගත් මිනිසුන් අතර ඇත්තේ ද යන්න ගැටලුවකි.

වරක් ඕස්ට්‍රේලියාවේ තරුණ ඉංජිනේරුවෙක් සිය වර්ගයේ යුවතියකට පෙම් බැන්දේ ය. දෙදෙනා එක රියේ නැඟී යද්දී රිය අනතුරකට ලක්ව පෙම්වතා තුවාල වී රෝහල් ගත කෙරුණි. සැත්කමකින් පසුව ඔහුට විවාහ නොවිය හැකි තත්ත්වයක් උදාවිය. ඔබ වෙනත් අයකු තෝරා ගන්න යැයි ආබාධිත පෙම්වතා සිය ප්‍රේමවන්තියට යෝජනා කළේ ය. ඕ සිය පෙම්වතාට මදිගට ම උපකාරී වූ අතර වෙනත් විවාහයකට පත් නුවූවා ය. ඇය මිය ඇදෙන විට වයස 63 වසරකි. එවිට ද ඕ චරිතවත් මානවිකාවකි. තථ්‍ය (සැබෑ) ප්‍රේමය ඕ ප්‍රකට කළා ය.

විවාහය යනු සැබෑ රංගනයකි. සිනමා තාරකාවක් ,වේදිකා නිළියක් ඇතැම්විට ද්විත්ව චරිත නිරූපණයේ යෙදෙයි. සුබ සරණ බන්ධනයට ඇතුළත් කාන්තාව පළමු ව බිරිඳකි. දෙවැනි ව මවකි. එක ම කාසියේ දෙපැත්ත මෙනි. බිරිඳක සේ නිසි ලෙස කාර්ය සාධනයේ යෙදුන ද දරුවන්ගේ කටයුතු අතපසු කිරීම ඇයට අවසර නැත.

මවක ලෙස අනල්ප වැඩ කොටසක් කළ ද සිය වල්ලභයා (ස්වාමි පුරුෂයා) වෙනුවෙන් කළ යුතු වැඩ කොටස අතපසු කරන්නට ද ඉඩක් නැත. ඒ වැඩ මේ වැඩ නිසා මට නිවනක් නැතැ'යි ආඩපාලි නොකියා දිරිය ගැහැනියක සේ වැඩ කළ විට පවුලේ අභිවෘද්ධිය ගැන කවර කතා ද? ජීවිතයේ පැසුළු යමේ, ජීවිතයේ සැඳෑ සමයේ අපමණ සතුටකින් සැනසුම් සුසුම් හෙළිය හැක්කේ එවිට යි. "දිවූ තරමට හති" යි කටවහරේ යෙදුමක් ඇත. හති වැටී වැටී වුව දිවගත් විට ජයටැඹ එතැන ය.

ආදරයෙන් වෙළී සමඟියෙන් බැඳුණු අඹු - සැමි දෙදෙනකු අතරේ විරසකයක් ගොඩ නැඟී කලහ වාද විවාද ඇති වී භේදභින්න වන්නට හේතු වන තවත් කරුණක් වන්නේ අවිශ්වාසය යි. අස්ථාන සැකය යි. සිය කලත්‍රයා (සහකරු හෝ සහකාරිය) වෙනත් අඹුවක - සැමියකු සමඟ අනියම් සබඳතාවක් ඇතිකර ගෙන ඇතැයි

> **පරවාද ඉවසන සොබාව හැම දෙනා තුළ ම තිබිය යුත්තකි. පියාගේ අදහස එකකි. මවගේ පැතුම වෙනකකි. පුතුගේ අපේක්ෂාව තව දෙයකි. දුවගේ චින්තනය ඊටත් වෙනස්. එහෙත් පරස්පර මේ සිව්දෙනා ම එකම බෝට්ටුවේ - ඔරුවේ යා යුතුයි.**

සිතන්නට කරුණු කොතෙකුත් යෙදේ. එහෙත් එය හුදු මිථ්‍යාවක් විය හැක. සැකය වූ කලි මාරාන්තික විෂ බීජයක් වැනි වේ. අනියම් ප්‍රේමයක් ගැන ඇතිවන සැකය තරම් වේදනාවක් විවාහකයනට නැති තරම්. අවිශ්වාසය හදවතේ කැකෑරෙන්නට, නැතිනම් පැසවන්නට ඉඩ නොදී විවෘත සංවාදයකින් එය නිෂ්ප්‍රභ කර ගත හැක. එය යහන් සැහැල්ලේ දී පවා කරගත හැකියි.

අඹු - සැමියෝ ඇතැම් විට රෑ නිදි යහනට ගිය සැණින් නින්දට පත්නොවී අල්ලාප සල්ලාපයේ යෙදෙති. එය 'යහන් සැහැල්ල' නම් වේ. නින්දට පත් දරුවනට ද නො දැනෙන සේ හැම රහසක් ම මේ පැයේ දී සාකච්ඡා කළ හැකි ය. සැකය මානසික වධයක් වී මනෝ ව්‍යාධියක් විය හැක.

ධෛර්ය සම්පන්න ව ධනෝපායනයේ යෙදී කා බී සතුටින් ජීවත් වන - දියුණු වන පවුල් දෙස රටේ තොටේ ඇතැමුන් බලන්නේ ඊර්ෂ්‍යා පරවශ හැඟීමෙනි. එවන් පවුලක් කඩා බිඳ වැටෙන්නේ නම්, සතුටුවන සිත් ඇතැම් කුහකයනට ඇති වේ. ඔවුහු කේළාම් ඈ විවිධ උපායන් යොදා ඒ අහිංසක පවුල් වනසති. අඹු - සැමියෝ කලබල නොවී එවන් බාධක ජය ගැන්මට සමත් විය යුත්තෝ ය. ලෝකය විවිධ යි. විසම යි. භින්න රුචික සමාජයේ අපි ජීවත් වෙමු. එකිනෙකාගේ රස වින්දනය විවිධ යි. පුද්ගලයන් අතර මතවාද ගොඩනැඟෙන්නේ භින්න රුචික භාවය නිසා ය. පරවාද ඉවසන සොබාව හැම දෙනා තුළ ම තිබිය යුත්තකි. පියාගේ අදහස එකකි. මවගේ පැතුම වෙනකකි. පුතුගේ අපේක්ෂාව තව දෙයකි. දුවගේ චින්තනය ඊටත් වෙනස්. එහෙත් පරස්පර මේ සිව්දෙනා ම එකම බෝට්ටුවේ - ඔරුවේ යා යුතුයි. අකැමැත්තෙන් වුව බහු මතයට හිස නැමිය යුත්තේ ය. ගිහි සමාජය තුළ පමණක් නොව පැවිදි සමාජය තුළ වුව මත වාද ඇතිවේ.

එපා කිසිවිට කෝප වන්නට
අනුන්ගේ අඩුපාඩු දැකලා
හිත නිවාගෙන ගත නිවාගෙන
ඉන්න සුවපත් මගට බැහැලා
අපට ඕනෑ විලස හැම තැන හැම
දෙය ම නැති බව ද හිතලා
හිත හදාගෙන සැනසෙන්න ඔබ
පිටත ගිනි මැල ඉවත දමලා


නරක ගතිගුණ තිබෙන අය අපි
පළමු හඳුනාගන්න ඕනෑ
ඔවුන්ගෙ ම ඇති වටිනා ගුණයක්
වේද එය දැන ගන්න ඕනෑ
කරුණු කියලා දුබල ගති හැම ඉවත්
කරවා ගන්න ඕනෑ
හදා ගන්නට බැරි ම තැනක දී දරා
ඉවසා ගන්න ඕනෑ

දෙඩම්ගොඩ අස්සජි නාහිමියන්ගේ මෙම කවි සංකල්පනාව දෙන මා හැඟී ඔවදන ජීවිතයට මහගු මිණකි.

කම්මට්ඨානාචරිය
**වීදාගම නාගිත හිමි**



# සසුනේ දියුණුවට කැප වූ ගොමිල කෝලිත නාහිමියෝ



**මාකඳුර බැරගම ශ්‍රී සුධර්මාරාම පුරාණ මහා විහාරාධිපති ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ උපසම්පදා කාරක සංඝ සභික මාතර මහ දිසාවේ කන්දබඩ පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක විශ්‍රාමලත් පරිවේණාධිපති විනය කීර්ති ශ්‍රී නන්දසාර උපාධ්‍යාය ගොමිල කෝලිතාභිධාන නායක මා හිමිපාණන් වහන්සේ සිය උදාරතර දිවියේ 70 වන වියට පා තැබූ හ.**

දක්ෂිණ ලංකාවේ මාතර මහ දිසාවේ මොරවක් කෝරලයට අයත් මාවරල ගොමිල ග්‍රාමයේ දී ජයවීර ගමගේ දියෝනිස් පියතුමාට හා එච් කේ ජොසිහාමි මව්තුමියට දාව 1951 ඔක්තෝම්බර් මස 10

වැනිදින උපත ලැබූ පින්වත් කුමරු කුඩා කල ඇහැළකන්ද කණිෂ්ඨ විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරී ය. කුඩා කල පටන් පැවිදි වීමට තිබූ ආශාව නිසා ම එවකට මාකඳුර බැරගම ශ්‍රී සුධර්මාරාම පුරාණ මහා විහාරාධිපති ව වැඩ විසූ රත්සෑගොඩ නන්දසාර මහා ස්වාමීන්ද්‍රයන් වෙත භාර කෙරිණ. පැවිද්ද සඳහා අවශ්‍ය හෙරණසිඛ දිනචරියාව සතර බණවර ආදිය මැනවින් හැදෑරීමෙන් පසු 1964 නොවැම්බර් මස 04 වැනි දා ගොමිල කෝලිත නමින් උතුම් පැවිද්ද ලැබී ය.

පැවිදි වීමෙන් අනතුරුව ඌරාපොල සිරි රතනජෝති විද්‍යායතන පිරිවෙනටත්, සපුගොඩ විද්‍යානිකේත පිරිවෙනටත්, කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනටත් ඇතුළත් ව සිංහල, පාලි, සාංස්කෘත, ධර්ම විනය, ඉතිහාසය, පුරාවිද්‍යාව, ජෝතිෂ්‍ය ශාස්ත්‍රය වැනි විෂයයන් මනාව හදාරා විද්‍යෝදය පිරිවෙන් අවසාන පරීක්ෂණය විශිෂ්ට ලෙස සමත් වූ හ. ඉන්පසු රත්මලාන පිරිවෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයට ඇතුළත්ව, දෑ අවුරුදු ගුරු පුහුණුව ද මැනවින් හැදෑරීය. සපිරුණු විසිවයසින් යුක්ත වූ කෝලිත සාමණේරයන් වහන්සේ වර්ෂ 1973 ජූනි මස 04 වැනි දා මහනුවර මල්වතු මහා විහාරයීය උපෝසථාගාරයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්වූයේ රත්සෑගොඩ නන්දසාර, රත්සෑගොඩ පාලිත, වැලිහේනේ සෝරත යන මා හිමිවරුන් ගේ ආචාර්යත්වයෙනි.

උපසම්පදාව ලැබීමෙන් පසු ධර්ම ශාස්ත්‍රීය සේවාව ආරම්භ කළ නාහිමියන් වහන්සේ කළුතර ධර්ම විජය මූලික පිරිවෙණ, මොරටුව ජනානන්ද පිරිවෙන හා එගොඩ උයන මෙත්තෙන්ද පිරිවෙන යන විද්‍යාස්ථානයන්හි ගුරුවරයකු මෙන් ම විශ්‍රාම යන තුරු පරිවේණාධිපති වශයෙන් ද දීර්ඝ කාලයක් සේවාව සිදු කළ හ. මොරටුව ලුනාව බෝධිරාජාරාම විහාරය ද සංවර්ධනය කිරීමට දායක වූ නාහිමිපාණන් වහන්සේ

ස්වකීය ආචාර්යයන් වහන්සේලා ගේ අපවත් වීමෙන් පසු පැවිද්ද ලැබූ බැරගම ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරයට වැඩම කොට 2011 ජූනි මස 11 වැනි දා විහාරාධිපති පදවියට පත් වූ හ. විහාරස්ථ පෞරාණික ගොඩනැගිලි ආදිය නවීකරණය කරමින් වර්තමාන දියුණු තත්වයට පත්කිරීමට අතිශය වෙහසක් දැරූ නාහිමිපාණන් වහන්සේ ශ්‍රී දේවානන්ද දහම් පාසල, සුධර්මා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ආදියෙහි ප්‍රධානාචාර්ය ධුරය හා අනුශාසකත්වය දරමින් කටයුතු කළහ. වර්තමානයෙහි මුලටියන ශාසනාරක්ෂක බල මණ්ඩලයෙහි උප සභාපති ධුරය ද දරමින් කටයුතු කරන නාහිමිපාණන් වහන්සේ වෙත ස්‍යාමෝපාලි මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වය වෙතින් සියලු ම සේවාවන් අගයා 2011 වර්ෂයේ දී

උපසම්පදා කාරක සභික ධුරයක් ද, 2018 වර්ෂයේ දී විනය කීර්ති ශ්‍රී නන්දසාර යන ගෞරව නාමය සහිත මාතර කන්දබඩ පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවිය ද, 2021 වර්ෂයේ දී උපාධ්‍යාය පදවියට ද පත්කොට වදාළ හ.

ජාතික ආගමික ශාසනික වශයෙන් සුවිසල් මෙහෙවරක නිරත ව සිටින නාහිමිපාණන් වහන්සේ සසුනෙහි පැවැත්ම උදෙසා ශිෂ්‍යවරු රාශියක් ද නිර්මාණය කළහ. පිරිවෙන් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ශාස්ත්‍රවේදී කෙහෙල්වල විපස්සී, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක බැරගම ශ්‍රී රාහුල, කැටපොලකන්දේ සිරිධම්ම, මුරුංගාගස්යායේ තපස්සි යන හිමිවරු ඒ අතරින් ප්‍රධාන වෙති.

සිය උදාරතරදිවියේ 70 වැනි වියට පා තබන උපාධ්‍යාය ගොමිල කෝලිතාභිධාන අප නායක මා හිමිපාණන් වහන්සේට ශතාධික වර්ෂයක් නිදුක් ව, නිරෝගී ව වැඩ විසීමට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා යි ප්‍රාර්ථනා කරමි හ.

> **උපසම්පදාව ලැබීමෙන් පසු ධර්ම ශාස්ත්‍රීය සේවාව ආරම්භ කළ නාහිමියන් වහන්සේ කළුතර ධර්ම විජය මූලික පිරිවෙණ, මොරටුව ජනානන්ද පිරිවෙන හා එගොඩ උයන මෙත්තෙන්ද පිරිවෙන යන විද්‍යාස්ථානයන්හි ගුරුවරයකු මෙන් ම විශ්‍රාම යන තුරු පරිවේණාධිපති වශයෙන් ද දීර්ඝ කාලයක් සේවාව සිදු කළ හ.**

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක
**බැරගම ශ්‍රී රාහුල හිමි**

# ගෝනදුව දක්ඛින චේතියාරාමයේ අනෝමදස්සී ලොකු හාමුදුරුවෝ



> **කිසිදු නායක පදවියක් හෝ තනතුරක් නොමැති උන් වහන්සේ බොහෝ දෙනා ආමන්ත්‍රණය කරනුයේ "අනෝමදස්සී ලොකු හාමුදුරුවෝ" යනුවෙනි.**

**පසු ගිය විසි හත් වැනි දා ගෝනදුවේ අනෝමදස්සී ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ අනූව වැනි ජන්ම දිනය එලඹී තිබූ අතර, උන් වහන්සේට දිගාසිරි හා ආශිර්වාදාත්මක උපහාර පුදනු වස්, මෙසේ ලියන්ට අදහස් කළෙමි.**




සිය පින්බරදිවි මගෙහි අනූ වැනි ජන්මදිනය සමරන අපේ සුපින්වත් අනෝමදස්සි ලොකු හාමුදුරුවන් වහන්සේ, කළුතර ප්‍රදේශයේ වැඩ වාසය කරන උගත්, ධර්මධර, විනයධර, ගුණ වෘද්ධ, තපෝවෘද්ධ මහා යතිවරයන් වහන්සේ නමකි.

කිසිදු නායක පදවියක් හෝ තනතුරක් නොමැති උන් වහන්සේ බොහෝ දෙනා ආමන්ත්‍රණය කරනුයේ "අනෝමදස්සී ලොකු හාමුදුරුවෝ" යනුවෙනි.

උන්වහන්සේ විශ්‍රාම ලත් පාඨශාලාචාර්ය හිමි නමකි. ගුරුවරයකු ලෙස සුවිසල් කාර්යභාරයක් ඉටු කර ඇති උන් වහන්සේ, වත්මන දක්ඛින චේතියාරාම විහාරාධිපති වහන්සේ ලෙස ස්ව ගම් වරයෙහි කුදු මහත් සාසනික, ආගමික හා සමාජ සේවාවන් රැසක් ඉටු කරමින් විහාරස්ථානයේ වැඩ සිටිති.

ඉතාම සංයමයෙන් හා නිහතමානී ව කටයුතු සම්පාදනයෙහි ලා කටයුතු කරන අපේ ගෞරවණීය අනෝමදස්සී ලොකු හාමුදුරුවන් වහන්සේ, ඕනෑම ආරාධනාවකට වැඩම කරමින් එම ස්ථානයන්හි ප්‍රදේශවාසීන්ට හා සංඝ රත්නයට ආශිර්වාදයක් වන්නට තරම් කාරුණික වන්නාහ.

වාද්දුව මධ්‍ය විද්‍යාලයීය ලේඛනගත ප්‍රථම ශිෂ්‍යයා ගිහි කල උන් වහන්සේ වීම ද මෙහි දී විශේෂයෙන් සඳහන් කිරීම වටී.

අපේ පින්වත් ගෝනදුවේ අනෝමදස්සී ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ දිවි මගෙහි ඉදිරි කාලය, නිදුක් නිරෝගී ව තවත් බොහෝ කාලයක් ලෝ හිත සුව පිණිස සසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට සියලු දෙවි රැකවරණෙන්, ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් උන් වහන්සේට ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

සටහන හා ඡායාරූපය
**කළුතර මධ්‍යම විශේෂ**

# සුමන සමන් දෙව් පූජෝපහාර පුදන මහියංගණ රාජ මහා පෙරහරට පමණක් ආවේණික ආදිවාසී පුද සිරිත්

**මහියංගණ රාජ මහා විහාරස්ථානය හා ශ්‍රී සුමන සමන් දේවාලය එක්ව වාර්ෂික ව සිදු කරන ඇසළ පෙරහර මංගල්‍යය ආරම්භය හා විකාශය ක්‍රිස්තු පූර්ව හය වන සියවස දක්වා ඈත අතීතයට ගමන් කරයි. එහෙයින් හෙළයේ ඓතිහාසික ම පෙරහර මංගල්‍යයක් ලෙස හැඳින්විය හැකි ය.**



අවසන් රන්දෝලි පෙරහරේ දී

මහියංගණ ඇසළ පෙරහර මංගල්ලයේ ආදිවාසී සහභාගීත්වය සුවිශේෂී ය. සුමන සමන් දෙවිඳුන් ගේ වැඩිමහල් සහෝදරියක් වන මහා ලොකු මැණියෝ බින්තැන්නේ වැසියන් ගේ මහත් පුදසත්කාරයට හා ගෞරවාදරයට ද පත් තැනැත්තියකි. ඇය ද මහියංගණය සුමන සමන් දේවාලයේ දී පිදුම් ලබන්නී ය.

විශේෂයෙන් ම ආදිවාසී ජනතාව ගේ ප්‍රමුඛ පිළිගැනීමක් හිමි වන්නේ එතුමිය වෙනුවෙන් ය. එතුමිය වෙනුවෙන් දේවාල සතරක් ඇති අතර, එයින් සළුකන්ද දේවාලය තුළ එතුමිය ගේ ආභරණ ඇති බවට විශ්වාස කෙරේ. එතුමිය විසින් චෛත්‍ය රාජයාණන් වහන්සේ උදෙසා පෙරහර මංගල්‍යයන් සිදු කළ බව ජනවහරේ පවතී.

මහියංගණ පෙරහරේ විශේෂත්වය නම් ආදිවාසීන් දක්වන දායකත්වය යි.

බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කළ අවස්ථාවේ යක්ෂ ගෝත්‍රිකයන් අවි ආයුධ දරමින් යුද්ධයකට

සූදානම් වෙමින් සිටි අවස්ථාව සිහි ගන්වමින් මහියංගණයේ ජීවත් වන වැදි ජනතාව දිග රිටි, දුණු, ඊතල හා ආදිවාසී ආයුධ රැගෙන පෙරහරේ ගමන් කිරීම සිදු කරති. විශේෂ නැටුම් ගැයුම් සම්ප්‍රදායක් නොමැති වුවත් ඔවුහු

ඝෝෂා කරමින් රිටි එකිනෙකට ගසමින් ගැටුමක ස්වභාවයෙන් චෛත්‍යය වටා දිව යමින් අවසානයේ සටනට

සූදානම් වෙති.

බුදුරජාණන් වහන්සේට දමනය වූ යක්ෂ ගෝත්‍රිකයන් සංකේතවත් කරමින් පෙරහරේ දී පසුබැස පලායන ස්වභාවය සංකේතවත් කොට නැවත මහවැලි ගඟට ගොස් ජල ස්නානය කොට ආදිවාසීන් ආපසු පැමිණෙන්නේ චෛත්‍යය මලුවට පැමිණ බුදුන් වහන්සේ ගෙන් සමාව ගැනීම පෙන්වන චාරිත්‍රය ඉටු කිරීම උදෙසා ය. අනතුරුව දානය සකස් කොට පෙරහරින් පැමිණ බුද්ධ පූජාව පූජා කිරීම සිදු කරයි. එය අලුයම් කාලයේ දී සිදු කරන පෙරහරක් වන අතර, සම්බුද්ධ පූජාවත් සිදු කරන අවස්ථාව වනවිට හිමිදිරි පාන්දර වන්නේ ය.

ඉක්බිති ආදිවාසීන් දහවල් කාලයේ දෙඩම් පෙරහරක් සිදු කරයි. දෙඩම් ගෙඩි තලා මිරිකා යුෂ සිරුර පුරා තවරා ගෙන දෙඩම් ගෙඩි උඩ දමමින් පැඟිරි යුෂ නරඹන්නන් ගේ හිස ගල්වමින් පෙරහර ඉදිරියට ගමන් කරයි. එයින් ඔවුන් ගේ බලාපොරොත්තුව වන්නේ වසංගත රෝග බියෙන් තොරව ගෝත්‍රයේ පැවැත්ම ඉදිරියට පවත්වාගෙන යාමට ආශිර්වාද ලැබීම යි. ආදිවාසීන් පවසන අන්දමට ඔවුන් ගේ පෙරහරේ ආරම්භය පිළිබඳ ඔවුන්ට අවබෝධයක් නොමැත. පරම්පරාවෙන් පරාම්පරාවට ඔවුන් ගේ වරිග ජනයා විසින් සිදු කරනු ලැබූ ක්‍රියාව තමනුත් සිදු කරන බව ය.

මහියංගණයේ මහා සමන් දේවාලයක් රාජ්‍ය අනුග්‍රහය මත සකස් වුයේ ක්‍රි.ව 1635 දි දෙවන රාජසිංහ රජු ගේ රාජ සමයේ ය. ඉක්බිති ගම්වර පවරා දී වාර්ෂික පෙරහරක් සිදු කරන්නට නියෝග කර ඇත. ඒ අනුව පරවේනි පංගු ඉඩම් තුළ සිටිමින් පරම්පරාවෙන් පරාම්පරාවට පෙරහර රාජකාරි ලෙස ද සකස් විය.

රටේ හා ප්‍රදේශයේ පවතින ව්‍යසන, යුද ගැටුම් හා දේශපාලන තත්වයන් මත පෙරහර නොපැවැත් වූ අවස්ථා

ඉතිහාසය පුරාවට ද ඇත. 1818 වෙල්ලස්ස විමුක්ති සටනින් පසුව පෙරහර පැවැත්වීම නතර විය. නැවත 1857

වර්ෂයේ දී මහියංගණය සමන් දේවාලය භාරව සිටි බිබිලේ නිළමේතුමා ගේ මූලිකත්වය ඇතිව පෙරහර ආරම්භ වූ බවට දේවාලයේ ඇති ලිඛිත සාක්ෂිවලින් සනාථ වෙයි.

ඉංග්‍රීසි ජාතික කැම්බල් ලෝරි මහතා ක්‍රි.ව 1873-1892 කාලයේ මහනුවර දිසා විනිසුරු ලෙස කටයුතු කරමින් නිකුත් කළ ලියවිලිවල මෙම දේවාලය බින්තැන්න දේවාලය ලෙස නම් කොට ඇත. බින්තැන්න දේවාලයේ

රාජකාරිකරුවන් බස්නායක නිළමේට ආහාර සැපයීම, ගමන් මලු ගෙන යෑම, අලි බලන්නන්ට කෑම සැපයීම,

වසරකට පිදුරු සෙවිලි කිරීම ආදියට යොදවා ඇත. බෙරකාර පිරිස, චාමර රැගෙන යන පිරිස, මුරායුධ රැගෙන

යන පිරිස, දෙඩම් දෙන පිරිස ආදි ලෙස රාජකාරිකරුවන් වාර්තාගත කර ඇත. මොවුන් ගේ රාජකාරි සඳහා කුඹුරු ලබා දී තිබුණේ ය. ලෝරි විනිසුරුතුමා විසින් නිකුත් කළ ගැසට් පත්‍රයකින් මහියංගණය ඇසළ පෙරහර මංගල්‍යයට රාජ්‍ය අනුග්‍රහය ලබා දී ඇත්තේ ය.

1857 පසුව සමන් දේවාලය පෙරහර මංගල්‍යයේ ඇතුල් පෙරහර හා කුඹල් පෙරහර දින පහක් කරන අතර,

රාජ මහා විහාරය හා සුමන සමන් දේවාලය එක්ව අවසන් රන්දෙලි පෙරහර පහ සිදුකරයි. අවසන් රන්දෝලි

පෙරහර ගෙවදීමෙන් පසු මහියංගණ රාජ මහා පෙරහරට පමණක් ආවේණික ආදිවාසීන් ගේ පෙරහර අලුයම්

කාලයේ දී සිදුවන්නේ පුරාණ චාරිත්‍ර විධි එලෙස ම සුරක්ෂා කරමින් ය. පසු දින දහවල් කාලයේ දී දෙඩම් පෙරහර කරමින් පෙරහර කටයුතු නිමා කරන්නේ ය.

1989 වර්ෂයේ දී රට තුළ පැවති අර්බුද හමුවේ පෙරහර චාරිත්‍ර පමණක් සිදු කොට ඇත.

කොරෝනා වසංගතය නිසා 2020 වර්ෂයේ පෙරහර චාරිත්‍රවලට පමණක් සීමා විය. මෙම වර්ෂයේ ද ජන

සහභාගීත්වයකින් තොරව පෙරහර චාරිත්‍ර සිදු කරනු ලබයි.

පසුගිය දශක දෙක තුළ මහියංගණය රාජ මහා විහාරස්ථානය විහාරාලංකාරය අතින් රමණීය පුණ්‍ය භූමියක් කරන්නට මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශ්වයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝ සභික උරුලෑවත්තේ ශ්‍රී ධම්මරක්ඛිත නාහිමිපාණන් වහන්සේ ගේ කැප කිරීම පැසසුම් කටයුතු ය.

මහියංගණ රාජමහා විහාරවාසී
**මන්දාරම්නුවර යසස්සි හිමි**



ආදි වාසී නායක තම වැසියන් සමඟ පෙරහරේ ගමන් කරමින්





ආදි වාසී දෙඩම් පෙරහර




# දුෂ්කර පළාත් රෝහල් සඳහා වෛද්‍ය උපකරණ පරිත්‍යාගයක්

ශ්‍රී ලංකාවේ දුෂ්කර පළාත්වල රෝහල් 35ක් වෙත කොවිඩ් ප්‍රතිකාර සඳහා අත්‍යවශ්‍ය රුපියල් ලක්ෂ 287ක් වටිනා ඔක්සිජේනරේටර්, ඔක්සිමීටර්, අධෝරක්ත උෂ්ණත්වමාන, මුඛ ආවරණ ඇතුළු වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම කැලණිය මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතන ප්‍රධාන ශාලාවේ දී පසුගිය දා සිදු කෙරිණි.

කැලණිය මානෙල්වත්ත නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ උපකුලපති ආචාර්ය පූජ්‍ය බෝදාගම චන්දිම නාහිමියන් විසින් මෙම වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සිදු කරනු ලැබිණි. සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක ජගත් සුමතිපාල, විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය යන මහත්වරු ඇතුළු වෛද්‍ය නිලධාරීන් පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.

**මහේෂ් සේනාධීර**

# බුදුරජාණන් වහන්සේ වන්දනා කරමු

ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝක විදූ අනුත්තරෝ පුරිස දම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවාති.

**බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි**
**යේච බුද්ධා අතීතාච – යේච බුද්ධා අනාගතා**
**පච්චුප්පන්නාචයේ බුද්ධා – අහං වන්දාමි සබ්බදා**
**නත්ථි මේ සරණං අඤ්ඤං – බුද්ධෝ මේ සරණං වරං**
**ඒතේන සච්ච වජ්ජේන – හෝතු මේ ජය මංගලං**
**උත්තමංගේන වන්දේහං – පාදපංසුවරුත්තමං**
**බුද්ධෝයෝ ඛලිතෝ දෝසෝ – බුද්ධෝ ඛමතු තං මමං**

ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු පූජාවන් ලැබීමට සුදුසු ය යන අරුතින් අරහං නම් වන සේක. සියල්ල තමන්ගේ ඥාණයෙන් ම මනා කොට දැන ගත් සේක. යහපත් ගමනින් හා වදනින් යුතු වන සේක. ලෝකය දන්නා සේක. අන් අයට හික්මවන්නට නොහැකි වූවන් හික්මවීමෙහි හැමට ම වඩා සමත් වූ සේක. දෙව් මිනිසුන් සහිත සියල්ලට ම ගුරු වූ සේක. සත්‍යය අවබෝධ කළ සේක. සියලු පව් නැසූ සේක.

මම නිවන් දකින තෙක් බුද්ධ රත්නය සරණ යමි. අතීතයේ බුදු ව වැඩ සිටි, මෙ කල බුදු බව ලැබූ, මතු බුදු බව ලබන සියලු බුදුවරුන් මම හැම කල්හි වඳිමි. මට බුදුරදුන් හැර වෙන පිහිටක් නොමැත. බුදුරජාණන් වහන්සේ මාගේ උතුම් පිහිටයි. මේ සත්‍ය වචනයේ බලයෙන් මට ජය මංගල්‍යයක් වේවා! බුදුරජාණන් වහන්සේගේ උතුම් පා තැබූ තැන වූ, සිරිපා දූවිල්ල ද මම හිස නමා වඳිමි. බුදුරජාණන් වහන්සේට මගෙන් සිදු වූ යම් වරදක් වේ නම් උන් වහන්සේ එයට සමාව දෙන සේක්වා!

**රාස්සගල චන්දකිත්ති හිමි**

02 පිටුවෙන්...

# නොහැකියාව ගැන ....

ඔහු උපතින් ම නො හැකියාව උරුම කර ගත්තෙකි. උපදින්නේ මසුරු පියකු උරුම කර ගෙන ය. ඔහුට පියකරු ආබරණ පමණක් නොව, පෝෂ්‍යදායි ආහාරත් නැත. අසනීප වූ විට ඊට නිසි ඖෂධ නො ලැබෙයි. එවන් දුර්වලතා තිබුණ ඔහුට දන් දෙන්න, සිල් රකින්න, බණ අහන්න, පින්කම් කරන්න අවස්ථාව නොතිබුණි. ඔහුට කළ හැකි වූ දෙය දැකීම හා හා සතුටු වීම පමණි. බුදු රදුන් ගේ ප්‍රතිරූපය දෙස බලා ඔහු ප්‍රසන්න සිතකින් සතුටු විය. එක් ක්ෂණයකින් ඔහු මරණයට පත් වෙයි. ජීවිතයට ම කළ යහපත් ක්‍රියාව ප්‍රසන්න සිතකින් සතුටින් සිනා වීමයි. ඒ නිසා ම ඔහු පරලොව ජීවිතයෙහි අභිවෘද්ධිය උරුම කර ගත්තෙක් විය. මෙයින් අපට දෙන මහා ආදර්ශයක් වෙයි. නො හැකියාව ගැන කෙඳිරිගාමින් සිටිනවා ට වඩා කළ හැකි අල්ප දෙයක් හෝ කරන්නේ නම්, ඒ තුළින් අප ගේ අභිවෘද්ධිය සාධනය කර ගත හැකි බව යි. එය ප්‍රසන්න සිතුවිල්ලක් විය හැකි ය. මිහිරි වදනක් විය හැකි ය. ප්‍රිය මනාප ක්‍රියාකාරකමක් විය හැකි ය. යමක් කරන්නට තිබෙන නොහැකියාව සම්බන්ධ ව පසු තැවිලි වෙමින් සිටිනවාට වඩා, අනාගතය පිළිබඳ ව අපූර්ව ප්‍රාර්ථනා කරමින් සිටිනවාට වඩා මේ මොහොතෙහි දී කළ යුතු දෙයක් වේ නම් එය කළ යුතු යි. එසේ කරන්නට හැකි නම් ඒ තුළින් දියුණුව උදාවෙයි. එය ප්‍රසන්න මනසක උපන්න යහපත් ක්‍රියාවක් නම්, ඒ තුළින් ලබන දියුණුව සංසාර ගමනේ අනන්තයට යයි. මේ ලොකේ දියුණුව ඇති කරයි. පරලොව දියුණුව ඇති කරයි. ලොකෝත්තර දියුණුව ඇති කරයි.

මෙය සාම්ප්‍රදායෙන් තොර ප්‍රබුද්ධ දැක්මයි. ප්‍රගතිශීලි දැක්මයි. සියල්ල ලැබෙන්නේ ප්‍රසන්න සිත තුළිනි. සියල්ලට මුල් වන්නේ සිතයි. සියල්ලට නායකත්වය ගන්නේ සිතයි. සියල්ල සිතට අයත්, සිතින් ම උපදින දේ යි. කෙනකු ගේ පරිහානිය හෝ දියුණුව තීරණය කරනුයේ සිත යි. දියුණුවේ පදනම සිත යි. එසේ නම්, පදනම ශක්තිමත් කර ගත යුතු යි. පදනම පිරිසුදු කර ගත යුතු යි. පදනම ලස්සන කර ගත යුතු යි. එසේ වූ විට එම පදනම මත ගොඩ නැගෙන ජීවිතය ශක්තිමත් වෙයි. පිරිසුදු වෙයි. අලංකාර වෙයි. ලස්සන වෙයි. එම නිසා සියලු ක්‍රියාකාරකම්, සියලු වචන, සියලු සිතුවිලි ප්‍රසන්න සිතක උපදවමු. එසේ වූ කල එම දියුණුව තමා අත් නොහරින සෙවනැල්ලක් හා සමාන වෙයි. සෙවනැල්ල කිසිදා අප අත් නොහරී. සෙවනැල්ල ආලෝකය ඇති විට පෙනුණ ද, ආලෝකය නැති විට ද සිටියි. අප ගේ ජීවය නැති වුව ද අප්‍රාණික මෘත කලේබරය හා සිටියි. යළි උපදින විට ඒ උපත සමඟ ම සෙවනැල්ල ද උපදී. සෙවනැල්ල නැති වන්නේ අප නැති වූ දාටයි. අප නැති වන්නේ නිවන් දුටු දාටයි. එසේ නම් මේ සෙවනැල්ලේ උපමාව තුළින් ප්‍රකට කරනුයේ නිවන් දක්නා දවස දක්වා ප්‍රසන්න සිතින් කළ කී හා සිතූ දෙයෙහි ප්‍රතිඵලය භුක්ති විඳිය හැකි බව යි. දියුණුව තමා තුළ වෙයි. එහෙත් එය දකින්නට සිත දියුණු කර නො තිබීම අවාසනාවකි.

එක් මිනිසකුට දියමන්ති ආකරයක හිමි කරුවකු වෙන්නට අවශ්‍ය විය. ඔහු තමා සන්තක සියලු දේපළ විකුණා දියමන්ති ගෙන එන්නට අප්‍රිකාවට යයි.

ඔහු තම මුදලින් යැපෙමින් දියමන්ති සෙව්ව ද ඔහුට දියමන්ති හිමි නොවිණි. වස්තුව විකුණා ගත් මුදල අවසන් ව ඔහු මහ මඟට වැටිණි. එහෙත් ඒ දේපළ මිළ දී ගත් අය දිනක් එම ඉඩමෙහි ඇති ගලක් දකියි. ඔහු එම ගල පිළිබඳ සොයා බලයි. එය දියමන්ති ඇති තැනක දක්නට ලැබෙන ගලකි. ඔහු එම ඉඩමෙහි දියමන්ති තිබේ දැයි සොයන්නට ඉඩම කණියි. ඔහුට දියමන්ති හමු වෙයි. අවසානයේ ඔහු විශාල දියමන්ති ආකරයක හිමි කරු වෙයි. අප තුළ, අප සිටින භූමිය තුළ අප ගේ දියුණුව පවතියි. කළ යුත්තේ වෙනස් ව සිතීමයි. එසේ සිතා කළ හැකි දේ කිරීම යි. ඒ සඳහා අනවශ්‍ය පෙරනිමිති කිව යුතු නැත. කේන්ද්‍රයෙන්, ග්‍රහ නක්ෂත්‍රවලින් දියුණුව සොයන්නේ, නොපෙනෙන දෙවියන් ගෙන් දියුණුව ඉල්ලන්නේ සිත නොදියුණු මිනිසුන් ය. යමක් කරන්නට පෙර කාලගෝල න්‍යාය ද නොගැළපේ. කාලගෝලයා ගඟට නොබැස ගං තීරයේ සිට ගඟෙහි ගැඹුර දකියි. එහෙත් ගඟට බැස්ස පසු ඔහු සැබෑ ම ගැඹුර දකියි. අපත් එසේ පෙර නිමිති පිළිබඳ දැඩි විශ්වාස නොමැති ව කළ හැකි දේ කළ යුතුයි.

දිවි මගෙහි දියුණුවේ පදනම වූ සිත ශක්තිමත් කරමු. පෝෂණය කරමු. පිරිසුදු කරමු. අලංකාර කරමු. සිත වඩන සමථ විදර්ශනාදී වූ භාවනාවක නිරත වෙමු.

# එක බොරුවක් වසා ගන්නට බොරු සියයක් කියන දරුවකු නොව වරද පිළිගෙන නිවැරැදි වන දරුවකු රටට දායාද කරමු

**බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ දරුවන් ගේ පූර්ව ආචාර්යයන් වන්නේ මව්පියන් බවයි. මුලින්ම දරුවාට හොඳ නරක කියා දෙන්නේ ඔවුන්. ඒ නිසා මව්පියන් දරුවා අයහපතෙන් වළක්වා යහපතේ යොදවන්නට නිරන්තරයෙන් ම උත්සාහ කරනවා.**

සෑම අම්මා කෙනෙක් ම, සෑම තාත්තා කෙනෙක් ම කැමැති තමන් ගේ දරුවා සමාජයට බරක් නොවී හොඳ ගුණ යහපත් දරුවෙක් වෙනවා දකින්නයි. දරුවා සමඟ වැඩිපුර ම රැඳෙන්නේ අම්මා. සාමාන්‍ය ව්‍යවහාරයේ දී ත් දරුවකු නොමඟ ගියහොත් අම්මාට තමයි සමාජයෙන් චෝදනා එල්ල වෙන්නේ. එනිසා අම්මා කියන වචනය තුළ බොහෝ වගකීම් ගැබ්වෙලා තිබෙනවා. පවුලක මවක් වඩාත් දක්ෂ විය යුත්තේ දරුවන් ගේ දුර්වලතා වගේ ම හැකියාවන් තේරුම් ගෙන යහපත, අයහපත නිවැරැදිව තේරුම් කර දෙන්නට යි.

අද අප සමාජයේ තිබෙන පරිසරයත් එක්ක දරුවෙක් නොමඟ යෑමට තිබෙන ඉඩකඩ වැඩියි. එහිදී මව්පියන්ට ලොකු වගකීමක් තිබෙනවා දරුවා අයහපතින් මුදවා ගන්න. සමාජය විවෘත යි. එදා ට වඩා මේ සමාජය දියුණු වුවත් ගුණධර්ම පරිහානිය වේගවත්. විෂම හැසිරීම් තිබෙන මිනිසුන් බහුල යි. අන්තර්ජාල පහසුම් සුලභ යි. සමාජය ගැන දැනුමක් නැති දරුවා විෂම මිනිසුන් ගේ පහත් අදහස්වලට හසුවිය හැකියි. මගේ අම්මා මා හැදූ ආකාරයට මමත් මගේ දරුවා හදාගන්නවා කියා යම් මවක් සිතුවොත් සමහර විට එය අසාර්ථක විය හැකි යි. ඒ, එදා සමාජය සහ අද සමාජයේ ඇති වෙනස්කම් නිසා. ඒ නිසා වැඩිහිටියන් නිරන්තරයෙන් දරුවා ගේ හැසිරීම් ගැන අවධානයෙන් සිටිය යුතු යි. හොඳ නරක දෙකේ දී ම දරුවා සමඟ ඉතා කුළුපගව මව්පියන් සිටියොත් ඒ දරුවා පෙළෙඹෙනවා, තමාට හරිගිය දේ ත්, වැරැදුණ තැනත් විශ්වාසයෙන් ඔවුන් සමඟ කියන්න. දරුවාට සමහර දේ අනතුරක් කියා නො තේරුණත් මව්පියන්ට පුළුවන් දරුවා වරදින් ආරක්ෂා කර ගන්න. වැඩිහිටියන් ගේ ක්‍රියාකලාපය අනුවයි දරුවා යමක් කියන්නේ, කරන්නේ. දරුවා තුළ පූර්ණ විශ්වාසයක් ගොඩනඟා ගැනීමට මව සහ පියා සමත් විය යුත්තේ එනිස යි. වැරැදි අරමුණක් තුළින් ඉදිරියට හඹායාම ළමා මෙන් ම තරුණ වයසේ ස්වභාවයක්. එය මැනවින් වටහා ගෙන සිටීම සමාජයේ ම වගකීම යි.

අපේ සමාජයේ බොහෝ මව්පියන් දුක සේ යමක් උපයාගෙන ඒ සියලු දේ දරුවන් වෙනුවෙන් වියදම් කරනවා. දරුවාට පවුලේ තිබෙන ආර්ථික ප්‍රශ්න ගැන දැනෙන්නට ඉඩ දෙන්නේ නැහැ. එවිටත් දරුවාට පවුල ගැන හැඟීමක් නැතිව යනවා. "මගේ මව්පියන් කොතරම් දුක සේ ද මා හදාවඩා ගන්නේ" කියා දරුවාට අනුකම්පාවක් නැති නිසාත්, ඔවුන් අයහපතේ යෙදීමට ඉඩකඩ තිබෙනවා. සමාජයේ සිදුවන විෂම ක්‍රියා ගැන දරුවා සමඟ වැඩිහිටියන් නිතර සාකච්ඡා කිරීම තුළිනුත් එහි තිබෙන භයානක තත්වය දරුවාට කියා දීම තුළිනුත් දරුවා වරදින් මුදා ගත හැකියි. "මගේ දරුවා එසේ කරන්නේ නැහැ" කියා බොහෝ මව්වරු දරුවා ගැන අසීමිත විශ්වාසයක් තබනවා. එ මඟිනුත් දරුවා ගේ ජීවිතයට යම් බලපෑමක් සිදුවිය හැකි යි.

මීට වසර දෙක තුනකට පෙර සමාජයෙන් චෝදනාවක් එල්ලවුණා දරුවාට ජංගම දුරකතනය, අන්තර්ජාල



පහසුකම් ලබා දෙන්න එපා. එයින් දරුවාට අයහපතක් සිදුවෙනවා කියා. එහෙත් මේ වනවිට කුඩා දරුවා ගේ සිට තරුණ දරුවා දක්වා ම එය ලබා දීමට මව්පියන්ට සිදුවී තිබෙනවා. දුරස්ථ අධ්‍යාපනය මේ කාලයේ දී අත්‍යවශ්‍ය වී තිබෙනවා. මේ අන්තර්ජාල පහසුකම්වලින් දරුවා අයුතු ප්‍රයෝජන ගත්තොත්, දුරාචාරයට ඇබ්බැහි වුවහොත් දරුවා ගේ මුළු ජීවිතය ම විනාශ වෙලා මෙලොව පරලොව දෙක ම අසාර්ථක වෙන්න පුළුවන්.

සාමාන්‍යයෙන් අම්මා කාර්ය බහුලයි. ඇයට තිබෙන වැඩ කටයුතු බොහෝ යි. එහෙත් දරුවා මඟ ඇරුණොත් එය ඒ පවුලේ අයහපත පිණිස පවතින්නට පුළුවන්. එනිසා කො තරම් වැඩ තිබුණත් දරුවන්ට අවධානය යොමු කිරීම මව්පියන් ගේ මෙන් ම පවුලේ වැඩිහිටියන් ගේ ද වගකීම වෙනවා. එහිදී අම්මාට විවිධ උපක්‍රම භාවිත කිරීම තුළින් සමහර ගැටලුවලට විසඳුම් ලබාගත හැකි වෙනවා. දරුවා අන්තර්ජාල අධ්‍යාපන කටයුතු කරද්දී නිවසේ පොදු තැනක් ඒ වෙනුවෙන් වෙන් කිරීම, ඒ අවස්ථාවේ දී නිවසේ නිහඬබව රැක ගැනීම, ආදී දේ තුළිනුත් යම් යම් ප්‍රශ්න මඟ හැරේවි. මව්පියන් නවීන තාක්ෂණය ගැන දැනුවත් නැතිනම්, ඒ ගැන දැනීමක් ඇති කෙනකුලවා හෝ දරුවා ගැන සොයා බැලීම තුළින් "අම්මා මම ගැන සෙවිල්ලෙන් ඉන්නේ" කියන අදහස දරුවා තුළ ඇතිවීම තුළිනුත් වරදට බිය වෙනවා.

මෙහිදී අම්මා වගේ ම තාත්තාත්, අනෙක් වැඩිහිටියනුත් කළ යුත්තේ දරුවාට අනතුර ගැන අවබෝධයක් ලබා දීමයි. දරුවා කුඩා කාලයේ පටන් "පුතේ අපේ ජීවිතවලට මේ වගේ අනතුරු අන්තර්ජාලයෙන් ඇති වෙනවා" කියා පරිස්සමත් එහි වැදගත්කමත් දරුවාට මනා ලෙස කියාදීම අප ගේ වගකීම යි. සෑම දෙයක දී ම දරුවාට එපා...එපා... නො කියා එහි ඇති අනතුර දරුවාට පැහැදිලි කර දෙන්න. යම් දරුවකු පරිගණක ක්‍රීඩාවට ඇබ්බැහි වී සිටියොත් ඒ දරුවාට මෙලොව දී ම එහි ආදීනව අත්දකින්නට සිදු වෙනවා. අධ්‍යාපනය කඩාකප්පල් වෙනවා, කායික රෝගවලට ගොදුරු වෙනවා, මානසික ව රෝගී වෙනවා, යහළුවන්, ඥාතීන් අහිමි වෙනවා කියා පැහැදිලි කර දෙන්න. ඒ වගේ ම පරලොව ජීවිතය අසාර්ථක වන ආකාරය කියාදීමත් වැඩිහිටි, ගුරුවරුන් ගේ වගකීම යි.

> අපේ සමාජයේ බොහෝ මව්පියන් දුක සේ යමක් උපයාගෙන ඒ සියලු දේ දරුවන් වෙනුවෙන් වියදම් කරනවා. දරුවාට පවුලේ තිබෙන ආර්ථික ප්‍රශ්න ගැන දැනෙන්නට ඉඩ දෙන්නේ නැහැ. එවිටත් දරුවාට පවුල ගැන හැඟීමක් නැතිව යනවා.

යම් දරුවෙක් පින, පව හඳුනනවා නම්, පිනට කැමැති නම්, පවට අකමැති නම් කවදාවත් අකුසල් කියන දේ ඒ දරුවා අතින් සිදුවන්නේ නැහැ. දහමේ හැසිරෙන දරුවා මව්පියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට නිසි ලෙස ගෞරව කරනවා. දරුවෙක් යහමඟ යොමු කිරීමේ පූර්ණ වගකීම තිබෙන්නේ මව්පියන් අතේ. නිවසේ සියලු දෙනා දිනපතා බුද්ධ වන්දනාව කරනවා නම්, පිරිත් කියනවා නම්, දහම් කතාවේ යෙදෙනවා නම් දරුවා කවදාවත් අයහපතට යොමු වන්නේ නැහැ. ඒ සියලු දෙයට කුඩා කල සිට ම දරුවා යොමු වෙනවා. ඔහු වැඩිහිටියකු වුවත් ඒ දේ ජීවිතයේ එක් අංගයක් කර ගන්නවා. ඔහු තමා ගේ දරුවන්ටත් යහපත් දේ කියා දෙන්නේ ඒ පුරුද්ද තුළින්. ඒ නිසා මුලින් ම අම්මා දැහැමි විය යුතුයි. අම්මා රූපවාහිනියේ සියලු නාට්‍ය බැලීමට පුරුදුව සිටිනවා නම්, දරුවා ද එයට යොමු වීම ස්වභාවය යි. ධර්මයක් නැති දරුවා නිවස තුළ කෙතරම් රැක්කත් ඔහු සමාජයට ගිය දිනට පව, පින ගැන විශ්වාසයක් නැති නිසා නො මඟ යාමට පුළුවන්. එනිසා මව නිතර ම දරුවා තුළ කර්මය, කර්මඵලය ගැන පැහැදීමක්, විශ්වාසයක් ඇතිකිරීම වැදගත් වෙනවා. දරුවාට එබඳු දේ කියා දීමට නම් මව පින, පව විශ්වාස කරන්න ඕනෑ. අප සිතන තරම් සමාජය දැහැමි නැහැ. බොහෝ දේ නිසා දරුවා මානසික පීඩාවෙන් සිටින්නේ. ඒ පීඩා මඟ හරවා ගැනීමට ඔවුන් දුරකතනයට ඇබ්බැහි වෙන්න පුළුවන්. එහෙත් නිවසේ නිතර ම බුදු ගුණ, දම් ගුණ, සඟ ගුණ ඇසෙනවා නම්, පිරිත් සජ්ඣායනා වෙනවා නම්, බෝධි වන්දනා, සෑ වන්දනා කවි ඇසෙනවා නම් දරුවා ඒවාට සවන් දෙන්න පුරුදු වෙනවා. ඒ තුළින් ඔහු ගේ මානසික පීඩාව දුරු වෙනවා.

එනිසා මවකට පවුලේ ආර්ථික ප්‍රශ්න කොතරම් තිබුණත් ඇය දහමේ හැසිරෙනවා නම්, ඒ පවුල තුළ නිතර ම සතුට, සමාදානය පවතිනවා. දරුවා කුඩා කාලයේ පටන් ම සිල් රකින දරුවෙක් නම් පවට බය වෙනවා. ඔහු වරදක් කළ විට "පුතා ඔයා මේ දේ කළා ද?" කියා විමසූ විට ඒ වරද වසා ගැනීමට බොරු සියයක් කියන දරුවෙක් සමාජයට දායාද නො කර ඒ වරද පිළිගෙන නිවැරැදි වෙන දරුවෙක් සමාජයට දායාද කිරීම වැඩිහිටියන් ගේ පරම යුතුකමයි.

නයනා නිල්මිණී

දුටුගැමුණු මහ රජතුමා 49

# සිරිනාග අද මෙහි පැමිණියේ රාජකාරි කටයුත්තකට ද?

**සිරිනාග මහියංගනයට පැමිණෙන විට හිරු බැස යමින් තිබිණි. මහියංගන විහාරයට යන්නට පෙර මේ ගමනෙහි අරමුණ පිළිබඳ විහාරාධිපති වහන්සේට ත්, දිඝාභයට ත් කරුණු කියන්නට සිදු වන බව දත් ඔහු මදක් කල්පනා කළේ ය.**

"මහියංගන ගම්මාන දෙකක සිදු වූ කොල්ලකෑම් හා මිනිස් ඝාතන ගැන සොයා බලා වාර්තා කරන ලෙසට මට දැනුම් දී තිබෙනවා. ඉදිරියේ දී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමත්, ඒ ගමන් ම මහියංගනයට සිදු වී ඇති අලාභ හානිය ගැන සොයා බැලීමත් සඳහා යි එන්නට සිදුවුණේ."

සිරිනාග ගේ සිතට සතුටක් ඇතිවිය. දිඝාභය ගේ ත්, විහාරාධිපති ස්වාමින් වහන්සේ ගේ ත් ප්‍රසාදයට හේතු වන හොඳ අරමුණක් සිතා ගත් ඔහු, කඩයකට ඇතුළු වී ඔසු පැන් බඳුනක් බී ගමන් විඩාව මගහරවා ගත්තේ ය. නැවත මහියංගන විහාරය දෙසට ගමන් ඇරඹීය.

සිරිනාග විහාරයේ පහත මලුවේ කොනක අසු රඳවා පඩිපෙළ නගින්නට සූදානම් වුවා පමණි. ඔහුට තමන් අමතන හඬක් ඇසිණි. නැවතී හඬ ආ දෙස බැලූ ඔහු දුටුවේ පහත මලුවේ ඈත කොනක බෝධිය අසල පියගැට පෙළ මත හිඳගත් ස්වාමින් වහන්සේ නමක් හා ඒ අසල ම ගල් පොත්තක හිඳගත් දිඝාභය මහා සෙනෙවි ය.

තමා පැමිණි ගමන සාර්ථක වනු ඇතැයි සිතූ සිරිනාග සතුටු සිනාවකින් යුතු ව ඒ දෙසට පා නැගී ය.

"සිරිනාග, මොකද අද මෙහි?" රාජකාරි කටයුත්තකට ද?"

"ඔව්, රාජකාරි කටයුත්තකටයි ආවේ. විනාශයට පත් වූ ගම්මාන ගැන සොයා බලන්නයි ආවේ. ඒ ගමන් ම විහාරස්ථානයටත් ඒමට සිතුණා"

"සිරිනාග තොප තමන්ට අයත් රාජකාරිය හරියට කරන ශූර සෙනෙවියෙක්. තොප මගේ කඳවුරට එනවා නම් මම බොහොම කැමතියි. සිරිනාග හඳුනන්නේ නැතිව ඇති. මේ කැලණිය රජමහ විහාරයේ පිණ්ඩපාතික තිස්ස ස්වාමීන් වහන්සේ. කැලණිය රාජධානියේ සිව රජතුමා ගේ මලණුවන්. විහාරමහා දේවිය ගේ සහෝදරයා."

"අහලා තිබෙනවා. අද තමයි දැක්කේ. සෝම චෛත්‍යයත්, සේරු චෛත්‍යයත් ඉදි කිරීමට කාවන්තිස්ස මහා රජතුමා සමඟ එහි ගොස් වැඩ සිටි බව අසා තිබෙනවා. ඔබ වහන්සේ ගැන හැමෝ ම කතා කළේ ප්‍රසාදයෙන්. ඒ රාජ්‍ය දෙක ම මාගම රාජ්‍යයේ ප්‍රාන්ත රාජ්‍ය දෙකක් වීමත් එයින් සිදු වූ යහපත් ප්‍රතිඵලයක්.

තිස්ස ස්වාමින්වහන්සේ ගේ මුවගට සිනාවක් නැගිණි. දිඝාභය උන්වහන්සේට සිරිනාග හඳුන්වා දුන්නේ ය.

"ස්වාමින් වහන්ස, මේ අනුරාධපුර රාජධානියේ ඉතාමත් දක්ෂ සෙනෙවියෙක්. සිරිනාග "

"හොඳයි, අනුරාධපුරයේ මම දින දහයක් පමණ නැවතී සිටියා. මගේ සිතට කිසි සහනයක් ඇතිවුණේ නැහැ. වෙහෙර විහාර සියල්ල ම කොල්ල කාලා. පෙති පිළිම විනාශ කරලා. මහා විහාරයට සිදු කර ඇත්තේ අපරාධයක්. බෞද්ධයන්ට නොයෙකුත් තර්ජන. එළාර ගේ ධර්මිෂ්ඨකම මහා බොරුවක්."

දිඝාභය සිරිනාග දෙස බැලුවේ ය. සිරිනාග දිඝාභය දෙස බැලී ය. දිඝාභය ගේ මුහුණ අඳුරු වී ඇත.

"මට දුක අපේ හාමුදුරුවරු එළාර රජමාළිගයේ දන් වැළඳීමට යන එක ගැනයි. ඔවුන් ගේ මේ හැසිරීම මට හරිම පිළිකුල්. මා මෙහි පැමිණියේ ඒ උදවියට හොඳ හැටි කරුණු පැහැදිලි කරලයි."

"දිඝාභය, සිරිනාග වුණත් ජාතිද්‍රෝහී පිරිස්. අපේ රටට ද්‍රෝහිකම් කරන, බුද්ධ ශාසනය විනාශ කරන පිරිසකට සිංහලයෙක් සේවය කරනවා නම්, ඔහු ගැන ඇසීමත් පාපයක්. බුද්ධ ශාසනය රැක ගන්න තුන් සිංහලය එක්සේසත් කර ගන්න කටයුතු කරන කාවන්තිස්ස රජතුමා ගේ පුතෙක් ජාතියේ සතුරු පිළට සේවය කරනවා. අභාග්‍ය සම්පන්න කාලයක ම මිසක් වෙනත් කාලයක මෙහෙම ඒවා අසන්නට පුළුවන් ද? "

සිරිනාග ගේ මුහුණෙහි දක්නට ලැබුණු සිනහව දිඝාභයට පෙනී ගියේ උපහාසාත්මක ලෙසිනි. සිනහව සඟවා ගන්නට උත්සාහ කරමින් ඔහු තිස්ස හිමියන් ගෙන් ප්‍රශ්නයක් ඇසීය.

"ස්වාමින් වහන්ස , ඔබ අප දෙදෙනා ගැන එසේ පැවසුවත් සෝම සේරු රාජ්‍යවල අභය, මහාසිව රජවරුන් දෙදෙනා එළාර රජතුමාට යටත් භාවය පළ කරමින් කප්පම් ගෙවීමට කැමැත්ත පළ කර සිටින බවට ආරංචියි. "

"මේ දිඝාභයටත් උවමනා කර තිබෙන්නේ ඒ දේ ම යි. දිඝවාපියටත් උවමනා කර තිබෙන්නේ ඒ දේමයි. දීඝ වාපියත් අනුරාධපුරයේ ප්‍රාන්ත රාජ්‍යයක් කර ගැනීමට එළාරට වුවමනා වෙලා තියෙනවා. තිස්ස ගැමුණු අයියණ්ඩියට ද්‍රෝහී වෙලා. මගේ සහෝදරියත් දීඝ වාපියට ඇවිත් සිටින්නේ මේවා අනුමත කරන්න ද? කියා දැන ගැනීමට මම හෙට උදෑසන ම දීඝවාපියට යනවා.

මේ කතාබහ නොරිසි වූ දිඝාභය තිස්ස හිමිපාණන් ගේ කතාවට බාධා කරමින් සිරිනාග ඇමතුවේ ය.

"සිරිනාග අදම ආපහු යනවා ද?"

"ගමන් වෙහෙස බොහෝයි. ඒත් අදම යන්නට යි අදහස. "

"මටත් අදම යන්නට ඇත්නම් හොඳයි. "

"ඒක හොඳයි. දෙදෙනා ම එකට යන්න. දෙදෙනා ම හිතන්න යා යුත්තේ කොහාට ද කියා?"

තිස්ස හිමිපාණන් ගේ එම ප්‍රකාශය දෙදෙනාට ම එල්ල කළ උපහාසයක් විය.

මාහිමිපාණන් වහන්ස, අපට යන්නට අවසර " දෙදෙනා ම තිස්ස හිමිපාණන්ට වැඳ නැගී සිටියහ.

"හෙට උදෑසනින් ම මමත් දිගාමඩුල්ලට යනවා. තිස්ස රජතුමා හමුවීමටත් යනවා. රට එක්සේසත් කිරීමේ සටනට කිසිවකුත් පාවා දෙන්නට ඉඩ දෙන්නට බැහැ. සේරු, සෝම රාජ්‍ය දෙකේ රජවරු හමුවී එතැනින් මාගමට යනවා. දුටුගැමුණු රජතුමා ගේ සටන් පෙරමුණේ මමත් එනවා."



තමා පැමිණි කටයුත්ත සම්පූර්ණයෙන් ම අසාර්ථක වී ඇති බවට සලකුණු දිඝාභයගේ මුහුණේ පිළිඹිබු වන බව සිරිනාගට අවබෝධ විය. පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ කෙරෙහි ඔහු ගේ සිතෙහි මහත් ප්‍රසාදයක් ඇතිවිය.

දිඝාභය කුමරු සමග විජිතපුර බලකොටුවට පැමිණි සිරිනාග එදින රැය එහි ගත කළේ ය. එළාර රජු ගේ ඉල්ලීම මත යන්නට සිදු වුණත්, මහියංගනයට ගොස් පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ හමුවීම කැමැත්තකින් නොකළ බව දිඝාභය කිවේ ය. මේ ප්‍රතිඵලය හිමි වන බව දැන දැන ම ආවේ රජතුමා ගේ සිත සතුටු කිරීමට උවමනා නිසා බව ඔහු කී ය.

"මහ සෙනෙවිතුමනි, විජිතපුර බලකොටුවේ දී ඔබතුමා හමු වන ලෙස දූතයකු ගෙනා පණිවිඩය අනුව එන්නට සූදානම් වන විටයි ඔබ විජිතපුර බලකොටුවේ නැති බව මිත්‍ර සෙනෙවි තුමා ගෙන් දැන ගත්තේ "

"ඔව්, මෙය හදිසි ගමනක් වුණා. ඒත් මේ රහසිගත ගමන මිත්‍ර දැන ගත්තේ කොහොමද ?"

"උපතිස්ස පැවසුවා විය හැකියි. ඔහු ඊයෙත් අනුරාධපුරයේ."

"නැහැ, උපතිස්ස රහස් රකින්නකු මිස රහස් එළි කරන කෙනෙක් නොවෙයි. සමහරවිට රජතුමා ගෙන් කියැවෙන්නට ඇති"

"මිත්‍ර ගේ අදහස පිළිබඳ මට යම් සැකයක් ඇතිවෙලා තියෙනවා. සිරිනාග ගෙන්වා ගැනීමට අදහස් කළේ ඒ ගැන යමක් දැනගන්න යි. ජයනාථ සිටුතුමා ගේ ත්, කුණ්ඩල බ්‍රාහ්මණතුමා ගේ ත් වෙළඳ භාණ්ඩ කොල්ලකෑම මිත්‍ර ගේ වැඩක් බව දීඝජන්තු දැනගෙන. මේ බව රජතුමාට දැනුම් දී තිබෙනවා. ඒත් රජතුමා ඒ වෙනුවෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ.

"මිත්‍ර මහා සෙනෙවිතුමා මා සමඟ කෝපයෙන් සිටින්නේ"

"ඔව් සිරිනාග, මට කියන්නට වුවමනා කළ අනෙක් කරුණ එය තමා. ඉතා පරිස්සමින් කටයුතු කරන්න. ඔහු ගේ ආත්මාර්ථකාමී ඉලක්කවලට ඔබ යොදා ගන්නට බැරිවන විට ඔහු ඔබ ගෙන් පලි ගනීවි."

අයන්ති විතාන

ලක්දිව සංඝරාජ පදවිය 7

# ස්වාධීන සංඝ සභා ආරම්භ වෙයි

**රටේ විවිධ ප්‍රදේශවල උපසම්පදා කටයුතු ආරම්භ කිරීම සඳහා ඒ ඒ පළාත්වල ගිහි පැවිදි සම්භාවනීයයන් විසින් අදහස් ඉදිරිපත් කිරීම, වැනි හේතු කාරණා නිසා මූලස්ථානයෙන් වෙන් වූ ස්වාධීන සංඝසභා ඇති වූ බව කරුණු අධ්‍යයනයේ දී පෙනී යයි.**

ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව, ඌව ස්‍යාමෝපාලි මහා නිකාය, වනවාස සංඝ සභාව, ශ්‍රී රෝහණ සංඝ සභාව සහ රන්ගිරි දඹුලු පාර්ශ්වය යන පාර්ශ්වයන් ද සියම් නිකායේ සෙසු පාර්ශ්ව වශයෙන් සඳහන් කළ හැකි ය.

අධිමාසවාදය වැනි ශාස්ත්‍රීය වාද විවාදයන්හි ප්‍රතිඵල වශයෙන් බෙන්තර අත්ථදස්සි මාහිමි, මලිගස්පේ මංගල මාහිමි, පැපිලියානේ සීලවංශ මාහිමි, අරුක්ගොඩ සුමංගල මාහිමි සහ වලානේ සිද්ධාර්ථ මාහිමියන් ගේ මූලිකත්වයෙන් ස්‍යාම නිකායික පහතරට උපසම්පදා විනය කර්ම ආරම්භ කරන ලදී. 1856 වර්ෂයේ වැල්ලම්පිටිය නෙල්ලිගස්වත්තේ කල්‍යාණී වංශිකාරාමයෙහි ප්‍රත්‍ය පහසුකම් සපයා ගනිමින් කල්‍යාණී නදී උදකුක්ඛේප සීමාව මුල්කොට ගෙන ආරම්භ වූ අතර, මෙම සංඝ සභාව ශ්‍රී කල්‍යාණී සාමාග්‍රී සංඝ සමාගම ලෙසින් ව්‍යවහාර විය.

කැලණි ගඟ පිටාර ගැලීම ආදී දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 1894 වසරෙහි දී කෝට්ටේ රජමහා විහාරය මූලස්ථානය බවට පමුණුවා ගෙන එහි විසුංගාම සීමාවෙහි උපසම්පදා කටයුතු ආරම්භ කරන ලදී. කෝට්ටේ ප්‍රදේශයට යාමට අකමැති වූ හිමිවරු පිරිසක් විසින් මුල්ලේරියාව ගල්වාන රජමහා විහාරය ආශ්‍රිත ව කැලණි ගඟෙහි උදකුක්ඛේප සීමාවෙහි ම විනය කර්ම සිදු කරන ලදී. ගල්වාන විහාරය ආශ්‍රිත කැලණි ගඟේ බැඳි සීමාවේ උපසම්පදා කටයුතු සිදු කරන සංඝ සභාව ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝසභාව ලෙසත්, කෝට්ටේ රජමහා විහාරයේ උපසම්පදා කටයුතු සිදු කරන සංඝ සභාව කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව ලෙසත් හඳුන්වනු ලබයි.

ආරම්භයේදී උපාධ්‍යාය මූලික සංඝ සභාවක් වූ මෙම සංඝ සභාව මහා නායක පදවියක් ස්ථාපනය කොට ඇත්තේ කලක් ගත වීමෙන් අනතුරුව ය. මලිගස්පේ මංගල හිමිපාණෝ මෙහි ප්‍රථම මහා නායක පදවියට පත් වූ හ. මෙම සංඝ සභාවෙහි නායක පදවි පිරිනැමීම කවර කලෙක ආරම්භ වූයේ දැයි නිශ්චය නැති නමුදු 1910දී වාදීභසිංහ බැදිගම රතනපාල නාහිමියන් වෙත දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක පදවිය පිරිනමා තිබේ.



මලිගස්පේ මංගල මහ නාහිමිපාණන් වහන්සේ, රත්මලානේ ධර්මාලෝක මාහිමි, ඇඹුල්ගම විමලතිස්ස මාහිමි හිගුල්වල ජිනරතන මාහිමි, බටුවන්තුඩාවේ පඬිතුමා ඇතුළු වියත් පිරිස



රෝහණ සංඝසභාවෙහි උපෝසථාගාරය

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව සුවිශේෂී සංඝ සභාවකි. මෙම සංඝ සභාවේ කාරක සභික සහ නායක පදවි පිරිනැමීමේ දී දැන උගත්බවින් පිරිපුන් හිමිවරුන්ට මුල් තැන දීම නිසා උගතුන් ගේ සංඝ සභාව ලෙස සම්භාවනාවට පත් කෙරෙයි.

නිර්මාතෘ හිමිවරුන් ගෙන් පැවත එන බෙන්තර, කෝට්ටේ, ගල්ගොඩ, අරුක්ගොඩ, රත්මලාන විහාර පරම්පරා පහ සහ පසුව එක් කෙරුණු දක්ෂිණ පාර්ශ්වය වෙනුවෙන් කාරක සභික පදවි පහ බැගින් තිස් නමක ගෙන් සමන්විත උපසම්පදා කාරක සභාවක් මෙම සංඝ සභාව සතු වෙයි. එසේම ඒ ඒ විහාර පාර්ශ්ව අනුව වසර කිහිපයකට වරක් සභික හිමිවරුන් අලුතින් පත් කරන කල්‍යාණී කාරක සභාවක් ද ක්‍රියාත්මක වෙයි. සංඝ සභික පදවියක් පුරප්පාඩු වන විටදී ඒ ඒ පාර්ශ්වවලින් සුදුසුකම් සහිත හිමිවරුන් ලිඛිත සහ වාචික පරීක්ෂණවලට ඉදිරිපත් වීමට සලස්වා සාතිශයෙන් ම සුදුසු හිමිවරු සංඝ සභාවට පත් කිරීම සුවිශේෂී සිද්ධියකි.

ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවෙහි හිමිවරුන් පිරිසක් 1990 දශකයේ දී නවගමුව පාර්ශ්වය වශයෙන් බෙදී වෙන් වී වෙන ම සංඝ සභාවක් ලෙස පත් වූ ව ද වර්තමානයේ දී නැවත මුල් පාර්ශ්වය සමඟ ඒකාබද්ධ වී ඇත.

ඌව ජින ශාසනෝපකාර සමාගමේ අනුග්‍රහය මත වැලිමඩ කැප්පෙටිපොල පාලුගම ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානය සහ කලබුළුලන්ද පුරාණ විහාරස්ථානය මූලස්ථාන කොට ගනිමින් 1939 වසරේ දී බොරගොල්ලේ සෝමානන්ද මාහිමිපාණන් වහන්සේ ගේ මූලිකත්වයෙන් ඌව ස්‍යාමවංශික නිකාය හෙවත් සියම් මහ නිකායේ ඌව පාර්ශ්වය ආරම්භ කරන ලදී. සියම් මහ නිකායේ ආරණ්‍ය සම්ප්‍රදාය සුරක්ෂිත කොට පවත්වා ගෙන යාම සඳහා වතුරුවිල ඤාණානන්ද මාහිමිපාණන් වහන්සේ ගේ මූලිකත්වයෙන් 1950 දශකයේ ආරම්භ කළ වනවාස සංඝ සභාව 1969 වර්ෂයේ සිට රජයේ ලියාපදිංචි සංඝ සභාවක් වශයෙන් වෙන ම උපසම්පදා කිරීම් සිදු කරනු ලබයි.

පුරාවිද්‍යා චක්‍රවර්තී කඹුරුපිටියේ වනරතන මාහිමිපාණන් වහන්සේ ගේ මූලිකත්වයෙන් සියම් මහ නිකායේ ශ්‍රී රෝහණ සංඝ සභාව ආරම්භ කොට 1986 වසරෙහි පටන් තිහගොඩ ඌරාපොල රතනජෝති පිරුවන් විහාරය සහ මාතර පරෙයිදූව සීමාමාලකයෙහි උපසම්පදා කටයුතු සිදු කරනු ලබයි. එම වකවානුවේ දී ම රන්ගිරි දඹුළු රජමහා විහාරයේ උයන්වත්ත විහාරය ආශ්‍රිත ව සියම් මහ නිකායේ රන්ගිරි දඹුළු පාර්ශ්වය ද ආරම්භ කොට උපසම්පදා කටයුතු සිදු කරනු ලබයි. මෙම සෑම සංඝ සභාවක් මඟින් ම සුදුසුකම් සපුරා ඇති හිමිවරු වෙත නායක පදවි සහ ගෞරව නාම සම්මුති පිරිනැමීම සිදු කරනු ලබයි.





## නිසරු බිමක ඉදිකළ සාරවත් පින්කෙත

# කොවුල්වැව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය



වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පිහිටා තිබෙන කොවුල්වැව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය වර්ෂ 1947 දී පමණ ගොඩනගන ලද්දකි.

මුතුගල විහාර පරපුරෙහි විහාරස්ථානයක් වන ඇටම්පොල ශ්‍රී ක්ෂේත්‍රාරාමාධිපති කොවුල්වැවේ ඛේමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ ශිෂ්‍යවරයන් වහන්සේ දෙනමක් විය. ඒ අතුරින් ඇකිරියගල සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම කොවුල්වැව වර්ධනාරාම විහාරස්ථානයෙහි ආදි කර්තෘවරයා ලෙස සැලකිය හැකි ය . ගිණිගත්පිටිය සංඝ පරපුර නියෝජනය කළ මල්වතු පාර්ශවයේ කාරක සංඝ සභික, එවකට සංඝරාජ පිරිවෙනෙහි පරිවේණාධිපති මහනුවර බූවැලිකඩ ශ්‍රී වර්ධනාරාමාධිපති මාබෝපිටියේ මෙධංකර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ සහ කොවුල්වැවේ ඛේමානන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ ආචාර්යත්වයෙන් පැවිදි දිවියට පත් වූ ඇකිරියගල සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ උපසම්පදාවේ දී කොවුල්වැවේ ඛේමානන්ද හිමියන් ගේ ආචාර්යත්වයෙන් පමණක් උපසම්පදාව ලබා ඇත. ඇටම්පොල විහාරස්ථානයට අයත් ව තිබූ භූමි භාගයක කොවුල්වැව වර්ධනාරාම විහාරස්ථානය ගොඩනංවා ඇත . මෙම විහාරස්ථානයට ශ්‍රී වර්ධනාරාමය යන නම තැබීම සඳහා මූලික හේතුව වී ඇත්තේ පෙර කී බූවැලිකඩ ශ්‍රී වර්ධනාරාමයේ මාබෝපිටියේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇකිරියගල ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ පැවිදි ආචාර්යවරයන් වහන්සේ නමක්වීම යි.

කොවුල්වැව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය ආරම්භ කළ භූමිය ඊට පෙර විවිධ විෂමාචාරයන් සිදු කරන්නන්ට තෝතැන්නක් ව පැවැතී තිබිණ. එවකට කොවුල්වැව වත්තේ වතු අධිකාරීවරයා ලෙස කටයුතු කළ මොහොට්ටි මහත්මා ගේ සහ කොවුල්වැවේ විදානෙ රාලහාමි යන අය ගේ ප්‍රධාන දායකත්වයෙන් යුක්ත ව ප්‍රදේශවාසී සැදැහැතියන් ගේ ශ්‍රම දායකත්වයෙන් මෙම ස්ථානය සුද්ද පවිත්‍ර කොට කුඩා පොල් අතු සෙවිලි කළ ගොඩනැඟිල්ලක් තනා ඇත . ඒ විහාරස්ථානයේ පළමු ගොඩනැඟිල්ල යි. පසුව කොවුල්වැව ප්‍රදේශවාසීන් ඇටම්පොල විහාරස්ථානයට ගොස් තමන් කළ ගොඩනැඟිල්ලේ වස් විසීමට ස්වාමීන් වහන්සේ නමක් අවශ්‍ය බව පවසා වස් ආරාධනාවක් සිදුකොට තිබේ. එම අවස්ථාවේ දී ඇකිරියගල සරණපාල ලොකු හාමුදුරුවන් වහන්සේ දායකයන් ගේ ආරාධනාව පිළිගෙන මෙහි වැඩම කොට ඇත. උන්වහන්සේ විසින් ශ්‍රී ඛේමානන්ද දහම් පාසල ආරම්භ කොට ප්‍රදේශයේ දුවා දරුවන් ගේ සදාචාර සංවර්ධනය උදෙසා අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කරමින් එම දහම් පාසල ප්‍රදේශයේ දීප්තිමත් දහම් පාසලක් බවට පත් කොට ඇත . ඊට සමකාලීන ව උන්වහන්සේ ගේ අනුශාසකත්වයෙන් විහාරස්ථානයෙහි කුඩා විහාර මන්දිරයක් තැනීම සේ ම, බෝධීන් වහන්සේ නමක් ද රෝපණය කොට ඇත . කොවුල්වැව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානයේ වර්තමාන විහාරාධිපති විනයාචාර්ය මංගල ධර්මකීර්ති ශ්‍රී සරණපාල , ශාස්ත්‍රපති ,රාජකීය පණ්ඩිත, පූනාහැල සද්ධානන්ද පහළ දෙළොස් පත්තුවේ ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වර්ෂ 1952 දී මෙම විහාරස්ථානයේ දී පැවිදි බිමට පත් විය .



විහාරාධිපති පූනාහැල සද්ධානන්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



විහාරාධිකාරී මැදවල සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ

උන්වහන්සේ පැවිදි බිමට පත්වන විට මෙම විහාරස්ථානයේ තත්ත්වය කෙසේ ද යන්න පිළිබඳ බොහෝ කරුණු අපත් සමග ප්‍රකාශ කොට තිබේ .

"අපි පුංචි කාලේ මේක මහා ඉඳි ගස් පිරිච්ච ඉඩමක්. පන්සල දියුණු කරල හදන්න තරම් ලොකු මුදලක් ලොකු හාමුදුරුවන්ට තිබ්බෙත් නෑ, දායකයන්ට තිබ්බෙත් නෑ. අපි කොළඹ ඉඳලා උගන්නල ලැබිච්ච වැටුපෙන් තමා මේ චෛත්‍යය , අලූත් විහාර , සංඝාවාස හැදුවේ "

පූනාහැල සද්ධානන්ද නායක මාහිමියන් වහන්සේ කොළඹ නාලන්ද විද්‍යාලය, කුරුණෑගල මලියදේව විද්‍යාලය වැනි දිවයිනේ සුප්‍රසිද්ධ පාසල් කිහිපයක ම සේවය කොට තමන් වහන්සේ ඉන් උපයා ගත් වැටුපෙන් සහ සැදැහැති දායකයන් ගේ උපකාරයෙන් මෙම විහාරස්ථානයේ සකල විහාරාංග සම්පූර්ණත්වයට පත් කළ බව ආවර්ජනය කරන්නේ හදපිරි සතුටකිනි. ධර්ම ශාලාව, චෛත්‍ය රාජයාණන් වහන්සේ, බුදු මැදුර, දෙමහල් සංඝාවාසය, වාහල්කඩ ඇතුළු අනෙකුත් සියලු විහාරාංගයන් උන්වහන්සේ ගේ මූලිකත්වයෙන් ගොඩනංවා ඇත.

විහාරස්ථානය මඟින් පවත්වන දහම් පාසලේ දූ දරුවන් 100ක් පමණ දහම් අධ්‍යාපනයේ යෙදෙන අතර, විහාරස්ථානය කේන්ද්‍ර කොටගෙන සතිපතා විවිධ ආගමික වතාවත් සිදු කරනු ලැබේ. ඒ නිසා ම ප්‍රදේශයේ බොදුනුවන් ගේ අතිශය ප්‍රියමනාප භාවයට පත් වූ විහාරස්ථානයක් ලෙස වර්ධනාරාම විහාරස්ථානය හඳුන්වා දිය හැකි ය. වර්තමාන විහාරාධිකාරී නිට්ටඹුව , දඹදෙණිය සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන් හි පීඨාධිපති , දර්ශනපති , පූජ්‍යපාද මැදවල සරණපාල ස්වාමීන්ද්‍රයන් වහන්සේ නිරන්තරයෙන් ම විහාරස්ථානයේ භෞතික දියුණුව හා දායකයන් ගේ ආධ්‍යාත්මික දියුණුව වෙනුවෙන් වෙහෙසී කටයුතු කරති. එදා නිස්සාර භූමියක් ව පැවති මෙම භූමි භාගය අද සුවහසක් සැදැහැතියන් ගේ දෙලොව වැඩ පිණිස කටයුතු සලසන සාරවත් කෙම් බිමක් සේ විරාජමාන ව පවතී .

කොවුල්වැව ශ්‍රී වර්ධනාරාම විහාරවාසී,
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි උපාධි අපේක්ෂක
රාජකීය පණ්ඩිත

**කරපුටුගල කුසලධම්ම හිමි**

වර්ෂ 2021 ක් වූ ඔක්තෝබර් 06 බදදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.